සීමාසහිත ලංකා නැව් සංස්ථාව

(1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා සහ රජය සතු ව්‍යාපාරික ආයතන රජයේ සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ 1992.06.01 වන දින සිට සමාගමක් බවට පරිවර්තනය කර ඇත)





වාර්ෂික වාර්තාව

2021/2022

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවාහකයා

සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2021/2022

	පිටු අංකය
පටුන	1
දැක්ම හා මෙහෙවර ප්‍රකාශය	2
පිළිගැන්වීමේ ලිපිය	3
අධ්‍යක්ෂ මණ්ඩලය	4-5
කළමණාකරණ කණ්ඩායම	6-7
සභාපතිවරයාගේ සමාලෝචනය	8 -11
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	12 -13
තිරසාරත්ව වාර්තාව	14 -20
විගණන කමිටුවේ වාර්තාව	21 -24
තුනී ප්‍රණාමය කාර්ය මණ්ඩලයට ස්තුතිය	25
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව	26 -44
වීස්තීර්ණ ආදායම් ප්‍රකාශය	45
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	46
කොටස් ආයෝජන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	47
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	48
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	49-84
පරිපාලන වියදම්	85-86

සී.ස. ලංකා නැව් සංස්ථාව
වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2021/2022

දැක්ම හා මෙහෙවර ප්‍රකාශය :

දැක්ම

දේශය වෙනුවෙන් බලාපොරොත්තු නැංවිය හැකි ඵලදායි ජාතික නාවික ඇණියක් ස්ථාපනය කිරීම සහ නාවික සේවා සම්පාදන පහසුකම් සැලසීම.

මෙහෙවර

ජාතික නාවික ප්‍රවාහකයා වශයෙන් ශ්‍රී ලංකාවේ ආනයන, අපනයන සහ දේශීය වශයෙන් මුහුදුබඩ වෙළඳාම් ආශ්‍රිත භාණ්ඩ හා සේවා සම්පාදන අවශ්‍යතා සැලසීම.

සී.ස. ලංකා නැව් සංස්ථාව වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2021/2022

<u>පිළිගැන්වීමේ ලිපිය</u>

ගරු වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,
වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

අමාත්‍යතුමනි,

රාජ්‍ය සංස්ථා සහ රජය සතු සමාගම් රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා වූ 1987 අංක 23 දරන සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව 2021.04.01 දින සිට 2022.03.31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සමාගමේ ක්‍රියාකාරකම් පිළිබඳ සම්පාදිත වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය මෙයින් ඉදිරිපත් කරමි.

මම
විශ්වාසි,

ඩබ්ලිව්.එස්. වීරමන්
සභාපති

සී.ස. ලංකා නැව් සංස්ථාව
අංක 27, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල
ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත
කොළඹ 01.
28.03.2023

සී/ස ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2021/2022

<u>අධ්‍යක්ෂක මණ්ඩලය</u>

<u>2021.04.01 සිට 2022.03.31 දක්වා</u>

ඩබ්ලිව්. එස්. විරමන් මහතා

සභාපති

2019/12/20 සිට අද දක්වා

දිමුත් ජාගොඩආරච්චි මහතා

විධායක අධ්‍යක්ෂ

2020.10.08 සිට අද දක්වා

ඩී. එච්. එස්. පුල්ලපෙරුම මහත්මිය

අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත

2020.01.11 සිට 2022.03.02 දක්වා

ෂෙහාරා ජයවර්ධන මහත්මිය

අධ්‍යක්ෂ

2020.10.07 සිට අද දක්වා

භාතිය උඩුමලගල මහතා

අධ්‍යක්ෂ

2020.10.08 සිට අද දක්වා

රංග ගුණවර්ධන මහතා

අධ්‍යක්ෂ

2020.10.07 සිට අද දක්වා

මෙවන් පීරිස් මහතා

අධ්‍යක්ෂ

2020.10.08 සිට අද දක්වා

සමාගම් ලේකම්

මල්කාන්ති ගුණසේකර මහත්මිය

ACCS'හි ආශ්‍රිත සාමාජික

කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී

කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2020.09.28 සිට 2022.02.18 දක්වා

වයි. ටී. ප්‍රබෝධිත මහතා

විද්‍යාවේදී (B.Sc)

නීතිඥ, 'BASL' හි යාවජීව සාමාජික

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් (2022.02.18 සිට)

මල්කාන්ති ගුණසේකර මහත්මිය

'ACCS'හි ආශ්‍රිත සාමාජික

කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී -

කොළඹ විශ්වවිද්‍යාලය

බැංකුකරුවන්

මහජන බැංකුවේ ආයතනික බැංකු අංශය

ලංකා බැංකුව

කොමර්ෂල් බැංකුව පී.එල්.සී

විගණකවරුන්

විගණකාධිපති, ජාතික විගණක කාර්යාලය අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10 (දහයක්) ක් පවත්වන ලදී

ලියාපදිංචි කාර්යාලය

සී/ස ලංකා නැව් සංස්ථාව

අංක 27, MICH ගොඩනැගිල්ල,

ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත,

කොළඹ 01, ශ්‍රී ලංකාව.

ටෙලි. +94 1123287723

ෆැක්ස් +94 112449486

විද්‍යුත් තැපෑල:- cscl@cscl.lk

වෙබ් අඩවිය :- www.cscl.lk

සී/ස ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2021/2022

<u>කළමනාකරණ කණ්ඩායම</u>

සාමාන්‍යාධිකාරිනි (2021.07.31 දක්වා)

සී. ජයසිංහ මහත්මිය

එෆ්.අයි.සී.එස්, එම්.අයි.එල්.ටී - එක්සත් රාජධානිය

විද්‍යාපති - (ජාත්‍යන්තර නාවික කටයුතු) - එක්සත් රාජධානිය

නාවික කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරී (ඔස්ලෝ)

නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (වෙළඳ) සහ වැඩබලන සාමාන්‍යාධිකාරී (2021.08.01 සිට අද දක්වා)

වයි. එස්. වෙත්තසිංහ මහත්මිය

විද්‍යාවේදී (සාමාන්‍ය)

නාවික විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ (මැල්මෝ - ස්වීඩන්)

එම්.අයි.එල්.ටී - එක්සත් රාජධානිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නෛතික හා රක්ෂණ / මානව සම්පත්)

එස්. ඒ. එස්. කේ. ජයසේකර මහත්මිය

විද්‍යාවේදී, නීතිවේදී (ශ්‍රී ලංකා)

ජාත්‍යන්තර වෙළඳාම හා වාණිජ නීතිය පිළිබඳව විද්‍යාපති උපාධිය

ලන්ඩන් (බටහිර) විශ්වවිද්‍යාලය

සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

ජී.එම්. විකුම් ප්‍රදීප මහතා

වාණිජ විද්‍යාවේදී (විශේෂ) ගෞරව, එල්.අයි.සී.ඒ

නාවික විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ (මැල්මෝ - ස්වීඩන්)

එතෙර සඳහා පත්කළ නිලධාරී (2021.07.31 දක්වා)

කැප්ටන් නිෂ් විජයකුලතිලක මහතා

Master Mariner, MBA (Col), CMILT, AFNI (Uk)

IMO Maritime Ambassador, UNA සාමාජික

එතෙර සඳහා පත්කළ නිලධාරී (2021.10.21 දක්වා)

කැප්ටන් එච්. එම්. ඒ. යූ. බී. හේරත් මහතා

Certificate of Competency as Master (Class I - Unlimited)

MICS - Membership of the institute of Chartered Ship brokers (UK) 2007

Advanced Diploma in Maritime Science, CINEC Campus

DPA Course - DNV Maritime Academy India 2021

තාක්ෂණික අධිකාරී (2021.03.01 සිට)

චාරක චික්‍රමනායක මහතා

වරලත් ඉංජිනේරු - එ. රාජධානිය

වරලත් නාවික ඉංජිනේරු - එ. රාජධානිය
ආයතනික ඉංජිනේරු ශ්‍රී ලංකා
ප්‍රධාන ඉංජිනේරු නිලධාරී වශයෙන් ප්‍රවීණතා සහතිකය (COC Class 1 Unlimited))
නාවික ඉංජිනේරු විද්‍යා සහ තාක්ෂණික (IMAREST) ප්‍රවීණතා සහතිකය
එක්සත් රාජධානියේ AFNI හි අධි සාමාජික සහ AMRINA හි ආශ්‍රිත සාමාජික
ආයතනික ඉංජිනේරු ආයතනයේ (SL MIIESL) සාමාජික

අභ්‍යන්තර විගණක
ඩයි. පොන්නම්පෙරුම මහතා
LICA, FMAAT
නාවික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (OSLO)

සහකාර සාමාන්‍යාධිකාරී (නැව් කුලියට දීම් සහ එජන්සි සේවා)
අයි. දන්තනාරායන මහතා
විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂ) ගෞරව - නාවික කටයුතු පිළිබඳ විද්‍යාපති (මැල්මෝ - ස්වීඩන්)
එම්.අයි.එල්.ටී. එක්සත් රාජධානිය - එල්.අයි.සී.ඒ

සහකාර සාමාන්‍යාධිකාරී (ලේඛණකරණය)
කේ.එල්.එම්. මධුරාජා මහතා
වාණිජ විද්‍යාවේදී (විශේෂ) ගෞරව උපාධිය
නාවික විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ (මැල්මෝ - ස්වීඩන්)

සහකාර සාමාන්‍යාධිකාරී (නැව්, භාණ්ඩ හා සේවා සම්පාදන, NVOCC)
එන්.පී. කල්පගේ මහතා
ශාස්ත්‍රවේදී (විශේෂ)
නාවික විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ (මැල්මෝ - ස්වීඩන්)

වැඩබලන කළමනාකාරිනී (මානව සම්පත්)
එම්. ගුණසේකර මහත්මිය
සමාගම් ලේකම් - ACCS හි ආශ්‍රිත සාමාජික
කම්කරු සබඳතා හා මානව සම්පත් කළමණාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී
කොළඹ විශ්ව විද්‍යාලය

පරිපාලන ප්‍රධානී
එම්.ආර්.එල්.පී.පී. ගුණරත්න මහතා
කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරී - විවෘත විශ්ව විද්‍යාලය
ව්‍යාපාරික තොරතුරු ඩිප්ලෝමාධාරී

සී/ස ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2021/2022

සභාපතිවරයාගේ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ජාතික නාවික ප්‍රවාහකයා වන සී/ස ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විස්තර ඇතුලත් කෙරෙමින් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

2021/2022 වර්ෂය වූ කලී කොවිඩ් 19 වසංගතයේ අවසාන කාලසීමාවෙන් අනතුරුව එළඹි ප්‍රවනතා සහ වෙනස්කම්වලට මුහුණ දෙමින් කටයුතු කළ තවත් මූල්ය වර්ෂයක් වුවද, එකී දුෂ්කර කාල පරිච්ඡේදය තුලදී ද තම වගකීම් හා බැඳියාවන් ඉටු කරමින් සියලු මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකිරීමට ලංකා නැව් සංස්ථාව සමත් වූ බව ප්‍රීතියෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

<u>වියළි තොග ප්‍රවාහන වෙළඳපොල</u>

M/S Clarkson Research Shipping Intelligence weekly වාර්තාවට අනුව 2021 වර්ෂයේ අවසාන භාගය වන විට වියළි තොග වෙළඳපොල කොරෝනා වසංගතය ආරම්භ වීමෙන් අනතුරුව කොරෝනා වෛරසයට ගොදුරු වීමෙන් උද්ගත වූ තත්ත්වයට වඩා එනම් 2021 වර්ෂයේ මුල් භාගයට වඩා බෙහෙවින් ශක්තිමත් විය.

කෙසේ නමුත් ලංකා නැව් සංස්ථාව විසින් මෙම කාලය තුල තමන් සතු නැව් දෙකෙන්, ඉකුත් මූල්‍ය වර්ෂයට වඩා ඉහළ කුලී ආදායමක් ලබා ගැනීමට සමත් විය.

නාවික යාත්‍රා යෙදවීම.

අප්‍රේල් මාසයේ සිට සැප්තැම්බර් මැද දක්වා වූ නිරිතදිග මෝසම් කාලය තුල ලංකා නැව් සංස්ථාව සතු Ceylon Breeze සහ Ceylon Princess නෞකා දෙක සිංගප්පූරුවේ පිහිටි වාණිජ කළමනාකරණ සමාගමක් යටතේ සාර්ථක ලෙස ජාත්‍යන්තර කුලී වෙළඳපොලෙහි යොදවන ලද අතර 2021/2022 මූල්‍ය වර්ෂය තුල උපරිම ලෙස ප්‍රයෝජනයට යොදාගැනීම තුලින් ඉහළ ආදායමක් වාර්තා කිරීමට හැකි විය. මූල්‍ය වර්ෂයේ තෙවැනි හා සිව්වැනි කාර්තු වලදී Ceylon Breeze නෞකාව දිනකට එ. ජ. ඩොලර් 38,000/- සහ එ. ජා. ඩොලර් 41,700/- පදනම යටතේ 05 වැනි වසරේ වාණිජ නොවන අනිවාර්ය වියළි තටාකාංගන කාලසීමාව තෙක් එනම් 2022/02/19 දින දක්වා කුලියට දෙන ලදී.

රාජ්‍ය අංශයේ ආනයන

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 415 යටතේ රජයේ නාවික භාණ්ඩ ප්‍රවාහනය කිරීම ලංකා නැව් සංස්ථාවට පවරන ලදී. ඒ අනුව බහාලූම්ගත නාවික භාණ්ඩ, වාහන, විසිරි තොග නාවික භාණ්ඩ සහ අධි බරැති නාවික භාණ්ඩ ඉඩ කුලී හා යාත්‍රා ගමන් පදනම් යටතේ සම්මාගම් විසින් ඒ ඒ රටවල් වලට තෙවැනි පාර්ශවයේ නැව් යොදාගෙන ප්‍රවාහනය කරන ලදී.

මූල්‍ය කාර්ය සාධනය

වත්කම් අපවය වීම සැලකිල්ලට නොගත් විට රු. මිලියන 2,377 මෙහෙයුම් ලාභයක් 2021/22 වර්ෂය තුල අත්කර ගැනීමට ලංකා නැව් සංස්ථාවට හැකි විය. රු. මිලියන 177 ක අගයකින් වත්කම් අපවය වීම ගණනය කිරීමෙන් පසුව 2021/22 වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වලින් ලාභය රු. මිලියන 2,200 ක් විය. ඉකුත් වර්ෂය එනම් 2020/21 සමග සසඳා බලන කල මෙහෙයුම් කටයුතු වලින් ලැබූ ලාභයේ වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් 143.46% ක් විය. කෙසේ නමුත් මූල්‍ය වියදම් ගැලපීම් සිදුකිරීමෙන් අනතුරුව (එනම් මහජන බැංකු ණය පොලිය හා එයින් අත්වූ විනිමය පාඩුව) බද්දට පසු පාඩුව 2021/22 දී රු. මිලියන 4,567.786 ක් විය.

2020/21 වර්ෂයේදී බද්දට පසු පාඩුව වූ රු. බිලියන 527.125 සමග සසඳන කල එය දළ වශයෙන් (766.55%) ක වර්ධනයකි. 2021/22 වර්ෂය තුලදී ලංකා නැව් සංස්ථාව විසින් උපයාගන්නා ලද (2020/21) සමස්ත ආදායම රු. මිලියන 7,876 ක් වූ අතර මෙය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී දළ වශයෙන් (154.53% ක) වැඩිවීමකි. සෘජු මෙහෙයුම් වියදම් 2021/22 වර්ෂයේදී රු. මිලියන 5,706 වශයෙන් වාර්තා වූ අතර 2020/21 වර්ෂයේදී එය රු. මිලියන 2042 වශයෙන් වාර්තා වුනි. එනයින් සෘජු මෙහෙයුම් වියදම් 2021/22 වර්ෂයේදී ආසන්න වශයෙන් (179.35%) කින් වර්ධනය වුනි.

ලංකා නැව් සංස්ථාවේ නාවික යාත්‍රා මෙහෙයුම් කටයුතුවලින් ලැබූ ආදායම

ලංසු කැඳවීමේ ක්‍රියාවලියක් හරහා වාණිජ කළමනාකරණ ගිවිසුමක් යටතේ කුලී ගැණුම්කරුවෙකු හරහා 2020/21 වර්ෂය තුළදී සංස්ථාව සතු නැව් දෙක නිරිතදිග මෝසම් සුළං කාලය තුල මෙහෙයුම් කටයුතුවල යෙදවීමෙන් උපයාගත් ආදායමට සාපේක්ෂව 2021/22 වර්ෂයේදී දල වශයෙන් 407% ක ආදායම් වර්ධනයක් ජනිත විය. නාවික යාත්‍රා කුලියට දීමෙන් උපයාගත් ආදායම රු. මිලියන 2,978 කි.

2020/21 වර්ෂයේදී දිනකට ඒ. ජ. ඩොලර් 18,563.89 බැගින්ද 2021/22 වර්ෂයේදී දිනකට ඒ. ජ. ඩොලර් 59,259 බැගින් ද සාමාන්‍ය කුලී අනුප්‍රමාණයක් යටතේ නාවික යාත්‍රා කුලියට දෙන ලදී. අනෙක් අතට ඉකුත් වර්ෂය සමග සසඳා බැලීමේ දී 2021/22 වර්ෂයේදී සංස්ථාව සතු නාවික යාත්‍රා දෙකෙන් ගල් අඟුරු ප්‍රවාහනය කිරීම තුලින් ලැබූ ආදායම් (69%) කින් වැඩි විය. ලංකා විදුලිබල මණ්ඩලයට/ලංකා ගාල් අඟුරු සමාගමට අවශ්‍ය වන වාර්ෂික ගල් අඟුරු මේ. ටොන් මිලියන 2,229 න් මිලියන 0.552 ක් ම ප්‍රවාහනය කරන ලද්දේ සමාගම සතු නාවික යාත්‍රා දෙකෙන් වන අතර එයින් 2021/22 වර්ෂයේදී උපයා ගත් ආදායම රු. මිලියන 439.788 ක් විය. තුන්වැනි පාර්ශවයේ යාත්‍රා යොදාගෙන ගල් අඟුරු මෙහෙයුම් කටයුතු කිරීම තුලින් ලැබූ ඇමතුම් කොමිස් මුදල් වලින් හා සහ (Address Commission) සහ ගොඩබෑම් කටයුතුවලින් 2021/22 කාලය තුල ලැබූ ආදායම (17.58%) කින් පහත වැටී තිබුනි. සමාගමේ සමස්ත ආදායම ගැන සලකා බලන කල නාවික යාත්‍රා මෙහෙයුම් කටයුතු වල යෙදවීමෙන් 2021/22 වර්ෂය තුල සමාගම සතු යාත්‍රාවලින් 43.39% ක ආදායමක් වාර්තා විය.

නෞකාමය නොවන පොදු ප්‍රවාහන (NVOCC) සේවාවන් තුලින් ලැබූ ආදායම

ඉකුත් මූල්‍ය වර්ෂය සමග සසඳා බලන විට නෞකාමය නොවන පොදු ප්‍රවාහන සේවාවන් තුලින් නාවික භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ කටයුතු හරහා ලැබූ ආදායම රු. මිලියන 597.83 සිට රු. මිලියන 1,802 දක්වා වැඩි වුනි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙය 201.44% ක වර්ධනයකි. විශේෂයෙන්ම 2020/21 වර්ෂය තුල පැවති කොරෝනා වසංගතය හමුවේ ඇතැම් වරායන් වසාදැමීම, වරාය සේවකයින් සංඛ්‍යාව අඩුවීම තුලින් කාර්යක්ෂමතාව අඩුවීමත් ඒ තුලින් ඇතැම් වරායන් හි තදබදය ඇතිවීම, බහාලුම් හිඟය ගෙන්ගෙට (door to door) පහසුකම් සැලසීම වෙනුවෙන් දේශීය ප්‍රවාහන ක්‍රම සහ විධි නොමැතිවීම යනාදී කරුණු නිසා මෙහෙයුම් කටයුතු ආදායම පහළ වැටුනි.

<u>ව්‍යවහාර මුදලේ අගය පහත වැටීම</u>.

එ. ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම. සමාගමට ඉතා අහිතකර ලෙස බලපෑවේය. 2021/22 වර්ෂයේදී විනිමය අනුප්‍රමාණය දල වශයෙන් 48% කින් වැඩිවිය. එහෙත් 2015/2016 වර්ෂයේදී මහජන බැංකුවෙන් නැව් තැනීම සඳහා ලබාගත් ණයට (Vessel Loan) සාපේක්ෂව විනිමය අනුප්‍රමාණය 104% කින් වැඩිවී තිබුනි.

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රකාරව අනිවාර්ය ප්‍රතිපාදන ලෙස සඳහන් කළ යුතු වූ, රු. මිලියන 6,081.3 ක් දක්වා විනිමය පාඩුව වැඩිවීමට එය හේතුවිය. කෙසේනමුත් ඊට අදාළ ණය පොලී වාරිකය හා ප්‍රාග්ධන සංරචකය වන රු. මිලියන 1,941.39 සම්පූර්ණයෙන්ම සමාගම විසින් 2021/22 වර්ෂයේදී ගෙවාදමන ලදී. කැපී පෙනෙන ලෙස ඇතිවූ විනිමය පාඩුව සහ ණය වාරික පොලිය ගෙවීමට සිදුවීම හේතුකොටගෙන 2021/22 වසරේ වාර්ෂික පාඩුව රු. මිලියන 5,765 ක් වශයෙන් වාර්තා විය. 2020/21 වර්ෂය සමග සසඳා බලන කල පාඩුවේ ප්‍රතිශතය 608.87% කින් වැඩිවී තිබුණි.

<u>සේවක සේවිකාවන්</u>

2021/22 වර්ෂය සම්බන්ධයෙන් ගත් කල 2022.03.31 දිනට සමාගමේ සේවක සංඛ්‍යාව 119 ක් වූ අතර 2021/22 වර්ෂයේදී වැටුප් හා වේතන වශයෙන් ගෙවන ලද මුදල රු. මිලියන 140.61 ක් වූ අතර පරිපාලන වියදම් වශයෙන් රු. මිලියන 263.99 ක් සමාගම විසින් දරන ලදී. 2020/21 වර්ෂය සමග සසඳන කල දල වශයෙන් 22.27% වියදම් අඩුවීමක් එයින් පිළිබිඹු විය. නාවික ක්ෂේත්‍රයේ ව්‍යත්තිමය හා තාක්ෂණික ප්‍රවණතාවන්ට අනුව ලංකා නැව් සංස්ථාවේ කාර්ය හා කටයුතු ඉටුකරනු වස් මැනවින් පුහුණුවලත් අත්දැකීම් සහිත කාර්ය මණ්ඩලයක් ලංකා නැව් සංස්ථාවට අවශ්‍ය බව හඳුනාගෙන තිබේ.

එබැවින් වාර්ෂිකව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා ලංකා නැව් සංස්ථාව රු.මිලියන 2 ක් වෙන් කොට ඇත. කාර්ය මණ්ඩල සාමාජිකයින් 11 දෙනෙක්, නාවික හා මූල්‍ය වැඩසටහන් හරහා පුහුණු කිරීම සඳහා 2021/22 දී රු. 175,433 ක් වැය කොට ඇත.

සී/ස ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2021/22

සමාගමේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ විගණිත ගිණුම් සහිත වාර්තාව අති විශේෂ මහා සභා රැස්වීමේදී සභාගත කිරීම පිණිස සී/ස ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කර සිටී.

වර්ෂයේ සමාලෝචනය

සභාපතිගේ සමාලෝචනය යටතේ විස්තර කෙරෙන්නේ ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුල සහ මෙම වාර්තාවේ දැනට මුහුණදීමට තිබෙන ඉදිරි අභියෝගයන්ය. මෙම වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන තුලින් පිලිබිඹු වන්නේ සමාගමේ කටයුතුවල තත්ත්වයයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්/ප්‍රධාන ව්‍යාපාරික කටයුතු

ශ්‍රී ලංකා ධජය යටතේ ක්‍රියාත්මක ජාතික නාවික ප්‍රවාහකයා වන්නේ සී/ස ලංකා නැව් සංස්ථාවයි. සමාගමේ ප්‍රධාන කටයුතු වන්නේ නැව් බඩු මුහුදු මගින් ප්‍රවාහනය කිරීම ඒවා ඒ ඒ ස්ථාන දක්වා බෙදාහැරීම, ප්‍රවාහනය සඳහා නැව් බඩු රැස්කිරීම, ශ්‍රී ලාංකික [illegible] හා පෞද්ගලික බඩු බාහිරාදිය එක් එක් රටවල් කරා ගෙනයාම, නියෝජිත ආයතනයක් ලෙස රේගු [illegible], [illegible] ආයතන සේවා, නැව් හිමිකාරුවන්, කළමනාකාරුවන් හා මෙහෙයුම්කරුවන්, නැව් කුලියට දෙන තැනැත්තන් සමග කටයුතු කිරීම වේ. තවද ලංකා නැව් සංස්ථාව සියලු ආකාරයේ බහාලුම්ගත ද්‍රව්‍ය, විසිරි තොග, ගල් අඟුරු තොග, වාහන, ව්‍යාපෘති සඳහා වූ නැව් බඩු, අධි බරැති භාණ්ඩ, වැනි සියලු ආකාරයේ නාවික භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ නිරත වේ.

මූල්‍ය ප්‍රකාශ

2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ නියමයන් ප්‍රකාරව මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කරනු ලැබ ඇත.

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශයන්හි විගණකවරුන්ගේ වාර්තාව ඇතුළත් වේ.

ගිණුම් ප්‍රතිපත්ති හා පැහැදිලි කිරීම් සටහන්

සමාලෝචනයට අදාළ මූල්‍ය වර්ෂය තුලදී සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම් නොවීය. මුල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමෙදී භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීම් සටහන් අතුලත්ව ඇත.

මූල්‍ය ප්‍රතිඵල/ලාභ සහ විසර්ජන

මෙම වාර්තාවේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇත.

දේපොල, පිරියත හා උපකරණ

සමාලෝචනයට අදාළ වර්ෂය තුලදී සමාගම රු. මිලියන 44.31 ක් දේපොළ පිරියත හා උපකරණ යන විෂයන්හි ආයෝජනය කොට ඇත. මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් අංක 10 මගින් අදාළ වර්ෂය තුලදී දේපොල, පිරියත හා උපකරණ විෂයන්හි ආයෝජන සංචලනය දක්වා ඇත.

ආයෝජන

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් අංක 13, 14, 15 සහ 16 මගින් 2022 මාර්තු 31 දිනට සමාගම සතු ආයෝජන පිළිබඳ විස්තර දැක්වේ.

ලාභාංශ

2022 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා ලාභාංශ ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ නොකරයි.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන් ප්‍රකාරව 2022 මාර්තු 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 50,000,000.00 ක් වේ. මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් අංක 23 හි විස්තර දැක්වේ.

ක්‍රියාත්මක සමාගමක් බව

සමාගමේ ව්‍යාපාරික සැලැස්ම අධ්‍යක්ෂවරුන් විසින් සමාලෝචනය කරනු ලැබ තිබෙන අතර ක්‍රියාත්මක සමාගමක් වශයෙන් ඉදිරියේදී තවදුරටත් පැවතීම සඳහා ප්‍රමාණවත් සම්පත් ඊට ඇති බවට ඔවුන් සෑහීමකට පත්ව සිටිති. එබැවින් මූලශ ප්‍රකාශ එම පදනම මත පිළියෙල කරන ලදී.

සී/ස ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2021/2022

තිරසාරත්ව වාර්තාව

ලංකා නැව් සංස්ථාව ''ඉදිරි අනාගතය සඳහා තිරසාරත්වය පවත්වා ගැනීමේ අවශ්‍යතාව'' යන හිසින් වූ තිරසාරත්ව වාර්තාව 2021/22 වර්ෂය සඳහා දෙවැනි වරටත් එලි දක්වා ඇත. තිරසාර අයුරින් ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා නැව් සංස්ථාවේ කැපවීම එයින් හුවාදක්වා ඇත. ඉස්මතු වෙමින් පවතින ප්‍රශ්නගත කරුණු IMO මහලේකම් කාර්යාලයේ විශ්ලේෂණය කිරීම හා ඒවා සඳහා විසඳුම් සෙවීම මෙන්ම තිරසාර සංවර්ධනය (IMO හි තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා වූ ක්‍රමෝපාය) පිළිබඳ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේදී සාමාජික රාජ්‍යයන්ට තවදුරටත් සහාය දීම. එක්සත් ජාතීන්ගේ සංවිධානය සුවිශේෂී නියෝජිතායතනයක් වශයෙන් ආරක්ෂාකාරී, පිරිසිදු හා කාර්යක්ෂම නාවික ප්‍රවාහනය සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය සාක්ෂාත් කරගැනීම උදෙසා සාමාජික රාජ්‍යයන්ට සහාය සැලසීම පිණිස වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට නිබේ. ජාත්‍යන්තර නාවික සංවිධානය (IMO) 2030 න්‍යාය පත්‍රය වෙතුවෙන් සක්‍රීයව කටයුතු කරන අතර තිරසර සංවර්ධනය ළඟාකර ගැනීම උදෙසා විශේෂිත ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් හරහා ජාත්‍යන්තර නාවික කර්මාන්තයට ව්‍යවස්ථාපිත ක්‍රියා රාමුවක් සම්පාදනය කිරීම සඳහා දායකත්වය සපයමින් සිටී.

සමස්ථයක් වශයෙන් ජාත්‍යන්තර නාවික සංවිධානය විසින් 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය සලසන අතර ජාත්‍යන්තර නාවික සංවිධානයේ තිරසාර සංවර්ධන ක්‍රමෝපායන් තුල බොහෝ වැදගත් කටයුතු වන්නේ සාගර ජීවීන් SDG 14 (life below water), SDG 13 (climate change), SDG 9 (industry, innovation and infrastructure) SDG5 (Gender equality), next to the over-arching SDG17 (partnership and resource Mobilization)

2019 පාස්කු ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය විදේශ ණය සම්බන්ධයෙන් ඇතිවී තිබෙන ආර්ථික අර්බුදය ආදී පසුබැසීම් හමුවේ වුවද 2030 න්‍යාය පත්‍රය අනුව ඉටුකළ යුතු බැඳියාවන් ජාතික හා උප-ජාතික (sub-national) මට්ටමින් ප්‍රතිපත්තිමය පියවර නොකඩවා ගනු ලබමින් තිබේ.

මෙකී කරුණු අතර වැදගත් කරුණු වන්නේ තිරසාර සංවර්ධන කවුන්සිලයක් පිහිටුවීම තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් 2017 දී පැවති දර්ශක 46, 2021 වන විට 104 දක්වා වැඩිකිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා වූ නිර්මාණාත්මක මූල්‍ය සම්පාදන සංචලනය කිරීම වේ. ඉහත දක්වා ඇති අවශ්‍යතාවන් සපුරාලීම පිණිස, ජාත්‍යන්තර නාවික සංවිධානයේ (IMO) සහ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) ශක්තිමත් තාක්ෂණික හා ආයතනික පසුබිමක් සහිතව ආසියානු කලාපයේ ශක්තිමත් නාවික තරගකරුවකු වශයෙන් ලංකා නැව් සංස්ථාව දැනටමත් ක්‍රමසම්පාදනය කරනු ලැබ තිබේ.

2017.10.03 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක, තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය අනුව සමාලෝචිත වර්ෂය පිළිබඳ එබී බැලීමක් මෙම වාර්තාව තුලින් ඉදිරිපත් කෙරෙන අතර උදාහරණයක් වශයෙන් ආර්ථික පාරිසරික හා සාමාජීය කාර්ය සාධනය පිළිබඳව සැලකිල්ල යොමුකොට ඇත.

<u>පාරිසරික තිරසාරභාවය</u>

ලංකා නාවික සංස්ථාව සතු සිලෝන් බ්‍රිස් සහ සිලෝන් ප්‍රින්සස් නම් වූ නෞකා දෙක ජාත්‍යන්තර නාවික සංවිධානයේ අනුග්‍රහය යටතේ නාවික පරිපාලන ආයතන විසින් ගෝලීය වශයෙන් අනුමත කරනු ලැබ ඇති හා අදාළ සිය`එ විමෝචන නීතිරීති හා රෙගුලාසිවලට අනුව සැලසුම් කරනු ලැබීමෙන් පසුව ජාත්‍යන්තර නාවික සංවිධානයේ MAPOL සම්මුතියට වූ VI ඇමුණුම ප්‍රකාරව ජාත්‍යන්තර නාවික ගමන්බිමන් වලදී නාවික යාත්‍රාවලින් වන විමෝචනයන් (emissions) පාලනය කෙරේ. එකී රෙගුලාසි වලින් හරිතාගාර වායු (GHC) විමෝචනයන් බලශක්ති කාර්යක්ෂමතාව සහ වායු දූෂණය යනාදී කරුණු ආවරණය වේ.

විශේෂිත නාවික යාත්‍රා වර්ග සඳහා වූ EEDI අදියර 3 ට අදාළ නියමතාවන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අදාළ MARPOI ඇමුණුම VI සඳහා වූ සංශෝධන, වෙසෙසින්ම EEDI සහ SEEMP පිළිබඳ අවධාරණය කෙරෙමින් එත්මන් බලශක්ති ක්‍රියා රාමුව වැඩිදියුණු කිරීමේ කටයුතු MEPC 324 (75) යෝජනා සම්මතයට අනුව 2022 අප්‍රේල් මස සිට බලාත්මක වී තිබේ.

ජාත්‍යන්තර නාවික සංවිධානයට අනුව එකී ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු පහත දක්වා ඇත.

1. 2008 දී හරිතාගාර වායු මට්ටමට වඩා අඩු තරමින් ජාත්‍යන්තර නාවික ගමනාගමන නිසා වසරක් පාසා ඇතිවන හරිතාගාර වායු විමෝචනය, 2050 වන විට 50% කින් අඩු කිරීම සහ නැව් වලින් නිකුත්වන හරිතාගාර වායු විමෝචනය මෙම ශතවර්ෂය තුලදී හැකිතරම් ඉක්මනින් අවසන් කිරීම.
2. මෙකී මූලික හරිතාගාර වායු පිළිබඳ ක්‍රමෝපාය වෙනුවෙන් (ප්‍රවාහන කටයුතු විමෝචනය වන CO_2 අඩු කිරීම සඳහා) ජාත්‍යන්තර නාවික ගමනාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන කාබන් ඝනත්වය අඩුම තරමින් 2030 දී 40% කින් අඩුකිරීම අවශ්‍ය වන අතර 2050 වන විට එය 70% කින් අඩු කිරීමට සැලසුම් කොට ඇත. මෙය 2008 වර්ෂයේදී සිදුවූ පරිදිය.



හරිතාගාර වායු අවම කිරීම සඳහා ජාත්‍යන්තර නාවික සංවිධානයේ ක්‍රමෝපාය

2023 ජනවාරි 01 දින සිට සියලුම නැව් තම තමන්ගේ නාවික යාත්‍රා විසින් සාක්ශාත් කරගත් බලශක්ති කාර්යක්ෂමතා දර්ශන පිළිබඳ ගණනය කිරීම් සිදුකොට වාර්ෂික මෙහෙයුම් තීව්‍රතා දර්ශකය (CH) සහ CII අනුපාතය වාර්තා කිරීම සඳහා දත්ත එකතු කිරීම ආරම්භ කළ යුතුය. සියලු නාවික යාත්‍රා සහ විශාල වෙනස්කම්වලට භාජනය වූ නැව් බලශක්ති කාර්යක්ෂමතා දර්ශක වලින් (EEXI) ආවරණය වේ. එක් එක් නාවික යාත්‍රාව සම්බන්ධයෙන් මෙන්ම සැලකිය යුතු වෙනස්කම් වලට භාජනය වූ එක් එක් නාවික යාත්‍රාව සම්බන්ධයෙන් ඒවා විසින් සාක්ෂාත් කරගත් EEXI දර්ශක ගණනය කරනු ලැබේ. (MARPOL Annex VI) රෙගුලාසි අංක 23 අනුව සාක්ෂාත් කරගත් EEXI සී/ස ලංකා නැව් සංස්ථාවේ තාක්ෂණික දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර නාවික සංවිධානයේ එකී අවම කිරීම් ක්‍රමෝපාය (reduction strategies) ශ්‍රී ලංකා රජයට අයත් තොග වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය නෞකා (Ultramax bulk carriers) අනුව සියලු පූර්වෝපායයන් යොදා ඇත. ප්‍රධාන එන්ජිම නිෂ්පාදනය කරනු ලැබ ඇත්තේ MAN ENERGY SOLUTION විසිනි.

එක් එක් යාත්‍රාව EEXI රෙගුලාසිවලට යටත් වන අතර ඒවායේ අගය වෙන වෙනම ගණනය කළ යුතු වේ. MAN PRIMARY SERVICE සමග මෙන්ම ලංකා නැව් සංස්ථාව සමගද සම්බන්ධීකරණය වීම හරහා ප්‍රමිතින් ගැලපෙනු වස් ප්‍රතිඵල මගින් අවශ්‍ය අයුරින් බලශක්තිය සීමා කිරීම් සලසයි.

ප්‍රධාන ප්‍රතිලාභ

- AT 2000/AT 3000 දුරස්ථ පාලක ක්‍රම පද්ධති පහසුවෙන් ස්ථාපනය කිරීමට හැකිවීම.
- සක්‍රීය/පධාන මෙහෙයුම් චේදිකාවේ සිට බලශක්තිය සෘජුවම පාලනය කළ හැකිවීම.
- අභිබවා අන්තර්ගහණය කිරීම
- ප්‍රශස්ථ කාර්ය සාධනය සඳහා උපරිමකරණය (සංයෝජන වක්‍ර සමාලෝචනය, උපරිමකරණය හා ක්‍රියාත්මක කිරීම)
- ප්‍රේරක ආකෘතිය සම්බන්ධයෙන් අවම ක්ෂයවීම් සහිත පද්ධති මට්ටම නිසා ස්ථාවර කාර්යක්ෂම ප්‍රේරක වීම සහ හැකිතරම් අවම ඉන්ධන පරිභෝජනය

ඉහත සඳහන් කරුණුවලට අමතර වශයෙන් අපගේ නෞකාවල එන්ජින් සඳහා (ප්‍රධාන ප්‍රේරණය සඳහා අතුරු ප්‍රේරක සඳහා) ඉතා අඩු මට්ටමක ගෙන්දගම් සහිත ඉන්ධන Sulphur Regulations ගෙන්දගම් සංයුතිය පිළිබඳ රෙගුලාසි අනුව 2020 ජනවාරි මස සිට භාවිතා කරන ලදී.

<u>සමාජ නිරසාර භාවය</u>

අපගේ එදිනෙදා ජීවිතය ගැන සිතාබලන කල ඇත්ත වශයෙන්ම අපගේ බොහෝ කාරණා වලදී නැවියන් මත විශ්වාසය තබමු. ගෝලීය නැව් ඇණිය තුල ලක්ෂ දහයකට වැඩි නැවියන් සංඛ්‍යාවක් සේවයේ නිරතව සිටින අතර අත්‍යවශ්‍ය භාණ්ඩ මෙන්ම සුඛෝපභෝගී භාණ්ඩ බිලියන සංඛ්‍යාත ප්‍රජාවට සපයා දෙති. නාවික කර්මාන්තය ලොවට නැතිවම බැරි එකක් නමුදු නැවියන් නොමැති තැන නාවික කර්මාන්තයක් ද නොමැත. එබැවින් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල වලින් එක් වරකට කැඩෙට් නිලධාරීන් 52 ක් බැගින් තෝරාගෙන සමාගම සතු නැව් වල පුහුණුකිරීම් කටයුතුවල යොදවා තිබේ. සාමාන්‍යයෙන් එකී පුහුණුව ලද නැවියන් එ. ජ. ඩොලර්වලින් උපයන ආදායම් තුලින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට මෙන්ම තම තමන්ගේ පවුල්වල සමාජමය තිරසාරත්වය ලගාකර ගැනීමට සමත්ව ඇත.



ජාත්‍යන්තර නාවික සංවිධානය විසින් පිරිමින් පමණක් නොව ස්වකීය සාමාජික රාජ්‍යයන්හි නාවික ආයතනවල කාන්තාවන්ද නාවික පුහුණු කිරීම් කටයුතුවල යෙදවීම මගින් නාවික කර්මාන්තයට අවශ්‍යවන ඉහළ මට්ටමේ හැකියා ශක්තිය ඔවුනට අත්කර ගැනීමට ඉඩ පුස්ථා සලසා දී ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල උසස් මට්ටමේ තාක්ෂණික පුහුණුව ලබාගැනීමට පහසුකම් සැලසීම මගින් ජාත්‍යන්තර නාවික සංවිධානය (IMO) විසින් ස්ත්‍රී පුරුෂ සමානත්වය හා කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා සහාය සලසයි. කාන්තාවන් හඳුනාගනු ලබන ඒ ඒ පරිසරයන් තුල ඔවුන්ට නාවික පරිපාලනය වරාය හා නාවික පුහුණු ආයතනවලදී රැකියා සංවර්ධන අවස්ථා සඳහා තෝරාගනු ලැබේ. දිවයිනේ ප්‍රධාන නාවික පාසැල් සමග සමීප සහයෝගීතාවයෙන් යුක්තව ලංකා නැව් සංස්ථාව විසින් ඉහත සඳහන් ජාත්‍යන්තර නාවික සංවිධානයේ ඉදිරි සැලසුම් ගෝලීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමට උදව් දීම හා සහාය සැලසීම සිදුකරයි. ස්ත්‍රී පුරුෂ සමානත්ව ධර්මතාව අපගේ ආයතනයේ පමණක් නොව අපගේ නාවික යාත්‍රාවන්හිදී පවා අනුගමනය ඒ අනුව 2021 දී කාන්තා නැවියන් සේ පුහුණු කරන ලදී. ඔවුහු මාස 6 ක කාලයක් තුල සාර්ථක ලෙස නැව් තුළ පුහුණුව ලබා තිබේ.

නැවේ කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සේවක අර්ථසාධක/සේවක භාර අරමුදල් (EPF/ETF) ගෙවීම, රක්ෂණාවරණ සඳහා දායකවීම් නැව් තුලදී අවශ්‍ය කෙරෙන වෛද්‍ය හා සෙසු සෞඛ්‍ය පහසුකම් සැපයීම ජාත්‍යන්තර සංවිධානයේ (ILO) රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම යනාදී කාර්ය කටයුතු සම්බන්ධයෙන් ගත් කල ලංකා නැව් සංස්ථාව විසින් නාවික කර්මාන්තයේ ප්‍රමිතීන් අතිශය ප්‍රශස්ථ අයුරින් අනුගමනය කරනු ලැබ තිබේ.

ආරක්ෂාව මූලික මිනිස් අයිතිවාසිකමක් සේ අපි දකින අතර වැඩ කිරීමේදී ඇතිවන අහිතකර තත්ත්වයන් සේවකයින්ගේ ඵලදායීතාව පමණක් නොව කාර්යක්ෂමතාව කෙරෙහි ද හානිදායක වේ. තවද ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සම්බන්ධයෙන් ද පුළුල්ව ගත් කල මුළු මහත් ප්‍රජාවට ද එයින් අහිතකර බලපෑම් එල්ල වේ. ආරක්ෂාව සම්බන්ධයෙන් අපගේ ප්‍රමුඛතාවන්ගෙන් එකක් නම් අපගේ සේවක පිරිසට ලබාදිය යුතු ආරක්ෂාවයි. එබැවින් අපගේ නාවික යාත්‍රාවන් තුල ආරක්ෂාව සැපයීම වෙනුවෙන් ජාත්‍යන්තර නාවික කළමනාකරණ පද්ධතිය සාර්ථක ලෙස අප විසින් ක්‍රියාවේ යොදවනු ලැබ තිබේ. නැවියන්ගේ වෙහෙස, කාන්සාව නිවාලීම සඳහා සන්නිවේදනය ප්‍රධාන වශයෙන් සන්නිවේදනය අවශ්‍ය වන හෙයින් සියලු නැවියන් සඳහා wi-fi පහසුකම් සපයා තිබේ.

<u>ආර්ථික තිරසාරභාවය</u>



මූලාශ්‍රය : IHS, OECD, UN

නාවික වෙළඳාම් කටයුතු අඛණ්ඩව ප්‍රසාරණය වනු ඇත. (ගෝලීය දල දේශීය නිෂ්පාදිතය හා ජනගහනය) ලොව පුරාම වෙළඳාම් කටයුතු කිරීම තුලින් කුලී ආදායම වශයෙන් දිනකට එ. ජ. ඩොලර් 20,000 ක් පමණ අපගේ නාවික යාත්‍රා දෙක උපයයි. මෙකී මෙහෙයුම් කටයුතු ගල් අඟුරු ප්‍රවාහනය කිරීමේ කටයුතු වලින් පසු කාලසීමාව (එනම් සෑම වර්ෂයකම සැප්. මාසයේ සිට මාර්තු මස අවසානය දක්වා) නොකඩවා සිදු කරනු ලැබේ.

2021/2022 වර්ෂයේදී එක් එක් නෞකාවක දෛනික මෙහෙයුම් පිරිවැය එ. ජ. ඩොලර් 4,500.00 ක මට්ටමක පවත්වා ගන්නා ලදී. 2022/2023 වර්ෂයේදී ඇස්තමේන්තුගත එ. ජ. ඩොලර් 5,000 ක පිරිවැයක් පවත්වා ගන්නා ලදී. නැවියන් විසින් උපයන විදේශ ආදායම කෙරෙහි ලංකා නැව් සංස්ථාව විසින් වැඩි අවධානයක් යොමුකරන ලදී.

එබැවින් පුහුණුව ලැබූ කැඩෙට් නිලධාරීන්ගෙන් ඇතැම් සංඛ්‍යාවක් ලංකා නැව් සංස්ථාවට බඳවා ගන්නා ලද අතර සෙසු අය නිලලත් නිලධාරීන් (Ranked Officers) වශයෙන් වෙනත් නැව් සමාගම්වලට බඳවා ගැනීම සඳහා යොමුකරන ලදී. ඔවුන් විසින් තමන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සාමාජීය හා ආර්ථික තත්ත්වයන් නගාලීම සඳහා සපයනු ලබන දායකත්වය වනාහි ලංකා නැව් සංස්ථාව විසින් ක්‍රියාවට නංවා ඇති ''පුහුණුව හා වෙළඳාම'' යන සංකල්පය නිසා ඇති මෙරට ආර්ථිකයේ සෞභාග්‍යය උදාකරලීමේ ප්‍රයත්නය වෙනුවෙන් අත්වූ ප්‍රතිලාභයකි.

MLC සහ Document of compliance (DoC) අනුව විදේශීය නෞකා සඳහා ශ්‍රී ලාංකික නැවියන් නැව් සංස්ථාවේ ව්‍යාපාර සංවර්ධන අංශය විසින් බඳවාගනු ලැබේ. අද වන විට සිපෙට්කෝ ආයතනය සමග සම්බන්ධ වෙමින් Supramax Tanker යාත්‍රාවක් මිලදී ගැනීම හරහා ආදායම් ඉහළ නංවා ගැනීමට ප්‍රයත්න දරන අතර පතල් කැනීමේ කාර්යාංශයට විශේෂඥ දැනුම සපයමින් බණිජ වැලි අපනයනය කිරීමට අපේක්ෂා කරයි.

විගණන කමිටු වාර්තාව

විගණන කමිටුවේ සංයුතිය

සි/ස ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව පත්කරනු ලබන අතර එය සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. විගණන වර්ෂය තුල එම විගණන කමිටුව පහත දැක්වෙන ස්වාධීන හා විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

ඩී. එච්. එස්. පුල්ලපෙරුම මහත්මිය - සභාපති

එස්. ජයවර්ධන මහත්මිය - සාමාජික

බී. ඒ. උඩුමලගල මහතා - සාමාජික

විගණන කමිටුවේ කාර්යභාරය

සමාගමේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් සියළු කරුණු විභාග කිරීමේ බලය විගණන කමිටුවට පැවරී ඇති අතර තම රාජකාරී ඉටුකිරීමේදී කාර්යක්ෂම අයුරින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) ප්‍රකාරව මූල්‍ය වාර්තා පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කිරීම් සිදුකර ඇත්දැයි යන්න පමණක් නොව මූල්‍ය වාර්තාකරණය පිළිබඳව නියමතා 2007 අංක 07 සමාගම් පනත හා සෙසු මූල්‍ය වාර්තාකරණය පිළිබඳ රෙගුලාසිවලට හා නියමතාවන්ට අනුව සපුරා ඇත්දැයි යන්න විගණන කමිටුව පරීක්ෂා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට පෙර විගණක කමිටුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කොට නිර්දේශ කරන ලදී. සමාගම් කටයුතුවල තත්ත්වය සහ ඊට අදාළ කාලසීමාව තුල අත්කරගත් ප්‍රතිඵල තුලින් එය නිවැරදිව පිළිබිඹු වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගනු පිණිස විගණන කමිටුව විසින් සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රියාපරිපාටිවල ප්‍රමාණවත් බව සහ විධිමත්ව හා අඛණ්ඩව ක්‍රියාත්මක වීම පිළිබඳව ද සමාලෝචනය කරන ලදී. අවශ්‍ය විටදී ස්වායීන විගණන සිදුකරන ලදී. සංස්ථාව තුල අභ්‍යන්තර පාලන වාතාවරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අදහස ඇතිව අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කොට කළමනාකාරීත්වය සමග සාකච්ඡා කරනු ලැබේ. තවද විගණන කමිටුව විසින් සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික හා පාලන අවදානම් පිළිබඳව ද තක්සේරුවක් කරන ලදී.

<u>රැස්වීම්</u>

අදාළ වර්ෂය තුලදී විගණන කමිටු රැස්වීම් 03 ක් පවත්වන ලදී. විගණන කමිටු රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්/ සාමාජිකයින් පැමිණීම පහත දක්වා ඇත.

ඩී. එච්. එස්. පුල්ලපෙරුම මහත්මිය	(3/3)
එස්. ජයවර්ධන මහත්මිය	(2/3)
බී. ඒ. උඩුමලගල මහතා	(2/3)
එම්.ඩී.පී. තිලකසිරි මහතා - ආරාධනයෙන්	(3/3)

රැස්වීමකට පැමිණීමට අපහසු නම් ඊට අවසරයක් ඉල්ලීමකට හා න්‍යාය පත්‍රයේ අඩංගු කරුණු පිළිබඳව පුර්වගාමීව කමිටුවේ සභාපති සමඟ සාකච්ඡා කිරීමේ අවස්ථාවක් අධ්‍යක්ෂවරුන්ට ඇත. නොපැමිණි සියළු සාමාජිකයින්, රැස්වීමේ දිනට කලින් ඊට අවසර ඉල්ලා ඇත.

ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු, රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි, සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, සහකාර සාමාන්‍යාධිකාරි හා අංශ ප්‍රධානින්ද විගණන කමිටුවේ ආරාධනය පරිදි රැස්වීම්වලට සහභාගි වූහ. අභ්‍යන්තර විගණක, කමිටුවේ කැඳවුම්කරු වශයෙන් කටයුතු කරයි.

<u>සමාලෝචනය කිරීම්</u>

අදාළ වර්ෂය සම්බන්ධයෙන් විගණන කමිටුව විසින් පහත දැක්වෙන කාරණා සමාලෝචනය කරන ලදී.

1. 2019/20 සහ 2020/21 වර්ෂ සඳහා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

නිර්දේශය :-

නිකුත්කොට ඇති මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කරන ලෙසටත් වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය අවම කරගන්නා ලෙසටත් විගණන කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

2. සහකාර ගණකාධිකාරී මුතුහර ඩයස් මහතාට දීමනා

නිර්දේශය :-

වැ. බ. ගණකාධිකාරී මුතුහර ඩයස් මහතා සඳහා පෙර දාතම් කල වැ. බ. දීමනාව ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ලිපියක් (a Board Paper) ඉදිරිපත් කරන ලෙසට විගණන කමිටුව නිර්දේශ කරන ලදී.

3. සහවත් බව පරීක්ෂා කිරීම.

ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල/විගණන රැස්වීමේදී මෙම කරුණු පිළිබඳව ප්‍රගතිය දන්වන ලෙසට විගණන කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

4. ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයකර ගැනීමට ඇති මුදල්

නිර්දේශය :-

ලංකා ගල්අඟුරු (LCC) සමාගමෙන් අයවිය යුතු මුදල් සඳහා නැවතත් සිහි කැඳවීම් යවන ලෙසත් ගෙවීම් කෙරේදැයි සොයා බලන ලෙසත් විගණන කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

5. තාක්ෂණික අංශය සඳහා පරිගණකමය නාවික කළමනාකරණ සංවිධිතියක්

නිර්දේශය :-

මේ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස පද්ධති පරිපාලකට විගණන කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

6. නොරොච්චෝලේ ගල් අඟුරු මෙහෙයුම් කටයුතු සඳහා බෝට්ටු ලබාගැනීමේ ව්‍යාපෘතිය ඉදිරි රැස්වීමට ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට උපදෙස් නිකුත් කරන ලදී.

7. කාර්යභාරය විගණනය

කාර්යසාධන විගණනයක් සිදුකිරීම අප්‍රධාන කාර්යයක් බව විගණන අධිකාරී විසින් ප්‍රකාශ කරන ලද අතර කොවිඩ් 19 සහ දෙපාර්තමේන්තුවේ එදිනෙදා නියමිත කටයුතු හේතුකොට ගෙන කාර්ය සාධන විගණනය සිදුකිරීම කල්ගතවිය හැකි බව සඳහන් කළේය.

8. හිමිකම් නොපෑ බහාළුම් තැන්පතු

අධ්‍යක්ෂ මණ්ඩලය මේ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කොට ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලැබී ඇති බවත් සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) විසින් දන්වනු ලැබ තිබේ.

9. නැව් කාර්යමණ්ඩලයේ සාමාජිකයින් සඳහා PCR පරීක්ෂණ හා නිරෝධායන පිරිවැය

මෙම ගැටලුව රක්ෂණාවරණයක් මගින් විසඳා ගැනීමට හැකිවන බවත් නාවික වෙළඳපලේ රක්ෂණ සමාගම් විසින් අපගේ අවශ්‍යතාවය පිළිබඳව එමගින් පැහැදිලි කිරීමක් ලබාගත හැකි බවද විගණන අධිකාරී විසින් යෝජනා කරන ලදී.

10. අභ්‍යන්තර පාලන පද්ධතිය

ලංකා නැව් සංස්ථාවේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු යැයි කමිටුව විසින් යෝජනා කරන ලදී.

11. කාර්යාල සහායක රෝහණ මහතාට දීමනාවක් ගෙවීම.

කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2020 පරිදි මොහුට දීමනාවක් ගෙවනු පිණිස වූ ඉල්ලීම් පැවත වතාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස මානව සම්පත් අංශයට විගණන කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

12. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

කාර්යක්ෂමතා කඩඉම් විභාගය හැදින්වීම සඳහා සුදුසු පාර්ශ්වයක් තෝරාගැනීම සඳහා වූ ඉල්ලීමක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

13. වට්ටෝරුගත නොවන භාණ්ඩ ලේඛනයට ඇතුලත් වීම සම්බන්ධව

කමිටුවේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස විගණන කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

14. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය - 2022

වත්කම් තහවුරු කරගැනීමෙන් ඉක්බිතිව, වාර්තාව ඉදිරිපත් කරන ලෙස විගණන කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

15. මූල්‍ය හා පරිපාලන රෙගුලාසි

නීතිරීති, රෙගුලාසි අනුව කටයුතු කිරීමටත් විගණන කමිටුව උපදෙස් දුන් අතර එකී කටයුතු එවා නිසිපරිදි අන්වේෂණය කරන ලෙස ද උපදෙස් දෙන ලදී.

16. ව්‍යවස්ථාපිත ගෙවීම්

ව්‍යවස්ථාපිත ගෙවීම් අවශ්‍යතාවය අනුව කටයුතු කරන ලෙස විගණන කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

17. ඇප සහතික බැඳුම්කර යටතේ මුදල් අයකර ගැනීම.

මෙම කරුණු සවිස්තරාත්මකව හා මානුෂීය පදනමක් මත විගණන කමිටුව විසින් සාකච්චා කරන ලද අතර ඒවා පහත දැක්වේ.

- මියගිය සේවකයාගේ පවුල (family) ඇප සහතික බැඳුම්කරයෙන් නිදහස් කිරීම.
- මියගිය සේවකයා අත්සන් කර තිබූ ඇප සහතික බැඳුම්කරයේ ප්‍රාග්ධන වටිනාකමින් 50% ක් කපා හැරීම.
- එම බැඳුම්කරයේ ඉතිරි 50% හා වටිනාකම ඊට ඇපවූ අයේෂා වික්‍රමරත්න මහත්මියගෙන් නොකඩවා අයකිරීම.
- ගෙවීමට ඉතිරිව ඇති මුදල සාධාරණ වාරිකවලින් ගෙවීමට ඇපකරු වන අයේෂා වික්‍රමරත්න මහත්මියට අවස්ථාවක් දීම.
- ගෙවීමට ඉතිරිව ඇති මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් තෙන්නකෝන් මහතාට ගෙවීම් නොකිරීමට
- තෙන්නකෝන් මහතාට එරෙහිව නීතිමය කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

නිමාව :-

අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සහ සුදුසු කටයුතු පිණිස, විගණන කමිටුවේ වාර්තාවක් සහ යෙයු වාර්තාවක් මෙයින් ඉදිරිපත් කරනු ලැබේ. තවද රැස්වීම්වල වාර්තාවන්හි පිටපත් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබේ .

කමිටුව වෙනුවෙන්
ඩී. එච්. එස්. පුල්ලෙපෙරුම
විගණන කමිටුවේ සභාපති

සී./ස. ලංකා නැව් සංස්ථාව
වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය
2021 /2022

තුති ප්‍රණාමය

වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා, විසින් ලංකා නැව් සංස්ථාවට නොකඩවා පළකරන ලද උපරිම සහයෝගය සහ උපදෙස් වෙනුවෙන් අපගේ ප්‍රණාමය හිමි වේ.

සංස්ථාවේ අභිමතාර්ථයන් මුදුන්පත් කරගැනීමෙහිලා වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන් විසින් දෙන ලද සහයෝගය වෙනුවෙන් වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයට ස්වකීය ස්තුතිය පළ කරයි.

එමෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව සහ විදේශ නියෝජිතයන් විසින් සංස්ථාව වෙත සැමවිට පළ කරන ලද සහයෝගය සහ සුහදශීලී බව වෙනුවෙන්ද සංස්ථාව තම කෘතවේදීතාව පළ කරයි.

සංස්ථාවේ සේවා ගණුදෙනුකරුවන් හා ඔවුන්ගෙන් ලද සහයෝගය වෙනුවෙන් සංස්ථාව ස්තුති පූර්වක ප්‍රණාමය පළකරමි.

කාර්ය මණ්ඩලයට ස්තුතිය

සුහදශීලී සහ සහයෝගශීලී භාවයෙන් යුතුව, සමාලෝචිත වර්ෂය තුළ දී කළමනාකාරීත්වය/ සේවක මහත්ම මහත්මීන් අතර නිරන්තර සම්බන්ධතාවක් පැවතුණි. කළමනාකාරීත්වය සමඟ කටයුතු කිරීමේදී වෘත්තිය සංගම් ඉතා වගකීමෙන් හා ප්‍රතිචාරාත්මකව කටයුතු කළ බව කිවමනාය.

අවසාන වශයෙන් එතෙර මෙතෙර සියලු සේවක මහත්ම මහත්මීන් විසින් විශේෂයෙන්ම නාවික ක්ෂේත්‍රය මුහුණ දෙමින් සිටින දුෂ්කරතා අබියස ආයතනය වෙනුවෙන් සේවය ඉටු කිරීමේදී හෘදයාංගමව දක්වන ලද පක්ෂපාතී බව හා කැපවීම අගය කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAS/B/CSCL/01/22/61 මගේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 24March 2023

Chairman
Ceylon Shipping Corporation Limited

Report of the Auditor General on the Financial Statements and Other Legal and Regulatory Requirements of the Ceylon Shipping Corporation Limited for the year ended 31 March 2022in terms of Section 12 of the National Audit Act, No. 19 of 2018.

---

1. Financial Statements

1.1 Qualified Opinion

The audit of the financial statements of the Ceylon Shipping Corporation Ltd. ("Company") for the year ended 31 March 2022 comprising the statement of financial position as at 31 March 2022 and the statement of comprehensive income, statement of changes in equity and cash flow statement for the year then ended, and notes to the financial statements, including a summary of significant accounting policies, was carried out under my direction in pursuance of provisions in Article 154(1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka read in conjunction with provisions of the National Audit Act No. 19 of 2018. My report to Parliament in pursuance of provisions in Article 154 (6) of the Constitution will be tabled in due course.

In my opinion, except for the effects of the matters described in the basis for Qualified Opinion section of my report, the accompanying financial statements give a true and fair view of the financial position of the Company as at 31 March 2022, and of its financial performance and its cash flows for the year then ended in accordance with Sri Lanka Accounting Standards.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 Basis for Qualified Opinion

(a) As per the financial statements, loss for the year under review was Rs.5,765,379,292 and the cumulative loss as at 31 March 2022 was Rs.9,328,463,864. Further, the net assets of the Company as at 31 March 2022 was a negative value of Rs.7,914,226,190. The loss for the year and the negative balance of net assets of the Company had increased by 608.87 per cent and 287.65 per cent respectively as compared to preceding year. It was observed that these were the clear indication of material uncertainties that indicates the going concern uncertainties of the Company. The main reason for the loss for the year under review was the exchange loss of Rs. 6,081,305,456 which had incurred from converting the USD loan balance to Rupee value as at 31 March 2022 and although the Company had proposed some mitigating measures at the Extraordinary General Meeting (EGM) held on 30 July 2021 to overcome this situation, actions had not been taken to implement the proposed mitigating measures taken at the EGM.

(b) As per Paragraph 51 of the Sri Lanka Accounting Standard 16 (LKAS 16) on Property, Plant and Equipment, the residual value and the useful life of an asset shall be reviewed at least at each financial year end and if expectation differ from previous estimate, the change(s) shall be accounted for as a change in an accounting estimate in accordance with LKAS 8 Accounting Policies, Changes in Accounting Estimate and Errors. Due to failure to review the residual value and useful life for non- current assets of the Company annually, the estimated error of the fully depreciated fixed assets which were further being used had not been adjusted accordingly. The cost of the fully depreciated fixed assets further being used were Rs.51.687 million

(c) As per the Paragraph 7 of the Sri Lanka Accounting Standard 16 (LKAS 16) , the cost of an item of property, plant and equipment shall be recognised as an asset if it is probable that future economic benefits associated with the item will flow to the Company and the cost of the item can be measured reliably. However, contrary to that the equipment purchased by the Company amounted to Rs. 9,467,137 for two vessels had not been considered as fixed assets and the depreciation pertaining to the year under review had not been adjusted in the accounts.

(d) According to Paragraph 23 (a) of the Sri Lanka Accounting Standard 21 (LKAS 21), at the end of each reporting period foreign currency monetary items shall be translated using the closing rate. However, contrary to that, the Company had not translated the foreign debtors amounting to Rs.316,169,677 (USD 1,845,981) at the closing rate. As a result, the foreign debtors had been understated by Rs.222, 561,587.

(e) As per the Paragraph 5.5.15 a (ii) of Sri Lanka Financial Reporting Standards 09 (SLRFS 09) the Company shall always measure the loss allowance at an amount equal to lifetime expected credit losses for trade receivables. However, the Company had applied general provision for amount of Rs.1,288,730,656 of trade debtors, instead of applying an Expected Credit Losses Approach to determine the bad debt provisions.

(f) As per the Paragraph 8 of Sri Lanka Financial Reporting Standards 07 (SLRFS 07) categories of financial assets and financial liabilities, the carrying amounts of each of the following categories should be separately disclosed as specified in SLFRS 9 either in the statement of financial position or in the notes, financial assets measured at fair value through profit or loss, financial liabilities at fair value through profit or loss. However, the financial statements of the Company had not been prepared as required by the Standard.

I conducted my audit in accordance with Sri Lanka Auditing Standards (SLAuSs). My responsibilities, under those standards are further described in the Auditor's responsibilities for the Audit of the Financial Statements section of my report. I believe that the audit evidence I have obtained is sufficient and appropriate to provide a basis for my qualified opinion.

1.3 Other information included in the Company's2021/22 Annual Report.

The other information comprises the information included in the Company's 2021/22 Annual Report but does not include the financial statements and my auditor's report thereon, which is expected to be made available to me after the date of this auditor's report. Management is responsible for the other information.

My opinion on the financial statements does not cover the other information and I do not express any form of assurance conclusion thereon.

In connection with my audit of the financial statements, my responsibility is to read the other information identified above when it becomes available and, in doing so, consider whether the other information is materially inconsistent with the financial statements or my knowledge obtained in the audit or otherwise appears to be materially misstated.

When I read the Company's 2021/22 Annual Report, if I conclude that there are material misstatements therein, I am required to communicate that matter to those charged with governance for correction. If further material uncorrected misstatements are existed those will be included in my report to Parliament in pursuance of provisions in Article 154 (6) of the Constitution that will be tabled in due course.

1.4 Responsibilities of Management and Those Charged with Governance for the Financial Statements

Management is responsible for the preparation of financial statements that give a true and fair view in accordance with Sri Lanka Accounting Standards and for such internal control as management determine is necessary to enable the preparation of financial statements that are free from material misstatement, whether due to fraud or error.

ශ්‍රී ලංකාවේ පිහිටියා වූ ද, 1992 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද්දා වූ ද සී/ස ලංකා නැව් සංස්ථාව වූ කලී ලංකා නැව් සංස්ථාවට (CSC) අනුප්‍රාප්තික ආයතනයක් වන අතර මෙය 1971 අංක 11 දරන ලංකා නැව් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ආයතනයකි. මෙහි ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරික කටයුතු කිරීමේ ප්‍රධාන ස්ථානය කොළඹ 01 ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවතේ, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ අංක 27 දරන ස්ථානයේ පිහිටා තිබේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

සමාලෝචනයට අදාළ වර්ෂය තුළදී සමාගම ප්‍රධාන වශයෙන්ම නාවික ගමනාගමනය, හිමිකාරිත්වය සහ නාවික යාත්‍රා කුලියට දීම වැනි කටයුතු පිළිබඳව කළමනාකරණ සේවා සම්පාදනයෙහි නියැලුණි. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වරූපයේ කැපිපෙනෙන වෙනස්කම් කිසිවක් සිදුනොවුණි.

1.3 සේවකයින් සංඛ්‍යාව

2022 මාර්තු 31 දිනට මුළු සේවක සංඛ්‍යාව 117 ක් විය. (2021 මාර්තු 31 දිනට 122)

1.4 වාර්තා කිරීමේ දිනය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ දිනය මාර්තු 31 දිනෙන් අවසන් වන අතර ආශ්‍රිත සමාගම්වල මූල්‍ය වාර්තාකරණ කාලසීමාව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. සමාගමේ වාර්තාකරණ කාලසීමාවේ අවසන් දිනය හා ආශ්‍රිත සමාගම්වල වාර්තා කිරීමේ අවසන් දිනට කැපිපෙනෙන කිසියම් ගණුදෙනු වේ නම්, සමාගම ඒවා සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් කරයි.

1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා අනුමැතිය

මෙම මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ 2022 දෙසැම්බර් මස 06 වැනි දින නිකුත් කිරීමට බලය දෙන ලදී.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

සමාගමේ සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, කොටස් ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සටහන් යනාදිය වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව හා 2007 අංක 7 දරන සමාගම් පනතේ නියමතාවන්ට අනුව පිළියෙල කරන ලදී.

2.2 ගණනය කිරීමේ පදනම

සාධාරණ මිල අනුව ගණනය කරන ලදුව විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් ගනයෙහිලා සැලකෙන ලැයිස්තුගත ආයෝජන හා ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය අනුව ගණනය කරන ලදී.
මූල්‍ය ප්‍රකාශවලට බලපෑමක් ඇතිවන උද්ධමනකාරී සාධක වෙනුවෙන් ගැලපුම් කිරීම් නොකෙරිණි.

2.3 සංසන්දනාත්මක සංඛ්‍යා

වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට අනුකූල වන අයුරු අවශ්‍ය තැන්හිදී ඉහත වර්ෂයේ සංඛ්‍යා සහ ඡේද නැවත වර්ගීකරණය කරන ලදී.

2.4 කාර්යීය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් භාණ්ඩ විෂයන් මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුළ ව්‍යවහාර වන මුදල් ඒකක භාවිත කිරීමෙනි. ශ්‍රී ලංකා රුපියලේ ආසන්න අගයට වටයනු ලැබේ. සමාගමේ කාර්යීය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් අනුව ආසන්නතම ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කෙරේ.

2.5 ඇස්තමේන්තු හා නීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිති (SLFRS) අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ගිණුම් ප්‍රතිපත්ති මෙන්ම වත්කම්, වගකීම් ආදායම් හා වියදම් පිළිබඳව වාර්තා වී ඇති ප්‍රමාණයන් කෙරෙහි බලපෑමක් ඇති කෙරෙන අයුරින් කළමනාකාරීත්වය විසින් නීන්දු තීරණ හා උපකල්පනයන් සිදු කිරීම අවශ්‍යවේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් වියහැකිය.

ඇස්තමේන්තු හා වැදගත් උපකල්පනයන් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන හා බලපෑමට යටත්විය හැකි ඉදිරි කාලය තුළ හඳුනාගනු ලැබේ.

2.6 වැදගත් අවැදගත් බව හා සමූහනය

සමාන භාණ්ඩ විෂයන්හි එක් එක් ද්‍රව්‍ය පංතිය වෙන වෙනම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත. අසමාන ස්වභාවයෙන් යුක්ත භාණ්ඩ විෂයන් හෝ කාර්ය කටයුතු නොවැදගත් වන්නේ නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.7 පවතින සමාගමක් බව

"පවතින සමාගමක් යන පදනම යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන ලදී. 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමගම විසින් රු. මිලියන 5,765.50 ශුද්ධ පාඩුවක් (2021 මාර්තු 31 දිනට රුපියල් මිලියන 813.32) දරා ඇත. ශේෂ පත්‍රයේ දිනට සමාගමේ ශුද්ධ වත්කම් තුලින් රු.7,914,226,190 (2020 /2021 2,041,613,494.00 ක ඍණාත්මක අගයක් පෙන්නුම් කරයි) ඉහත කී මූල්‍ය ප්‍රතිපල සඳහා පහත දැක්වෙන හේතු දැක්විය හැකිය.

- නාවික යාත්‍රා සඳහා ගෙවමින් තිබෙන අධික පොළී ප්‍රමාණය
- විස්තිර්ණ අදායම් ප්‍රකාශයේ සඳහන්ව ඇති යාත්‍රාවන්හි ක්ෂය ගත වීම්
- ඒ.ජ. ඩොලරය අනුව ලංකා රුපියල අවප්‍රමාණය තුලින් සිදුවූ සුවිශේෂී විනිමය පාඩුව විස්තිර්ණ අදායම් ප්‍රකාශනයේ සඳහන් වීම
- 2016/17 සිට 2021/22 දක්වා බද්දෙන් පසු ශුද්ධ අලාභයක් ඒදු වීම්

කෙසේ වුවද ඉහත සඳහන් සාධක තුලින් ලංකා නැව් සංස්ථාවේ පැවැත්ම පිළිබඳ සැලකියයුතු අවිනිශ්චිතතාවක් විද්‍යාමාන වන නමුදු එය තවදුරටත් පැවතීමේ හැකියාවක් ඇත.

- ලංකා නැව් සංස්ථාව යනු පූර්ණ වශයෙන්ම රජය සතු ව්‍යාපාරික ආයතනයක් වන අතර භාණ්ඩාගාර ඇපකරයක් සහිතව 2034 වර්ෂයේ ජූනි මස 03 වන දින දක්වා පවතින ඇමරිකානු ඩොලර් 71,910,464,32 ක් වූ ප්‍රමාණයේ නැව් ණය මුදල් ප්‍රදානයක් ද ලැබ සිය ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යයි.
- සමාගම විසින් බැංකුවට ගෙවනු ලැබිය යුතු ණය ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් පැහැර හැර නොමැති අතර අදාළ සම්පූර්ණ පොලී ප්‍රමාණය සහ ප්‍රාග්ධන වාරිකය, ඒවා ගෙවීමට නියමිත වන දිනය වන විට බැංකුව වෙත නොකඩවා ලබා දීමට කටයුතු කර ඇත.
- පැරණි යාත්‍රා සේවයෙන් ඉවත් කිරීම සහ නව යාත්‍රා ඉදිකිරීම් අඩුවීම යන කරුණු, සැපයුමේ සහ ඉල්ලුමේ පවත්නා අසමතුලිතතාවය සාමාන්‍යකරණය කරනු ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස, 2021/2022 වර්ෂයේ සිට නැව් කටයුතු වෙළඳපොළෙහි ධනාත්මක හැරවුමක් සංස්ථාව විෂයයෙහි සිදුව ඇත.
- ලංකා නැව් සංස්ථාව විසින් යාත්‍රා පිළිබඳව කොන්දේසි සහිත වාර්තා ලබාගෙන ඇති අතර එහි සඳහන් වන්නේ, "අදාළ යාත්‍රා සාමාන්‍ය වශයෙන් හොඳ තත්වයෙන් සහ මනාව නඩත්තු කරන ලද මට්ටමකින් පැවති අතර ඒවායේ සියලුම උපකරණ කාර්යක්ෂම සහ හොඳින් ක්‍රියා කළ හැකි තත්ත්වයේ තිබිණි. එම යාත්‍රා, සුප්‍රසිද්ධ සහ විශ්වාසදායක නමක් දිනාගත් යුරෝපීය නිෂ්පාදන සහිත එන්ජින්වලින් මෙන්ම අනෙකුත් යන්ත්‍ර සූත්‍රවලින්ද මනාව සමන්විතව පැවතුණි. ඒවායේ සියලු උපකරණ ද, හොඳ ක්‍රියාකාරී තත්වයක තිබුණි. එම නෞකා විෂයයෙහි උපකල්පනය කරනු ලබන තාක්ෂණික ආයු කාලය වන වසර 20 ක් වූ කාල [illegible] යාත්‍රාවලට ළඟා විය හැකි බව නිගමනය කළ හැකි විය." යනුවෙනි. මෙමගින් සනිටුහන් වනුයේ, සංස්ථාව විසින් තාක්ෂණමය කාර්යක්ෂමතාවයෙන් යුත් උසස් ප්‍රමිතියක් සහිතව ස්වකීය යාත්‍රා [illegible] සහ කාර්යක්ෂමතාවයෙන් යුක්තව කළමනාකරණය කරනු ලැබ ඇති බව ය. තවද, මෙම නෞකාවලට තම අපේක්ෂිත ආයු කාලය සැපිරීමෙහිලා ඇති හැකියාව ද ඉන් ගෙන හැර දක්වයි.
- ක්ෂය ගැටලුවක් වෙතොත්, එය ධනාත්මක ආකාරයකින් විසඳා ගනු පිණිස මහා භාණ්ඩාගාරය යටතේ ඇති ශ්‍රී ලංකා මහජන බැංකුව සහ සංස්ථාවේ ප්‍රධාන කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුව යන ආයතන දෙක අතර පවතින ශක්තිමත් සබඳතාව මහෝපකාරී වනු ඇතැයි යන්න අපගේ විශ්වාසයි.

- ලංකා නැව් සංස්ථාව සතු සිලෝන් බ්‍රිස් හා සිලෝන් ප්‍රින්සස් නමැති නෞකා දෙක සම්බන්ධයෙන් ජාත්‍යන්තර නැව් කුලී සැපයුම්කරු ලෙස කටයුතු කිරීමේ කාර්යය සඳහා වසර දෙකක කාලයක් වෙනුවෙන් ලංකා නැව් සංස්ථාව සහ Wallem Shipping Singapore Pte Ltd (Commercial) නම් වූ සමාගම අතර වාණිජ කළමනාකරණ ගිවිසුමකට එළඹ තිබේ. එබැවින්, මෙමගින් ජනනය වන මුදල් ඉපැයුම් ප්‍රවාහය, අදාළ ණය වාරික, ඒවා ගෙවීමට නියමිත වන අවස්ථාවේ දීම, නිසි ලෙස ගෙවා සේවා කරනු පිණිස ඉඩ ප්‍රස්ථාව සලසා දෙනු ඇත.
- මෙහෙයුම් සහ පරිපාලන වියදම් අඛණ්ඩ පදනමක් මත පාලනය කිරීම මගින් යම් ධනාත්මක බලපෑමක් ලංකා නැව් සංස්ථාව වෙත ලභා කර දී තිබේ.
- වෙළඳපොළ ප්‍රවනතා තුළින් උද්ගත වන ඕනෑම නව අවස්ථාවක් ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින්, සංස්ථාව, නැව් කර්මාන්තය ආශ්‍රිතව සිදුවන වර්ධනයන් නොකඩවා සොයා බලමින් ඒ අනුව කටයුතු කරනවා ඇත.

3. කෑදී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති සම්පිණ්ඩනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි හා ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ, සමාගම විසින් පිළියෙල කරන ලදී. මෙකී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් යම් ආකාරයකින් දක්වා නොමැත්තේ නම් මිස, සියලු වර්ෂයන්හි දී මෙම ප්‍රතිපත්ති අනවරතව යොදා ගන්නා ලදී.

3.1 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු / පරිවර්තන

ගනුදෙනුව සිදුවන දිනයේ දී බලපවත්නා විදේශ විනිමය අනුපාතය අනුව විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම සිදු කෙරේ. විදේශ විනිමය අනුව වටිනාකම දැක්වෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ගත්කල මූල්‍ය තත්වය ප්‍රකාශිත දිනයන්හි දී බලපැවැත්වෙන විදේශ විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. එකී පරිවර්තනයන්හි දී උද්ගත වන වෙනස්කම් ලාභ හෝ අලාභ ගිණුමේ දී හඳුනා ගැනේ. ඓතිහාසික පිරිවැය පදනම යටතේ සඳහන් කරන ලද විශේෂ ව්‍යවහාර මුදල් වටිනාකම අනුව වූ මූල්‍ය වත්කම් හා වගකීම්වල වටිනාකම ගණුදෙනුව සිදු වූ දිනයේ බලපැවැත් වූ විදේශ විනිමය අනුපාතය අනුව පරිවර්තනය කරන ලදී.

3.2 ආදායම් බදු වියදම්

වර්ෂය සඳහා වූ බදු වියදම්වලට ඇතුළත් වන්නේ වත්මන් හා විලම්බිත බදු ය. ලාභය හෝ අලාභය තුළ බද්ද හඳුනා ගැනෙන අතර වෙනත් සවිස්තරාත්මක ආදායම් වශයෙන් සෘජුවම හඳුනා ගැනෙන ආදායම් හෝ වියදම් විෂයකට අදාල වන වෙනස්කමක් ඇතුලත් වන්නේ නැත.

(අ) ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු යනුවෙන් හැඳින්වෙන්නේ වර්ෂය සඳහා ගෙවීමට නියමිත බද්දට යටත් ආදායම වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත බද්ද යි. වාර්තා කරන දිනයට බලාත්මක වන බදු අනුප්‍රමාණයන් සහ ඉහත වර්ෂය සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්දට වූ වෙනත් ගැලපීම් කිරීම් මේ සඳහා අදාල කරගනු ලැබේ.

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඉන් ඉක්බිති සංශෝධන ප්‍රකාරව සමාගමේ බදු බැදියාව ගණනය කොට තිබේ.

(ආ) <u>විලම්බිත බද්ද</u>

මූල්‍ය ප්‍රකාශයන් තුළ දැක්වෙන වත්කම්වල ඉදිරියට ගෙනයන වටිනාකම හා ඒවාට අනුරූප බදු පදනම්ව (තාවකාලික වෙනස්කම් වශයෙන් හඳුන්වනු ලබන) වෙනස මත විලම්බිත බද්ද හඳුනා ගැනේ. ඉදිරියේ දී බද්දට යටත් ලාභය වැඩිවෙතැයි අපේක්ෂා කරන සියලු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැදියාවන් හඳුනා ගනු ලැබේ. ඉදිරියේ දී බද්දට යටත් ලාභය අඩුවෙතැයි අපේක්ෂිත සියලු තාවකාලික වෙනස්කම් සහ භාවිතා නොකළ බදු පාඩු හා බදු වාසි වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ. (විලම්බිත බදු වත්කම් මනිනු ලබන්නේ වර්තමාන හෝ ඇස්තමේන්තුගත අනාගත බදු අය කළ හැකි ලාභය මත පදනම්ව, අයකර ගත නොහැකි වඩා වැඩි ප්‍රමාණයකි).

විලම්බිත බද්දේ ඉදිරියට ගෙන යන වටිනාකම එක් එක් වාර්තා කිරීමේ දිනයට සමාලෝචනය කරනු ලබන අතර ඉදිරි බද්දට යටත් ලාභවල ප්‍රවර්තන තක්සේරුව පිළිබිඹු වන සේ ගැලපීම් කරනු ලැබේ. ගැලපීම් කිරීම් කිසිවක් වේ නම් ලාභ හෝ අලාභයන් තුළ ඒවා හඳුනාගනු ලැබේ.

වාර්තා කිරීමේ අවසන් දිනය වන විට බලාත්මක කරුණු ලැබ තිබෙන හෝ සැලකිය යුතු තරමින් බලාත්මකව තිබෙන බදු අනුපාත පදනම් කරගෙන, විලම්බිත බදු වත්කම් පැහැදුම් කරගැනීමට හෝ බදු බැදියාවන් නිරවුල් කිරීමට අපේක්ෂිත කාලය තුළ බදු ආදායමට (බදු පාඩුවට) අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුප්‍රමාණ මත විලම්බිත බද්ද ගණනය කෙරේ.

<u>වත්කම් හා තක්සේරු පදනම</u>

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ පරිවර්තනා වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති වත්කම් වූ කලී සාමාගමේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හඳුනා ගැනීමට අපේක්ෂිත වත්කම් හෝ වාර්තා කිරීමේ දින සිට අවුරුද්දක් තුළ යන දෙකින් වඩාත් අඩු කාල සීමාවක් තුළ හඳුනා ගැනීමට නිබෙන ඒවා ය. ප්‍රවර්තන වත්කම් හැරුණු විට, වත්කම් යනුවෙන් දැක්වෙන්නේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දින සිට අවුරුද්දකට වඩා රඳවා ගැනීමට අපේක්ෂිත ඒවා ය.

3.3 <u>දේපල, පිරියත හා උපකරණ</u>

(අ) හඳුනා ගැනීම හා ගණනය කිරීම

දේපල, පිරියත හා උපකරණ සඳහන් කරනු ලබන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ප්‍රත්‍යාගණන වටිනාකම අනුව ඉදිරියට ගෙනගිය ඉඩම් හැර පිරිවැය අඩුකළ සමුච්චිත ක්ෂය වීම් හා කිසියම් සමුච්චිත හානිකරණ වටිනාකම් අනුව ය. ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන්නේ දේපල ඒවා පවතින ස්ථානයට රැගෙන ඒමේ දී කළමනාකාරිත්වය විසින් ඒවා තමන් අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තත්ත්වයන් යටතේ දැරීමට සිදු වූ යම් පිරිවැයක් වේ නම් ඒවා ද ඇතුළුව මූලිකව දැරූ පිරිවැය යි. තමන් විසින් ම ගොඩනගන ලද වත්කම්වලට ද්‍රව්‍ය සඳහා වැය වූ පිරිවැය සහ සෘජු කම්කරු පිරිවැය ඇතුලත් වේ.

විවිධ ප්‍රයෝජ්‍ය ආයු කාලයක් සහිත ප්‍රධාන අංගවලින් යම් දේපලක්, පිරියත හෝ උපකරණ සමන්විත වේ නම් ඒවා වෙන් වෙන් දේපල, පිරියත හා උපකරණ සේ ගණුන් ගනු ලැබේ.

(ආ) අනුෂාංගික වියදම්

දේපල, පිරියත හා උපකරණයක ඉදිරියට ගෙනයන වටිනාකමට එවැනි භාණ්ඩයක කොටසක් වෙනුවට යමක් ප්‍රතිස්ථාපනය කිරීමේ දී ඊට වැය වෙන පිරිවැය ඇතුළත් කරන්නේ එයින් සමාගමට වර්ධනාත්මක ප්‍රතිලාභයක් අත්වන බව අපේක්ෂා කරන විට දී ය. ප්‍රතිස්ථාපනය කළ කොටසේ ඉදිරියට ගෙනයන වටිනාකම හඳුනා නොගැනේ. අනෙකුත් සියලු අලුත්වැඩියා කිරීම් සහ නඩත්තු සඳහා දැරූ වියදම් ඒවා දරන ලද කාල සීමාවේ ලාභයට හෝ පාඩුවට අයපත් කෙරේ.

(ඇ) <u>ක්ෂය වීම්</u>

ඉඩම් ක්ෂය වීම් ගණනය නොකරනු ලැබේ. ක්ෂය වීම් ලාභයට හෝ පාඩුවට අයපත් කොරෙන්නේ අනෙකුත් දේපල, පිරියත් හා උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජ්‍ය ආයු කාලයක් එකී විෂයන්හි අවශිෂ්ය අගයෙන් අඩුකොට වත්කම්වල පිරිවැයට ඉඩදීම සඳහා ය. මීට සරල මාර්ග ක්‍රමය භාවිතා කෙරේ. දේපලවල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත දැක්වේ.

<u>වත්කම්</u>	<u>වර්ෂ</u>
ගොඩනැගිලි	20
නාවික යාත්‍රා	25
මෝටර් රථ	04
ගෘහ භාණ්ඩ හා සවිකිරීම් හා කාර්යාලීය උපකරණ	10
පරිගණක	05

යාත්‍රා වරින් වර වියළි තටාකගත කිරීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කර ඊලඟ වියලි තටාක කිරීමේ දිනය දක්වා කාලය තුල ක්ෂය කරණු ලැබේ.ක්ෂයවීම් කාලය අවසන් වීමට පෙර සැලකිය යුතු වියළි තටාකගත කිරීමේ පිරිවැයක් දැරීමට සිදුවීමේදී පෙර වියළි තටාකනයේ ඉතිරි වියදම් පසුව වියළි තටකගත කිරීමේ මාසය තුල කපා හරිනු ලැබේ.

වියළි තටකගත කිරීම් කරනුයේ වසර 05 කට වරකි.

කිසියම් භාණ්ඩයක ක්ෂය වීම් ගණනය කිරීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත හැකි වූ විට වන අතර අනතුරුව විකිණීමට ඇති භාණ්ඩයක්සේ වර්ගීකරණය කළ දින සිට සහ එය හඳුනා නොගත් දිනට පෙර නතර වේ.

(ඇ) දේපල, පිරියත හා උපකරණවල ප්‍රයෝජ්‍ය ආයු කාලය

වාර්තා කිරීමේ අවසාන දිනය වන විට කැපී පෙනෙන වෙනසක ඉඟියක් වේ නම් යෝග්‍යය යි සැලකෙන පරිදි වත්කමේ අවශේෂ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂය කිරීමේ ක්‍රම භාවිතමය අයුරින් සමාලෝචනය කොට ගැලපුම්කරනු ලැබේ.

සුදුස්සක් කොට බැහැර කිරීමේ දී විකුණූ භාණ්ඩ විෂයේ ශුද්ධ නියාදන ලැබීම් සහ ඉදිරියට ගෙනයන වටිනාකම ලාභ හෝ පාඩු තුළ හඳුනා ගැනෙන අතර 'වෙනත් අදායම්' හෝ වෙනත් මෙහෙයුම් වියදම් වල ඇතුළත් කෙරේ.

3.4 අස්පෘශ්‍ය වත්කම්

අත්පත්කරගන්නා ලද පරිගණක මෘදුකාංග පාවිච්චියට සරිලන අයුරු විශේෂිත මෘදුකාංග හා ක්‍රමපද්ධති පිහිටුවීම සඳහා දරන ලද පිරිවැය පදනම් කර ගෙන ඒවා ප්‍රග්ධනීකරණය කෙරේ . අත්පත් කර ගත් එවැනි වත්කම් සම්බන්ධයෙන් ගත්කල ඒවායේ පිරිවැය සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකිරීමෙන් පසුව සඳහන් කෙරේ . මෙකී පිරිවැය ඒවායේ ප්‍රයෝජ්‍ය ආයුකාලය අනුව පහත සඳහන් පරිදි ක්‍රමක්ෂය කෙරේ.

පරිගණක මෘදුකාංග අවුරුදු 05

පරිගණක මෘදුකාංග නඩත්තු කිරීමේ සේවාවන් ආශ්‍රිත පිරිවැය, දැරූ වියදම්ක් ලෙස හඳුනාගැනේ

3.5 ආශ්‍රිත සමාගම්වල ආයෝජනය කිරීම

සාමාන්‍යයෙන් සෘජුව හෝ වක්‍රව 20% ක කොටස් ධාරිත්වයක් වෙනුවෙන් ජන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ඇති එමෙන් සමාගම විසින් කැපී පෙනෙන බලපෑමක් කලත් පාලනයක් (Control) කළ නොහැකි ආයතන, ආශ්‍රිත සමාගම් වේ. ආශ්‍රිත සමාගම්වල කෙරෙන ආයෝජන ගණනය කිරීම සඳහා ස්කන්ධ ගිණුම් ක්‍රමය භාවිතා කරන ලදී. මෙම ක්‍රමය යටතේ ආයෝජන මූලික වශයෙන් පිරිවැය මත හඳුනා ගනු ලැබේ.

ආයෝජකයාගේ ලාභයේ හෝ පාඩුවේ කොටස හඳුනා ගැනීමට ඉදිරියට ගෙනයන වටිනාකම් අත්පත්කර ගැනීමේ දිනෙන් පසුව වැඩි හෝ අඩු කෙරේ.

සමාගමේ පශ්චාත් අත්පත් කර ගැනීම්වල ලාභයේ හෝ පාඩුවේ කොටස සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනෙන අතර ආයෝජිතයාගේ සෙසු සවිස්තරාත්මක ආදායම තුළ එහි පශ්චාත් අත්පත් කර ගැනීම්වල වර්යාවන් ආයෝජකගේ ඉදිරියට ගෙනයන වටිනාකමට වූ අනුරූප ගැලපුම් සහිතව වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගනු ලැබේ.

එක් එක් වාර්තා කිරීමේ දිනයේදී ආශ්‍රිත සමාගම්වල සිදුකර තිබෙන ආයෝජන හානි වී ඇත්ද යන්න පිළිබඳව කිසියම් විෂය මූලික සාක්ෂි තිබේදැයි යන්න සමාගම් විසින් තීරණය කරනු ඇත. එවන් ආවස්ථාවක් වේ නම් ආශ්‍රිත සමාගම්වලින් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය හා එහි ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස හානිය සේ ගණනය කොට සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ ආශ්‍රිත සමාගම්වල ලාභයේ/ (පාඩුවේ) කොටසට සමීප සංඛ්‍යාව හඳුනා ගනු ලැබේ.

3.6 විකිණීමට තිබෙන ජංගම නොවන වත්කම්

ජංගම නොවන වත්කම් පාවිච්චි කිරීමට වඩා ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම් ඒවා මූලික වශයෙන් විකිණීමෙන් ලබා ගත හැකි වන්නේ නම් සමාගම විසින් ඒවා ජංගම නොවන වත්කම් වශයෙන් වර්ගීකරණය කරනු ලබේ.

විකිණීමට තිබෙන ජංගම වත්කම් මනිනු ලබන්නේ ඒවා විකිණීමට වැය වන පිරිවැය අඩුකිරීමෙන් පසු ඒවායේ ඉදිරියට ගෙන යන වටිනාකම සහ සාධාරණ අගය අනුවය. විකිණීමට තිබෙන යන වර්ගීකරණය සඳහා වූ නිර්ණායකය සපුරා ඇති බව සැලකෙන්නේ විකිණීම සඳහා පැවතීම යන කරුණුය. කළමනාකාරිත්වය විසින් විකිණීමේ ක්‍රියාව සඳහා කැපවිය යුතු අතර විකිණීම සඳහා වර්ගීකරණය සිදුකොට වර්ෂයක් තුළදී එය අංග සම්පූර්ණ විකුණුම් ක්‍රියාවක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබා තිබිය යුතුය. අයිතිකරුවන්ට විකිණීමට/ බෙදා දීමට යනුවෙන් වර්ගකොට ඇති දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂයවීම් හෝ ක්‍රමක්ෂය සිදු නොකෙරේ.

3.7 මූල්‍ය නොවන වත්කම් හානි වීම

එක් එක් වාර්තා කිරීමේ අවසන් දිනයට මූල්‍ය වත්කම් වල කිසියම් හානිකරණය වීමක් සිදුවී ඇත්දැයි යන්න හඳුනා ගැනීම පිණිස සමාගම විසින් ඒවා සමාලෝචනය කරයි. එවැනි හානිකරණය වීමක් සිදුවිය හැකි බවට ඉඟියක් වේ නම් එවැන්නක් සිදුවී ඇති වත්කමින් (හෝ ආශ්‍රිත භාණ්ඩ සමුහයක්) අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කොට එහි ඉදිරියට ගෙනයන වටිනාකම, සමහ සසඳනු ලැබේ. අය කර ගත හැකි මුදල අඩු නම් ඉදිරියට ගෙන යන වටිනාකම් එහ් ඇස්තමේන්තු කළ අයකර ගත හැකි මුදලට අඩුකොට, හානිකරණය පාඩුව ලාභ හෝ පාඩු තුළ ඉක්බිතිව හඳුනා ගැනේ.

මීට සමානව සෑම වර්තා කිරීමේ දිනය වන විට එක් එක් තොග (හෝ භාණ්ඩ සමුහය) ඒවායේ විකිණුම් මිල සමග, (සැසඳීම හා විකිණීම සඳහා දරන ලද පිරිවැය අඩුකොට), ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සමග සසඳමින් හානිකරණ වීම් සැලකිල්ලට ගෙන තක්සේරු කරනු ලැබේ.

කිසියම් තොගයක් (හෝ එවැනි භාණ්ඩ සමුහයක්) හානිකරණ වී ඇත්නම් විකිණීමේ පිරිවැය අඩුකොට , එහි ඉදිරියට ගෙනයන වටිනාකම විකිණීමේ මිලට අඩු කරනු ලබන අතර ඉන් ඉක්බිතිව ලාභ හෝ පාඩු තුල හඳුනා ගැනීමට කටයුතු කෙරේ.

හානිකරණ පාඩුවක් ඉන් පසුව ප්‍රතිවර්තනය වේ නම් , වත්කමේ (හෝ ආශ්‍රිත වත්කම් සමුහයේ) ඉදිරියට ගෙනයන වටිනාකම එහි අයකරගත හැකි සංශෝධිත වටිනාකමට (තොගය සම්බන්ධයෙන් නම් ඒවා සම්පූර්ණයෙන් විකුණා දැමීමේ පිරිවැය අඩුකොට) ඉහල නංවනු ලැබේ . එහෙත් එය ඉකුත් අවුරුදු වල , එකී වත්කම (හෝ ආශ්‍රිත වත්කම් සමුහය) සම්බන්ධයෙන් හානිකරණ පාඩුවක් සිදු නොවූ අවස්ථාවක තීරණය කිරීමට ඉඩ තිබූ වටිනාකමට වැඩි නොවිය යුතු ය . හානිකරණ පාඩුවක ප්‍රතිවර්තන ලාභ හෝ පාඩු තුල ඉක්බිතිව හඳුනා ගැනේ .

3.8 තොගය

තොග අගය,යල්පැනගිය සහ අඩුවෙන් පාවිච්චිවන භාණ්ඩ විෂයන් වෙනුවෙන් ලැබිය යුතු නිසි ප්‍රතිලාභ සැලසීමෙන් පසු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම හඳුනාගත හැකි වටිනාකම අනුව අඩුකරනු ලැබේ. තොගවලට පරිභෝජන ද්‍රව්‍ය ඇතුලත් වේ. තොග දැනට පවත්නා ස්ථානයට හා දැනට පවත්නා තත්වයට ගෙන ඒමට දැරූ පිරිවැය FIFO පදනම අනුව ගණනය කරනු ලැබේ. මුදල් කිරීමේදී ලැබෙන ශුද්ධ වටිනාකම, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ තොග විකිණිය හැකි මිලයි.

3.9 මූල්‍ය උපකරණ

මූල්‍ය වත්කම්

සමාගම විසින් තම මූල්‍ය වත්කම් , ප්‍රාරම්භක හඳුනාගැනීම මත වර්ගීකරණය කිරීමට තීරණය කරනු ලබන අතර එකී මූල්‍ය වත්කම් පහත දැක්වෙන අයුරු වර්ගකරයි .

(අ) වර්ගීකරණය

(i) ණය සහ ලැබීම් නියමිත

ණය සහ ලැබිය යුතු දේ යනු සක්‍රිය වෙළඳ පොලේ ලයිස්තුගත නොවූ ස්ථිර හෝ නිර්ණය කලහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. වාර්තාකිරීමේ දිනය අවසාන වීමේ සිට මාස 12 කට වඩා වැඩි කාලසීමාවක් සඳහා ප්‍රවර්තන නොවන වත්කම් සේ වර්ග කොට ඇති කල්පිරීම් ආයෝජන හැර ණය සහ ලැබිය යුතු දේ නියමිත වලට අඩංගුවන්නේ වාර්තාකිරීම් කාලසිමාවේ අවසාන දිනය වන විට ඇති වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත , කාලීන තැන්පතු ආයෝජන, තැන්පතු හා අත්තිකාරම් ,මුදල් හා මුදල් සාම්‍යයන් යන ඒවාය.

(ii) විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

විකිනීමට ඇති මූල්‍ය වත්කම් වූ කලි මෙම ගණයයට නම් කරන ලද ව්‍යුත්පන්න නොවන භාණ්ඩ විෂයන් හෝ වෙනත් ගණයන් යටතේ වර්ගීකරණය නොකරන ලද ඒවා වේ.වාර්තාකිරීමේ අවසන් දිනයේ සිට මාස 12 ක් ඇතුලත විකුණා දැමීමට සමාගම අපේක්ෂා නොකරන්නේ නම් හෝ ආයෝජනය කල් නොපිරේනම් එකී වත්කම් ප්‍රවර්තන නොවන වත්කම්වලට ඇතුලත් කෙරේ.විකිනීමට ඇති මූල්‍ය වත්කම්, දිගුකාලීන ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ කොටස්වලින් සමන්විතවේ .

(iii) කල්පිරීම් සඳහා තබා ඇති ආයෝජන (HTM)

කල්පිරීම් ආයෝජන වූ කලි ස්ථිර හෝ නිගමනය කල හැකි ගෙවීම් හා ස්ථිර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ණය හා ලැබීම් නියමිතද ඊටඇතුලත් නැත. කල්පිරෙන තෙක් එකී ආයෝජන එසේ රඳවා තැබීමට අපේක්ෂාවක් හෝ හැකියාවක් තිබෙනම් එම අයෝජන කල් පිරීම සඳහා රඳවා තැබූ ආයෝජන සේ වර්ග කෙරේ. අවුරුද්දකට වැඩි කාලයකින් කල් නොපිරේ නම් කල් පිරිම සඳහා රඳවූ ආයෝජන ප්‍රවර්තන වත්කම්වලට ඇතුලත් කෙරේ. කල් පිරීම සඳහා තබා ඇති ආයෝජන භාණ්ඩාගාර බිල්පත් වලින් සමන්විත වේ.

(ආ) හඳුනාගැනීම හා ප්‍රාරම්භක මැන බැලීම්

සමාගම විසින් ගණුදෙනු ආරම්භ කරන දිනයේ සිට ණය සහ අනෙකුත් ලැබීම්. නියමිත වශයෙන් මුල්‍ය වත්කම් හඳුනා ගැනේ.මුල්‍ය උපකරණයේ කොන්ත්‍රාත්තුමය විධිවිධාන තුළ සමාගම පාර්ශවයකත්වය දක්වන දිනයේ සිට (trade-date)අනෙකුත් මුල්‍ය වත්කම් හඳුනාගනු ලැබේ. මූලික වශයෙන්ම මුල්‍ය වත්කමක් සාධාරණ මිල අනුව මනිනු ලබන අතර ඊට ලාභ හෝ අලාභ හර හා සාධාරණව විනාකම අනුව හඳුනාගනු නොලබන වත්කම් සම්බන්ධයෙන් ඒවාට අදාළ වන ගණුදෙනු පිරිවැයද ඊට ඇතුළත්ය. මුල්‍ය වත්කමෙන් ජනිතවන මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමට තිබෙන හිමිකම් ඉකුත්වන විට හෝ එකී හිමිකම් වෙනත් පාර්ශවයකට පවරන විට සහ සමාගම සත්‍ය වශයෙන් ම පවරාදෙනු ලබන විට මුල්‍ය වත්කම් ප්‍රතිපාදන හඳුනාගැනීමක් සිදු නොකෙරේ. සමාගම මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇත.

(ඇ) පසුව ගණනය කිරීම

(i) ණය සහ ලැබීම් නියමිත

ප්‍රාරම්භක හඳුනා ගැනීමෙන් ඉක්බිතිව ණය සහ ලැබීම් නියමිත අපවය සඳහා වූ ප්‍රතිපාදන අඩුකෑාට සළුු ඵපාලී අනුපානිකය ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මඟින් මැන ඛලනු ලැබේ.

(ii) විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

ප්‍රාරම්භක හඳුනාගැනීමෙන් ඉක්බිතිව, විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගකොට ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම අනුව මනිනු ලැබේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල, සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගැනෙන අතර කොටස් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය තුළ විකිණීමට ඇති සංචිතය වශයෙන් ඉදිරිපත් කෙරේ. ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන සහ කිසියම් අපවය පාඩුවක් තිබේ නම් ඒවා අඩුකොට පිරිවැය අනුව ගණනය කෙරෙන්නේ ප්‍රවර්තන කාලයේදී ඒවායේ සාධාරණ අගය තක්සේරු කළ නොහැකි නිසාය.

(ii) කල්පිරිම සඳහා ඇති ආයෝජන

කල්පිරීම් සඳහා තබා ඇති ආයෝජන සළුල පොලි අනුපාතය භාවිතකරමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කෙරේ. අත්පත් කරගැනීම් හා ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

(ඇ) මුල්‍ය වත්කම් හානි වීම

(i) ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙන යන වත්කම්

එක් එක් වාර්තා කිරීමේ කාලසීමාව අවසානයේදී කිසියම් මූල්‍ය වත්කමක් අපවය වී ඇති බවට විෂය මූලික සාක්ෂි තිබෙදැයි තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කම් අපවය වී අපවය පාඩුවක් සිදුවන්නේ වත්කමේ ප්‍රාරම්භක හඳුනා ගැනීමෙන් ඉක්බිතිව සිදුවන්නා වූ යම් පාඩු සිදුවීමක් හෝ පාඩු සිදුවීම් ගණනාවක් නිසා වූ අපවය වීමක් පිළිබඳව විෂය මූලික සාක්ෂි තිබෙනම් සහ එකී පාඩු සිදුවීම/ සිදුවීම් හරහා නිසැක ලෙස තක්සේරු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් එයින් ඇති වන බවට විෂය මූලික සාක්ෂි ඇත්නම් පමණි.

ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙනයන ණය හා ලැබීම් නියමිත සම්බන්ධයෙන් ගත් කළ ඒවායේ පාඩු මනිනු ලබන්නේ වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම සහ මූල්‍ය වත්කමේ වත්කම් සළුල පොලී අනුපාතය අනුව වට්ටම් කරන ලද ඇස්තමේන්තු අනාගත මුදල් ප්‍රවාහයන්හි (නොදැරූ අනාගත ණය පාඩු හැර) ප්‍රවර්තන අගය අතර ඇති වෙනසයි. මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙන ඇති වටිනාකම අඩු කරනු ලබන අතර පාඩු වූ මුදල සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

ඉක්බිතිව එළඹෙන කාල පරිච්ඡේදයකදී අපචය පාඩුව අඩු වේ නම් හා අපචය හඳුනා ගැනීමෙන් පසුව සිදුවූ කාරණාවකට එකී අඩුවීම විෂය මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වයි නම් කලින් හඳුනාගත් අපචය පාඩුවේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

ii) විකිණීමට ඇති මූල්‍ය වත්කම්

වාර්තාකිරීම් අවසන් දිනය වන විට කැපී පෙනෙන අයුරින් දිගින් දිගටම අපචය වී ඇති බවට විෂය මූලික සාක්ෂි ඇත්දැයි සමාගම විසින් තක්සේරු කරනු ලැබේ . ලැයිස්තු ගත කොටස් ආයෝජනය කිරීම් සම්බන්ධයෙන් ගත්කල ආයෝජනයන්හි සාධාරණ අගයෙහි සැලකිය යුතු හා දිගුකාලීන අඩුවීම් ඒවායේ පිරිවැයට අඩු නම් , වත්කම් අපචය වන බවට සාක්ෂියක් වේ . ලැයිස්තුගත ආයෝජන සම්බන්ධයෙන් එවැනි සාක්ෂියක් විද්‍යමාන වේ නම් (ලාභ හෝ අලාභයන්හි සැලකීම් හඳුනාගෙන් අපචය පාඩු වේ දක්වා ඉවත් කරන විට සමුච්චිත අලාභය) අත්පත් කරගැනීමේ පිරිවැය හා වත්මන් සාධාරණ අගය අතර වෙනස සමුච්චිත අලාභය සේ ගණනය කරනු ලබන අතර ප්‍රතිවර්ගීකරන සිරුමාරුවක් වශයෙන් කොටස් ස්කන්ධයේ සිට ලාභය දක්වා හෝ පාඩු තුල හඳුනාගනු ලබන අපචය පාඩු හෝ ලාභ හරහා ප්‍රත්වර්තනය කරනු ලැබේ . එසේ ප්‍රතිවර්තනය කරන ලද මුදල් ප්‍රමාණය වෙනත් විස්තීර්ණ අදායම් තුල හඳුනාගනු ලැබේ .

ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන සම්බන්ධයෙන් ගත්කල ආයෝජනයන්හි වටිනාකම් ඒවා සඳහා දැරූ පිරිවැයට අනුව කැපී පෙනන අයුරින් දිගින් දිගටම අඩුවක් පෙන්නුම් කරන්නේ නම් එය වත්කම් අපචය වන බවට සාක්ෂියක් වේ . එබඳු යම් සාක්ෂියක් ලැයිස්තුගත නොවූ ආයෝජන සම්බන්ධයෙන් දක්නට ලැබේ නම් එවැනිම මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් වත්මන් වෙළඳපොලේ අනුප්‍රමාන (rate) මත වට්ටම් කරනු ලැබූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම හා මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස පාඩුවට අදාල මුදල සේ ගණනය කරනු ලැබේ . එවැනි අපචය හානි ආපසු හැරවිය නොහැක.

3.9.1 වෙළඳ හා අනෙකුත් ලැබීම් නියමිත

වෙළඳ හා අනෙකුත් ලැබීම් නියමිත, මූලිකව ගනුදෙනු මිල අනුව හඳුනාගනු ලැබේ. ලැබීම් නියමිත පොලියක් නොදරන විට සහ ලැබිය යුතු මුදල් (වට්ටම් නොකළ) පදනම් කරගෙන තක්සේරු කරන තැන්හි දී සාමාන්‍ය ණය කොන්දේසි යටතේ බොහෝ විකිණුම් සිදු කෙරේ. සාමාන්‍ය ණය කාලසීමාවෙන් ඔබ්බට ණය දිගු කෙරෙන විට, ලැබීම් නියමිත , ක්‍රමක්ෂය පිරිවැය අනුව මැන බලන අතර ඊට යොදාගනු ලබන්නේ සළුල පොලී අනුපාතයයි.වාර්තා කිරීමේ අවසාන දිනයට වෙළඳ ලැබීම්නියමිතවල ඉදිරියටගෙනයන වටිනාකම ලැබිය යුතු මුදල් ප්‍රමාණයෙන් ආපසු අය කර ගැනීමට නොහැකි වන බවට විෂය මූලික සාක්ෂියක් තිබේ දැයි තීරණය කිරීම පිණිසසමාලෝචනය කරනු ලැබේ. එසේවන අවස්ථාවලදීඅපචය පාඩුව ලාභ සහ අලාභය වහාම හඳුනා ගැනේ. 2018 අප්‍රේල් 01 දින සිට මුල්වරට ලංකා නැව් සංස්ථාව විසින් අතීත සබලතාව සහිතව SLFRS -09 අදාළ කර ගත්තේය.

3.9.2 මුදල් හා මුදල් සාම්‍යයන්

මුදල් හා මුදල් සාම්‍යයන් ඇතුලත් වන්නේ අතැති මුදල් ඉල්ලූ විටෙක ගතහැකි තැන්පතු සහ මුලිකව මාස තුනකට වඩා හෝ ඊට අඩු කල්පිරීම් සහිත ඉහල ද්‍රවශීලතාවයෙන් යුක්ත අනෙකුත් කෙටි කාලින ආයෝජනයන්. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ඇති ප්‍රවර්තන වගකීම්වල වල බැංකු අයිරා සඳහන් කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය " වක්‍ර ක්‍රමය ' භාවිතා කරමින් පිළියෙළ කොට තිබේ.

මූල්‍ය වගකීම

3.9.3. වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත

වෙළඳ හා ගෙවීම් නියමිත මුලික වශයෙන් ගනුදෙනු පිරිවැය ඇතුලත්ව ගනුදෙනු මිල යටතේ හඳුනාගනු ලැබේ. වෙළඳ ගෙවීම් නියමිත වූ කලී සාමාන්‍ය ණය නියමයන් මත ඉටු කරන බැඳියාවන් වන අතර ඒවාට පොලිය අඩංගු නොවේ. සඵල පොලි අනුපාත ක්‍රමය යොදා ගනිමින් ඉක්බිතිව පොලි සහිත වගකීම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මැන බැලීම සිදු කෙරේ .

3.9.4 බැංකු අයිරා

බැංකු අයිරා, ඉල්ලූ විටක ගෙවිය යුතු ඒවා වන අතර මුලිකව මැන බලා ඉක්බිතිව මුහුණත වටිනාකම අනුව සඳහන් කරනු ලැබේ.

3.10 රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙන බවට සැලකිය යුතු සහතිකයක් තිබේ නම් සහ සමාගම විසින් ඊට අදාල කොන්දේසි වලට අනුව කටයුතු කරන්නේ නම් මුදල් නොවන ප්‍රදාන ඇතුළුව රජයෙන් ලැබෙන දෑ සාධාරණ මිල අනුව හඳුනාගැනේ .

දේපල , පිරියත හා උපකරණ සම්බන්ධයෙන් රජයෙන් ලැබෙන ප්‍රදාන විලම්බිත ප්‍රදාන ලෙසින් ජංගම නොවන වගකීම් වල ඇතුලත් කෙරෙන අතර අදාල වත්කම්වල අපේක්ෂිත ආයු කාලය මත සෘජු රේඛා පදනමින් විස්තිරණ අදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ .

මුදල් නොවන ප්‍රදාන ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම අනුව අගයනු ලබන අතර ඉදිරියට ගෙනයන වටිනාකම අනුව ප්‍රදාන හා වත්කම් ලෙස ගණනය කෙරේ.

වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ව ප්‍රකාශ තුල "ජංගම වගකීම්" ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති බැඳියාවන් වූ කලී වාර්තා කිරීමේ දින සිට වර්ෂයක් ඇතුලත ගෙවීමට නියමිත හෝ ඉල්ලූ විටක ගෙවීමට තිබෙන ශේෂයන්ය. "ජංගම නොවන වගකීම්" යනු වාර්තා කළ දින සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂයන්ය.

මෙකී මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී , දන්නා ලද සියලු බැඳියාවන් ගිණුම්ගත කරනු ලැබ තිබේ. පසුගිය සිද්ධි වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගමට සාධනීය බැඳියාවන් හෝ නෛතික බැඳියාවන් ඇති විට ප්‍රතිපාදන හා බැඳියාවන් හඳුනාගනු ලැබෙන අතර බැඳියාවන් ඉටුකිරීම වෙනුවෙන් ඇතැම්විට ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලනය වීමක් ඇතිවිය හැක .

3.11 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

සමාගම සතුව නිශ්චිත ප්‍රතිලාභ මෙන්ම නිශ්චිත දායකත්ව සැලැස්ම යනුවෙන් විශ්‍රාම සැලැස්මක් තිබෙන අතර වෙනම ආයතනයක් සඳහා සමාගම නිශ්චිත දායකත්වයක් සිදුකරයි. එහෙත් සමාගම සතුව ප්‍රමාණවත් අරමුදල් , ප්‍රවර්තන හා පෙර කාල සීමා වෙනුවන් සේවකයින්ගේ සේවා වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීමට නොමැති විට ඒ සඳහා සම්මුතික හා නෛතික වශයෙන් සමාගම වගකීමෙන් බැඳී නැත .

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම විශ්‍රාම සැලසුමක් වන අතර නිශ්චිත දායකත්ව සැලසුමක් නොවේ. සාමාන්‍ය පරිදි විශ්‍රාම යාමේදී සේවකයෙකුට ලැබෙන නිශ්චිත මුදල කුමක්දැයි නිශ්චිත ප්‍රතිලාභ අරමුදලින් හැඳින්වේ . එය වයස , සේවා කාලය හා වන්දි මුදල මත තීරණය වේ .

(අ) නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල (E P F)
සේවක භාර අරමුදල (E T F)

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට සුදුසුකම් ලබන සියලු සේවකයින් ඒ ඒ ව්‍යවස්ථා සහ රෙගුලාසි අනුව අදාල දායකත්ව අරමුදල් වලින් ආවරණය වේ .

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

විශ්‍රාම පාරිතෝෂික සම්බන්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගෙන ගෙන ඇති වගකීම් වනාහි වාර්තා කිරීමේ දිනය වනවිට පවතින පාරිතෝෂික බැඳියාවන්හි වටිනාකමයි. පාරිතෝෂික ගණනය කිරීමේ සූත්‍රයට අනුව ප්‍රක්ෂේපිත එකක බැර ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂික බැඳියාවන් මනිනු ලැබේ .
1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව අවුරුදු 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කොට විශ්‍රාම යන සේවකයින්ට පමණක් පාරිතෝෂික ගෙවීමට සමාගම බැඳී සිටී.

වෙනත් සවිස්තරාත්මක ආදායම් තුළ ජීව ගණක ලැබීම්/පාඩු ඒවා සිදුවූ කාල සීමාව අනුව හඳුනා ගැනේ. පාරිතෝෂිකයට, බාහිර වශයෙන් මුදල් සම්පාදනය නොකෙරේ.

3.12 හදිසි අවස්ථා සහ ප්‍රාග්ධන බැඳියාවන්

වාර්තා කරන දිනය වන විට පවත්න ද්‍රව්‍යමය බැඳියාවන් හා අවිනිශ්චිත වගකීම්, මූල්‍ය ප්‍රකාශන වල ඒ ඒ සටහන් වලින් හෙලිදරව් කෙරේ.

<u>වීස්තීරණ ආදායම් ප්‍රකාශය</u>

3.13 ආදායම හඳුනාගැනීම

සමාගමට ආර්ථික ලැබීම් සහ දැරීමට ඇති ආදායම හා ආශ්‍රිත වියදම් විශ්වාසදායක ලෙස මැනිය හැකි විමසීම සම්භාව්‍ය වන තරමට ආදායම හඳුනාගැනේ. ලැබීමට ඇති හා ලැබූ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ මිල අනුව ආදායම මනිනු ලැබේ.

(අ) යාත්‍රා ආදායම

නැව් බඩු මෙහෙයුම් කටයුතු වලින් හා ප්‍රවාහන සේවා වලින් උත්පාදනය වන ආදායම, සේවාවන් සම්පූර්ණයෙන් ඉටුකිරීමේ පදනම මත ඒවා සපයන ලද කාල සීමා තුළදී හඳුනාගැනෙන අතර තථ්‍ය වශයෙන්ම සපයන ලද සේවා ප්‍රමාණය අනුව තක්සේරු කරනු ලැබේ.

(ආ) නැව්කුලී ආදායම

නැව් කුලියට දීමෙන් ලැබෙන ආදායම කාලීන කුලී ගිවිසුමට අදාළ කාලසීමාව අනුව උපචිත පදනමක් මත හඳුනාගනු ලැබේ.

(ඇ) ඒජන්සි ගාස්තු

සේවාවන් සම්පූර්ණ කිරීමේ පදනම මත සේවාවන් සැපයූ කාලය අනුව නියෝජ්‍ය ආයතන ගාස්තු හඳුනාගනු ලැබේ.

(ඈ) පොලිය

සඵල පොලී ක්‍රමය මගින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

(ඉ) වෙනත් ලැබීම් හා පාඩු

ආයෝජන ඇතුලු දේපල, පිරියත හා උපකරණ හා අනෙකුත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම් ස්ථාවරයේ ශුද්ධ ලැබීම් සහ පාඩු, ලාභ සහ පාඩු වෙනුවෙන් ගිණුම් ගත කරන්නේ ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම හා ආශ්‍රිත විකුණුම් වියදම් විකිණීමෙන් ලත් මුදලින් අඩුකිරීමෙන් ඉක්බිනිවය.

(ඊ) ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීම් සඳහා වූ අයිතිය තහවුරු වූ පසු ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

3.14 වැය හඳුනාගැනීම

කාර්යක්ෂමව ව්‍යාපාරය පවත්වා ගැනීම සහ දේපල පිරියත උපකරණ නඩත්තු කිරීම සඳහා දැරූ සියලුම වියදම් වර්ෂය සඳහා වූ ලාභය හෝ පාඩුව ගණනය කිරීමේදී ආදායමට අයපත් කොට තිබේ.

3.15 ණයට ගැනුම් පිරිවැය

ණයට ගැනුම් පිරිවැය සෘජුවම අදාල වන්නේ වත්කමක් අත්පත් කර ගැනීම, එම වත්කමේ පිරිවැයේ කොටසක් වන සුදුසුකම් ලබන වත්කමක් ගොඩනැගීම හෝ නිෂ්පාදනය වෙනුවෙන් වූ පිරිවැයයි. අනෙකුත් ණයට ගැනුම් පිරිවැය වියදමක් ලෙස හඳුනා ගැනේ.

3.16 ආශ්‍රිත පාර්ශව සමග ගනුදෙනු

අයකරනු ලබන ගාස්තු පිළිබඳව තැකීමක් නොකොට මූල්‍ය හා මෙහෙයුම් තීරණ/ ප්‍රතිපත්ති මත කැපී පෙනෙන පාලනයක් හෝ බලපෑමක් ඇති කිරීම සඳහා එක් පාර්ශවයකට හැකියාව ලැබෙන ගනුදෙනු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදුකොට තිබේ.

3.17 නව සහ සංශෝධිත ප්‍රමිති හා ඒවායේ අර්ථ දැක්වීම

සමාගමේ මුල්‍ය ප්‍රකාශ නිකුත් කල දිනට නිකුත් කරන ලද ප්‍රමිති සහ පරිවර්තන සහ තවමත් ක්‍රියාත්මක නොවූ ඒවා පහත හෙළිදරව් කොට ඇති අතර මෙකී ප්‍රමිතීන් අදාල වන්නේනම් හා ක්‍රියාත්මක වන්නේනම් යොදා ගැනීමට සමාගම අදහස් කරයි.

SLFRS 17 - රක්ෂණ කොන්ත්‍රාත්තු

2020 ජනවාරි 08 වන දින ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) (SLFRS 17) එනම් රක්ෂණ කොන්ත්‍රාත්තු නිකුත් කළේය.

SLFRS 17 සඳහා කෙරුණු සංශෝධන මගින් SLFRS 17 2021 ජුනි 28 දින සංශෝධන කරන ලදී. SLFRS 17 වූ කලී පිළිගැනීම,මැන බැලීම,ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම් ආවරණය කෙරෙන සවිස්තරාත්මක රක්ෂණ කොන්ත්‍රාත් සඳහා වන නම් ගිණුම් ප්‍රමිතියකි.

මෙය ක්‍රියාත්මක වූ විට 2005 නිකුත් කරන ලද SLFRS 4 මෙමගින් ප්‍රතිස්ථාපනය වෙනු ඇත. සියලු රක්ෂණ කොන්ත්‍රාත්තු එනම් ජීවිත, ජීවිත නොවන, සෘජු රක්ෂණ හා ප්‍රති රක්ෂණ සම්බන්ධයෙන් මෙය අදාල වන අතර අභිමතානුසාරී සහභාගිත්ව සහිත ඇතැම් ඇප සහතිකවීම් සහ මුල්‍ය සාධන පත්‍ර මෙන්ම ඒවා නිකුත් කල ආයතන ගැන තැකීමක් නොවී අදාල වේ.සමහර විෂය පත බැහැරවීම් ද අදාලය. රක්ෂණයක් සඳහා වඩාත් ප්‍රයෝජනවත් සහ අනුකූල කොන්ත්‍රාත්තු සඳහා SLFRS 17 මගින් ගිණුම් මොඩලයක් සලසා දීම. SLFRS 17 හි මූලික අරමුණ වේ.

මීට පෙර පැවති දේශීය ගිණුම් ප්‍රතිපත්තිවලට පනදෙන ඒවාට වඩා SLFRS 17 මගින් අදාල සියලු අංග ආවරණය කෙරෙමින් රක්ෂණ කොන්ත්‍රාත්තු සඳහා විස්තීර්ණ මොඩලයක් සලසා ඇත. SLFRS 17 හි ප්‍රධාන අරමුණ වන්නේ,

- සෘජු සහභාගිත්ව ලක්ෂණ (අඩු වැඩිවන ගාස්තු ප්‍රවේශයක් සහිත කොන්ත්‍රාත්තු සඳහා විශේෂිත යොදාගැනීම්)

- කෙටිකාලින කොන්ත්‍රාත්තු සඳහා සරල ප්‍රවේශයක් (වාරික වෙන්කිරීමේ ප්‍රවේශයක්)

අවශ්‍ය විස්තීර්ණ සංඛ්‍යා සහිතව 2023 ජනවාරි 01 න් පසුව ආරම්භ වන හෝ පසුව එළඹෙන වාර්ෂික වාර්තා කිරීමේ කාල සඳහා SLFRS 17 බල පැවැත්වේ. කලින් යොදා ගැනීමට අවසර ඇති අතර එසේ කළ හැක්කේ SLFRS 17 පළමුවෙන්ම එකේ ආයතනය විසින් භාවිත කරන්නේ නම් පමණි. මෙකී ප්‍රමිතිය යොදා ගැනීමෙන් සමූහයේ මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රමාණවත් බලපෑමක් ඇති වෙතැයි සමූහය අදහස් නොකරයි.

දේපල පිරියත හා උපකරණ - අපේක්ෂිත භාවිතයට පෙර ලැබෙන දෑ LKAS – 16 ට සංශෝධන

2021 මාර්තු වල දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් දේපල පිරියත උපකරණ සම්බන්ධයෙන් ඒවායේ අපේක්ෂිත භාවිතයට පෙර ලැබෙන දෑ පිළිබඳව සංශෝධන සිදු කළ අතර එයින් සිදු කරන ලද්දේ සමාගම විසින් ඒවා අවශ්‍ය ස්ථානවලට ගෙන ඒමේ දී දරන ලද වියදම් දේපල පිරියත හා උපකරණ විකිණීමේදී ලබන මුදල් එක් ආයතන විසින් අඩු කිරීම වැළැක්වීමයි ඒ වෙනුවට එකී ආයතන විසින් එකී භාණ්ඩ විෂයන් විකිණීමෙන් ලද මුදල් එකී භාණ්ඩ නිෂ්පාදනය සඳහා වූ පිරිවැය ලාභයේ හෝ පාඩුව තුළ හඳුනා ගනියි. මෙකී සංශෝධන 2020 ජනවාරි 01 දිනෙන්පෙර හෝ පසු එළඹෙන වාර්තා කිරීමේ දින සිට බලපැවැත්වෙන අතර දැනට ඇති දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් අදාල කරගත යුතුවේ.

LKAS 37 -කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමේ පිරිවැය

2021 මාර්තු 25 වන දින ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් අවිනිශ්චිත බැදියාවන් සහ අවිනිශ්චිත වත්කම් මොනවාද යන්න විශේෂිත ලෙස දැක්වීම පිණිස LKAS -37සඳහා සංශෝධන නිකුත් කරන ලද්දේ කොන්ත්‍රාත්තුවක් දුෂ්කර වන්නේ ද යන්න නිශ්චය කරනු පිණිසය මෙම සංශෝධනය මගින් සෘජු ආශ්‍රිත ප්‍රවේශයක් අදාල කර ගැනේ. භාණ්ඩ හා සේවා සැලසීම පිණිස වූ කොන්ත්‍රාත්තුවක් සඳහා සෘජුව හෝ වක්‍රව සම්පතාවක් දක්වන පිරිවැයට කටයුතු වර්ධනීය පිරිවැය හෝ වෙනත් කොන්ත්‍රාත්තු සඳහා අනෙකුත් පිරිවැය වෙන් කිරීම් ඇතුළත් වේ. සාමාන්‍ය සහ පාලනාත්මක පිරිවැය කොන්ත්‍රාත්තුවකට කෙලින්ම සම්බන්ධ නොවන අතර කොන්ත්‍රාත්තු යටතේ අනු පාර්ශවයකට විශේෂයෙන් අදාළ කරගත නොගත යුතු නම් ඉවත් කරනු ලැබේ. සංශෝධන 2022 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන වාර්ෂික වාර්තා කිරීමේ දින සිට ක්‍රියාත්මක වේ කලින් යොදාගැනීමට අවසර ඇත.

මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	2022 රු.	2021 රු.
4 ආදායම			
යාත්‍රා ගමන්		1,802,122,355	597,832,869
නැව් බඩු ප්‍රවාහනයෙන් ලැබූ ආදායම (ස්වකීය නාවික යාත්‍රා මගින්)		439,788,449	1,425,339,909
තමන්ගේම නාවික යාත්‍රා කුලියට දීමෙන් ආදායම		2,978,237,896	587,535,533
නැව් කුලියට දීමෙන් ලද ආදායම -ගල් අඟුරු		2,246,567,897	-
නිෂ්කාෂණ හා ඉදිරිපත් කිරීම්		18,165,709	8,337,584
ඒජන්සි හා ඇමතුම් ගාස්තු		391,934,051	475,573,131
		7,876,816,356	3,094,619,027
5 වෙනත් ආදායම්			
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලාභය		-	56,840
ලාභාංශ		-	192,143
විනිමය ලැබීම්		356,654,971	62,220,301
පොලී ආදායම - ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්		45,379,467	23,963,961
පොලී ආදායම - (සේවක මණ්ඩලය)		1,642,484	1,465,263
ප්‍රමාද ගාස්තු අයකර ගැනීම් - ස්වකීය යාත්‍රා		4,064,850	126,681,291
ලේඛන ගාස්තු අයකිරීම්		3,541,235	5,807,139
වෙනත්		60,265,190	9,353,012
		471,548,197	**229,739,950**
6 මෙහෙයුම්වලින් ලාභ (පාඩු)			
පහත දැක්වෙන දෑ ඇතුළු වියදම් අයපත් කිරීමෙන් පසුව මෙහෙයුම් ලාභය (පාඩුව) සඳහන් කොට තිබේ			
විගණකවරුන්ගේ පඩිනඩි		760,000	741,000
ක්ෂය වීම්		420,194,198	413,611,172
වෘත්තිය හා නෛතික ගාස්තු		584,905	637,400
කාර්ය මණ්ඩල පිරිවැය (සටහන 6.1)		153,748,708	153,638,941
6.1 කාර්ය මණ්ඩල පිරිවැය			
අධ්‍යක්ෂවරුන්ගේ වේතන		596,050	1,097,000
වැටුප් හා වේතන		140,610,298	129,155,049
නිශ්චිත දායකත්වය සැලසුම් පිරිවැය - (EPF) සේවක අර්ථසාධක අරමුදල නිශ්චිත දායකත්වය සැලසුම් පිරිවැය - (ETF) සේවක භාර අරමුදල		15,134,172	16,860,958
නිශ්චිත දායකත්වය පිරිවැය - විශ්‍රාම පාරිතෝෂික		(2,591,813)	6,525,934
		153,748,708	153,638,941
7 මූල්‍ය වියදම්			
මූල්‍ය වියදම්			
පොලී වියදම් - යාත්‍රා ණය		(727,535,758)	(756,811,358)
විනිමය පාඩු		(6,081,305,456)	(684,460,191)
		(6,808,841,215)	**(1,441,271,549)**
8 ආදායම් බදු ආදායම්/ (වියදම්)			
සාමාන්‍ය කටයුතු සඳහා බදු	8.1	-	-
විලම්බිත බදු වත්කම් ප්‍රතිවර්තනය	17	1,197,593,218	286,195,458
		1,197,593,218	**286,195,458**

මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		සටහන	2022 රු.	2021 රු.
8.1	**බද්දට යටත් ලාභය හා ගිණුම් ලාභය සැසඳීම**			
	බද්දට පෙර ගිණුම් ලාභය		(4,567,786,074)	(527,125,027)
එකතු කළා :	ආශ්‍රිත සමාගම්වලින් ලැබූ ලාභාංශය		353,122	353,122
අඩු කළා :	ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බද්ද ඇතුළුව)		(40,277,522)	(10,185,997)
			(4,607,710,474)	(536,957,902)
	ඉඩදිය නොහැකි විෂයාංග මුළු එකතුව		7,234,195,429	1,858,902,160
	ඉඩදිය හැකි විෂයාංග මුළු එකතුව		(29,963,768)	(12,092,543)
	ණයකර අපවයන් සඳහා අපවය ප්‍රතිපාදන		177,070,299	161,701,680
	බද්දට යටත් නැති ආදායම		(47,375,073)	(24,509,226)
	ව්‍යාපාරයෙන් ලාභ තක්සේරු කළ හැකි ආදායම		2,726,216,413	1,447,044,169
	ආයෝජන වලින් තක්සේරු කළ හැකි ආදායම		47,375,073	24,509,226
එකතු කළා :	බදුපොලි ආදායමට යටත් වෙනත් ආදායම්			
	මුළු ව්‍යවස්ථාපිත ආදායම/ තක්සේරු ආදායම		2,773,591,486	1,471,553,395
	වර්ෂය සඳහා සාමාන්‍ය කටයුතු මත ප්‍රවර්තන බදු	**8**		

9 කොටසක් වෙනුවෙන් මූලික හා තනුක ඉපැයීම්

වාර්තා කිරීමේ කාලය තුළ නිකුත් කොට ඇති සාමාන්‍ය බර තැබූ මධ්‍ය සංඛ්‍යාවෙන් සාමාන්‍ය කොටස් ධාරීන් වෙත ආරෝපනය කළ හැකි ලාභය (පාඩුව) බෙදා ගණනය කිරීමෙන් කොටසක් වෙනුවෙන් ගණනය කරනු ලැබේ. මූලික හා තනුක ඉපැයීම් (පාඩු)

ලවය විශයෙන් භාවිතා කරන ලද මූදල		
කොටස් හිමි ආරෝපිත ශුද්ධ ලාභය (රු)	(4,567,786,074)	(527,125,027)
හරය විශයෙන් භාවිතා කරන ලද මූදල		
නිකුතුවට අදාළ බර තැබූ සාමාන්‍ය කොටස් ගණන	5,000,000	5,000,000
කොටසක් වෙනුවෙන් මූලික හා තනුක ඉපැයීම් (රු)	**(913.56)**	**(105.43)**

කොටසක් සඳහා මූලික හා තනුක ඉපැයීම්

වාර්තා කිරීමේ කාලය තුළ නිකුත් කරනු ලබන සාමාන්‍ය කොටස් ගණනේ සාමාන්‍ය බර තැබූ සාමාන්‍ය කොටස් වෙත ආරෝපනය කළ හැකි ලාභය (පාඩුව) බෙදා ගණනය කිරීමෙන් මූලික හා තනුක ඉපැයීම් (පාඩු) කොටස් අනුව ගණනය කරනු ලැබේ.

ලවය විශයෙන් භාවිත මූදල		
කොටස්ධාරීන් වෙත අදාළ ශුද්ධ ලාභය (පාඩුව) රු.	(4,567,786,074)	(527,125,027)

10 දේපොල, පිරියත හා උපකරණ

	ඉඩම් හා නිවාස ව්‍යාපෘති	ගොඩනැගිලි	යාත්‍රා	වියළි තටාකාංගන වැඩ	මෝටර් වාහන	ගෘහ භාණ්ඩ හා සවිකුරු	පරිගණක	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය හක්සේරුව								
2021 අප්‍රේල් 1 ට ශේෂය වර්ෂය තුළ එකතු කිරීම්	5,286,340	43,390	11,235,780,363	-	37,002,095	21,079,373	23,209,549	11,322,401,110
වියළි තටාකාංගන වෙනින් මාරු කිරීම්	-	-	-	41,296,844	-	482,243	2,533,572	44,312,659
වර්ෂය තුළ වැඩ කිරීම්	-	-	-		-	-	-	-
වර්ෂය තුළ බැහැර කිරීම්	-	-	-		-			-
2022 මාර්තු 31 දිනට ශේෂය	5,286,340	43,390	11,235,780,363	41,296,844	37,002,095	21,561,616	25,743,121	11,366,713,769
සමුච්චිත ක්ෂය වීම්								
2021 අප්‍රේල් 1 දිනට ශේෂය	1,261,372	43,390	2,010,089,087	-	33,520,886	13,642,811	19,718,791	2,078,276,337
පද්ධතියේ දෝෂය නිවැරදි කිරීම						3,272	(12,201)	(8,929)
වර්ෂය සඳහා ගාස්තු	8,316	-	408,178,758	7,082,692	1,694,976	1,288,471	1,940,986	420,194,198
බැහැර කිරීම් සඳහා	-	-	-		-			-
2022 මාර්තු 31 දිනට ශේෂය	1,269,688	43,390	2,418,267,846	7,082,692	35,215,862	14,934,553	21,647,576	2,498,461,606

ශුද්ධ පොත් අගය	සටහන්	2022 රු.	2021 රු.
නිවාස සහ ඉඩම් ව්‍යාපෘති		4,016,652	4,024,968
ගොඩනැගිලි		-	-
යාත්‍රා		8,817,512,517	9,225,691,276
යාත්‍රාංගන වැඩ		34,214,153	-
මෝටර් වාහන		1,786,233	3,481,209
ගෘහ භාණ්ඩ හා විසිතුරු		6,627,062	7,436,562
කාර්යාල උපකරණ හා පරිගණක		4,095,545	3,490,758
		8,868,252,162	9,244,124,773
කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ	10.1	3,626,440	3,626,440
අපවය සඳහා ප්‍රතිපාදන		(3,626,440)	(3,626,440)
	10.2	**8,868,252,162**	**9,244,124,773**

2022 මාර්තු 31 තෙක් උද්ගත වූ අභ්‍යන්තර හා බාහිර අපචය සාධක සැලකිල්ලට ගනිමින් සමාගම විසින් වාර්ෂික අපචය පරීක්ෂාව සිදු කළේය. 2022 මාර්තු 31 වන විට යාන්ත්‍රා වලින් අයකර ගතහැකි මුදල් ප්‍රමාණය තීරණය කරන ලද්දේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ භාවිත වටිනාකම් අනුව ගණනය කිරීමේ ක්‍රමය සහ LKAS 36 හි 33 වැනි ඡේදය අනුව ලංකා නැව් සංස්ථාවේ සභාපති විසින් පත් කරන ලද වෘත්තිකයන්ගෙන් සමන්විත ලංකා නැව් සංස්ථාවේ අභ්‍යන්තර කමිටුවක් මගින් කෙරුනු තක්සේරු කිරීම් පදනම් කරගෙනය.

යාන්ත්‍රා වල භාවිතයේදී වටිනාකම් තක්සේරු කිරීමේදී ඓතිහාසික වක්‍රීය ප්‍රවනතා පදනම් කර ගනිමින් සමාගම් විසින් උපකල්පනය සිදු කොට ඇති අතර ලක් විජය බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහණය කිරීමේ කාල චකවානු සඳහා ඇස්තමේන්තු කළ වෙළඳපොල භාණ්ඩ ප්‍රවාහණ කුලී අනුපාත සහ නැව් මෙහෙයවීම් වියදම් පදනම් කර ගිනිමින්ද විවෘත වෙළඳපොල මෙහෙයුම් හා කාලීන කුලී සාම්‍යයන් (TCE) සම්බන්ධයෙන් අදාළ කරගත් පූර්ව - බදු වට්ටම් අනුප්‍රමාණය 7.55% කි. වියලි තොග නෞකා සම්බන්ධයෙන් ගත් කල Clarkson Shipping Intelligene Weekly අනුව අබලි ද්‍රව්‍ය මෙ.ටො. එකකට ඇ.ජ. ඩොලර් 565 බැගින් ශේෂ අගය තක්සේරු කරන ලදී. මෙම තත්ත්වය යටතේ ඉපැයීම්වල වැඩිවීම් LKAS 36 හි 36 ඡේදය අනුව කර්මාන්තයේ පැවැත්මේ රටාව පිළිබඳ තොරතුරු හා ගැලැපේ.

	සටහන්	2022 රු.	2021 රු.
10.1 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ - ගොඩනැගිලි			
වර්ෂය ආරම්භයේ ශේෂය		3,626,440	3,626,440
වර්ෂය අවසානයේ ශේෂය	**10**	3,626,440	3,626,440
10.2 ස්ථාවර වත්කම්වල ඉදිරියට ගෙනයන වටිනාකම			
පිරිවැය අනුව		8,864,252,162	9,240,124,773
තක්සේරු කිරීම් අනුව		4,000,000	4,000,000
	10	8,868,252,162	9,244,124,773

ඉඩම් හා ගොඩනැගිලි 1994 ජූලි මස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නැවත තක්සේරු කරන ලදී. ඉඩම් හා ගොඩනැගිලි අදාල සිරු මාරු කිරීම් සහිතව ඒවායේ උපරිම භාවිත තත්ත්වයෙන් වෙළඳපොලේ වටිනාකම් අනුව තක්සේරු කරන ලදී. විලම්භිත බද්ද ඇතුළුව තක්සේරුවේ ප්‍රතිඵල ප්‍රකයාගණන සංචිතය තුල හඳුනා ගන්නා ලදී.

10.3 දේපොල, පිරියත හා උපකරණ වලට සම්පූර්ණයෙන් ක්ෂය ගත කරන ලද වත්කම් ඇතුලත් වන අතර මුළු වටිනාකම

රු.56,124,859.75 (2021 - රු.51,822,482.47) නොවැදගත් අයිතම ලෙස වෙන් වෙන්ව සැලකේ.

11 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ - යාත්‍රා චියලි තටාකාංගන වැඩ

	සිලෝන් ලීස් යාත්‍රාව රු.	සිලෝන් ප්‍රින්සස් යාත්‍රාව රු.	මුළු මුදල රු.
පිරිවැය			
2021 අප්‍රේල් 1 වැනි දිනට ශේෂය	-	-	-
වර්ෂය තුළ එකතු කිරීම්	41,296,844	119,621,698	160,918,542
ණයට ගැනුම් පිරිවැය	-	-	-
දේපොල, පිරියත හා උපකරණ වලට වූ මාරු කිරීම්	(41,296,844)	-	(41,296,844)
2022 මාර්තු 31 දිනට ශේෂය	-	**119,621,698**	**119,621,698**

මාර්තු 31 දිනට	2022 Rs.	2021 Rs.
12 අස්පෘෂ්‍ය වත්කම්		
පරිගණක මෘදුකාංග		
පිරිවැය		
වර්ෂය ආරම්භයේදී ශේෂය	6,144,497	6,144,497
වර්ෂය අවසානයේදී ශේෂය	6,144,497	6,144,497
සමුච්චිත ක්ෂේමක්ෂය		
වර්ෂය ආරම්භයේදී ශේෂය	6,144,497	6,144,497
වර්ෂය අවසානයේදී ශේෂය	6,144,497	6,144,497
මාර්තු 31 දිනට කපාහැරි ශේෂය	-	-

මෘදුකාංග සංචිතයේ පිරිවැය ඒවායේ ප්‍රක්ෂේපිත ප්‍රයෝජ්‍ය ආයු කාලය අනුව ක්‍රමක්ෂය කොට නිබේ. නවද ගිණුම් මෘදුකාංග සංචිතය සමාගමේ අවශ්‍යතාවයන්ට අනුව නොගැලපෙන අතර පරිශීලක - මිත්‍ර (user frendly) නොවේ. එබැවින් පිරිවැයක් දැරීමට සිදුනොවන හා වගකීමට බැඳි නොසිටින පදනමක් මත, අවශ්‍ය කාර්යය පිරිමසා ගැනීමට හැකිවන පරිදි සමාගම වෙනුවෙන් ස්ථාපනය කරන ලදී. නවද අලෙවියෙන් පසු සේවාවන්ද සැපයුම්කරු විසින් ලබා නොදෙන ලදී. එබැවින් ලංකා නැව් සංස්ථාව සඳහා නව පරිශ්‍රීලක මිත්‍ර මෘදුකාංගයක් මිලදී ගැනීමට නාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කරන ලදී. ආයතනයට වටිනාකමක් නොමැති මෘදුකාංගය ප්‍රත්‍යාගණනය කිරීමට ලංකා නැව් සංස්ථාවෙ කළමනාකාරිත්වය විසින් නිර්දේශ නොකෙරිණි.

			2022	2021
			රු.	රු.

13 පාලිත සමාගම්වල ආයෝජන

	කොටස් සංඛ්‍යාව	ධාරිතා ප්‍රතිශතය		
සී/ස සිලෝන් ෂිපිං ඒජන්සි (පෞද්)	9,999	100%	-	99,990
අපවය සඳහා ප්‍රතිපාදන			-	(99,990)
			-	-

උපකාරක සමාගම් වසා දැමීම සඳහා 2006 මාර්තු 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් උපකාරක සමාගමේ මූල්‍ය ප්‍රකාශ සමාගම විසින් ඒකාබද්ධ නොකරන ලදී. ඉන් ඉක්බිතිව එකී උපකාරක සමාගම වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද අතර කොළඹ මහාධිකරණයේ අධික්ෂණය යටතේ (නඩු අංක HC (Civil) 56/2013/CO) වසා දමන ලදී. Ceylon Shipping Agency (Pvt) Ltd; අංක N (pvs) 6037 යටතේ 2016.07.28 දින සිට ලියාපදිංචි කල හා 2016.09.02 දිනැති ගැසට් පත්‍රය මගින් විසුරුවා සරින ලද ආයතනයකි. එය තවදුරටත් නොපවතින අතර සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සමාගම් නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබ තිබේ.

14 උපකාරක සමාගම්වල ආයෝජන

කොටස් ස්කන්ධ ක්‍රමය අනුව ඉදිරියට ගෙන යන වටිනාකම

සී/ස සිලෝන්ෂිපිං ලයින්ස් (පුද්.)	330,963,192	303,274,506
සී/ස සිලෝන් ෂිපිං ඒජන්සි (පුද්.) සිංගප්පුරුව	101,840,108	84,202,357
	432,803,300	**387,476,863**

14.1 ආශ්‍රිත සමාගම්වල ආයෝජන

පිරිවැය

	කොටස් සංඛ්‍යාව	ධාරිතා ප්‍රතිශතය		
සී/ස සිලෝන්ෂිපිං ලයින්ස් (පුද්.)	156,942	39%	1,569,420	1,569,420
සී/ස සිලෝන් ෂිපිං ඒජන්සි (පුද්.)- සිංගප්පුරුව	24,500	49%	143,622	143,622
			1,713,042	1,713,042

14.2 කොටස් ස්කන්ධ ක්‍රමය අනුව ආශ්‍රිත සමාගම්වල ආයෝජන සංචලනය

ශුද්ධ වත්කම්වල ආයෝජකගේ කොටස

වර්ෂය ආරම්භයේදී ශේෂය		387,476,863	372,531,378
ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බදු ඇතුළුව)	**(14.2)**	**40,277,522**	**10,185,997**
ආශ්‍රිත සමාගම්වල වෙනත් විස්තිරණ ආදායම් කොටස (බදු සහිත)		5,402,037	5,112,610
ලාභාංශ ආදායම්		(353,122)	(353,122)
වර්ෂ අවසානයේ ශේෂය		432,803,300	387,476,863

14.3 ආශ්‍රිත සමාගම්වල සංක්ෂිප්ත මූල්‍ය තොරතුරු

	සී/ස සිලෝන් ෂිපිං ඒජන්සි (පෞද්) සමාගම - සිංගප්පුරුව		සී/ස සිලෝන් ෂිපිං ලයින්ස් (පෞද්) සමාගම	
දෙසැම්බර් 31 දිනට	**2021**	**2020**	**2021**	**2020**
මුළු වත්කම්	453,459,584	231,075,820	1,040,738,072	927,295,210
මුළු වගකීම්	238,160,289	51,771,935	140,729,799	97,378,078
ශුද්ධ වත්කම්	215,299,295	179,303,885	900,008,273	829,917,132
ආදායම	1,733,064,950	701,782,376	469,278,941	352,997,880
මෙහෙයුම් වියදම්	1,708,363,514	705,302,230	446,629,891	399,903,380
වෙනත් ආදායම්	1,585,641	5,019,383	27,588,477	50,350,444
වර්ෂය සඳහා ලාභය	26,287,078	1,499,529	70,248,343	24,233,919
වර්ෂය සඳහා මුළු විස්තිරණ ආදායම	-	-	1,653,728	2,586,136

	සටහන්	2022 රු.	2021 රු.

15 මූල්‍ය සාධන පත්‍ර

මූල්‍ය වත්කම් වර්ගීකරණයන් සහ මූල්‍ය වගකීම්

මූල්‍ය වත්කම්වල සහ මූල්‍ය බැදියාවන්හි ඉදිරියට ගෙන යන වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් තුළ පහත සඳහන් පරිදි වේ.

මූල්‍ය වත්කම්වල සහ මූල්‍ය බැදියාවන්හි ඉදිරියට ගෙන යන වටිනාකම්

15.1 මූල්‍ය වත්කම්

15.1.1 විකිණීමට ඇති

ලැයිස්තුගත ආයෝජන	16.1	53,306,091	17,243,984
ලැයිස්තුගත නොවූ ආයෝජන	16.2	2,377,070	2,377,070
		55,683,161	19,621,054

ලැයිස්තුගත ආයෝජන ගණනය කරනු ලබන්නේ සක්‍රිය වෙළඳපොළේ ලැයිස්තුගත මිල පදනම් කරගත් සාධාරණ මිල අනුවය. ලැයිස්තුගත නොවූ ආයෝජනවල සාධාරණ මිල ස්ථිරසාර ලෙස පිරිවැය අනුව ගණනය කළ නොහැකි බැවින් අපවය වීම සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට ආගණනය කෙරේ.

15.1.2 කල්පිරීම් ආයෝජන

භාණ්ඩාගාර බිල්පත් ආයෝජන	20	447,289,305	120,615,896

කල්පිරීම සඳහා තබා ඇති ආයෝජන මනිනු ලබන්නේ පොලී ලැබීම් නියමිත ඇතුළත් කිරීම් සහිතවය.

15.1.3 ණය සහ ලැබීම් නියමිත

වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත	18	1,472,984,001	983,457,636
කෙටිකාලීන ආයෝජන	21	25,533,587	24,839,609
මුදල් හා මුදල් සාමය යන්	22	729,586,947	848,666,900
		2,228,104,535	1,856,964,145

ණය සහ ලැබීම් නියමිත, ඒවායේ ඉදිරියට ගෙන යන වටිනාකම් අනුව සඳහන් කෙරෙනුයේ, ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම් සාධාරණ අගයට ආසන්න වන හෙයිනි.

මුළු මූල්‍ය වත්කම්		**2,731,077,001**	**1,997,201,095**

15.2 මූල්‍ය බැරකම්

වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත	30	1,555,707,720	831,978,507
මුළු මූල්‍ය බැරකම්		**1,555,707,720**	**831,978,507**

මූල්‍ය බැරකම්, ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම් අනුව සඳහන් කෙරෙනුයේ ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම් සාධාරණ අගයට ආසන්න වන බැවිනි.

	සටහන්	2022 රු.	2021 රු.
16 විකිණීමට ඇති මූල්‍ය වත්කම්			
ලැයිස්තුගත ආයෝජන	**16.1**	53,306,091	17,243,984
ලැයිස්තුගත නොවූ ආයෝජන	**16.2**	2,377,070	2,377,070
		55,683,161	**19,621,054**

16.1 ලැයිස්තුගත ආයෝජන

වර්ෂය ආරම්භයේදී ශේෂය		17,243,984	11,281,334
සාධාරණ අගය වෙනස්වීම් මත ලාභ/ පාඩු		36,062,107	5,962,650
වර්ෂය අවසානයේදී ශේෂය	**16**	53,306,091	17,243,984

		2022		2021	
	කොටස් ගණන	පිරිවැය	වෙළඳපොළ වටිනාකම්	පිරිවැය	වෙළඳපොළ වටිනාකම
		රු.	රු.	රු.	රු.
මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී	238,506	2,068,800	53,306,091	2,068,800	17,243,984

16.2 ලැයිස්තුගත නොවූ ආයෝජන

ලැයිස්තුගත නොවූ ආයෝජනවල සාධාරණ අගය විශ්වසනීයව ගණනය කළ නොහැකි බැවින් අපවය පාඩු අඩුකොට පිරිවැය අනුව සඳහන් කරන ලදී.

	සටහන්	2022 රු.	2021 රු.
		No. of Shares	
සී/ස ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම	31,206	312,060	312,060
සිලෝන් පෝර්ට් සර්විසස් ලිමිටඩ්	5,000	50,000	50,000
සී/ස ලංකා පෝර්ට් මැනෙජ්මන්ට් ඇන්ඩ් කන්සල්ටන්සි	1,501	15,010	15,010
සී/ස ලංකා කෝල් කම්පනි (පෞද්.) සමාගම	200,000	2,000,000	2,000,000
	16	2,377,070	2,377,070

17 විලම්බිත බදු වත්කම් (බැදියාවන්)

වර්ෂය ආරම්භයේදී ශේෂය		192,452,549	478,648,007
වර්ෂය තුළ ප්‍රතිවර්තන	**8**		-
වර්ෂය තුළදී		(1,197,593,218)	(286,195,458)
වර්ෂය අවසානයේ ශේෂය	**17.1**	**(1,005,140,668)**	**192,452,549**

වත්කම්වල හා වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම් සහ වත්කම් හා වගකීම්වල බදු පදනමේ ඉදිරියට ගෙනයන වටිනාකම් අතර තාවකාලික වෙනස්කම් මත විලම්බිත බද්ද හඳුනාගනු ලබන අතර 24% සඵල පොලී අනුපාතය අනුව ගණනය කරනු ලැබේ.

	සටහන්	2022 රු.	2021 රු.
17.1 බදුවත්කම් හා වගකීම්වල විලම්බිත බදු විශ්ලේෂනය			
විලම්බිත බදු වගකීම්			
ක්ෂය ගත කිරීම් කඩිනම් කිරීම මගින්		(2,117,506,773)	(2,215,379,794)
		(2,117,506,773)	(2,215,379,794)
විලම්බිත බදු වත්කම්			
බදු පාඩුවලින්		822,607,358	2,364,498,212
අපවය සඳහා ප්‍රතිපාදන		281,299,993	33,636,613
විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන්ගෙන්		8,458,754	9,697,518
		1,112,366,105	2,407,832,343
	17	(1,005,140,668)	192,452,549

විලම්භිත බදු වත්කම් විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන් උදෙසා ප්‍රතිපාදන වශයෙන් ද සෙසු ලැබීම් අපවය ප්‍රතිපාදන සඳහා ද හඳුනාගැනෙන අතර ඉදිරියට ගෙයන බදු අහිමිවීම් බද්දට යටත් ලාභ සම්භාවිවන තරමට උපලබ්ධි කෙරෙන අතර විලම්භිත බදු බැඳියාවන් ක්ෂය කිරීම් හා ප්‍රත්‍යාගණන අතිරික්ත ත්වරණය කිරීම් සඳහා හඳුනා ගනු ලැබේ.

18 වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත

වෙළඳ ලැබීම් නියමිත	18.1	1,288,730,656	848,370,068
තැන්පතු හා අත්තිකාරම්	18.2	15,388,654	20,020,967
කාර්යමණ්ඩල ලැබීම් නියමිත	18.3	45,351,301	55,042,036
අනෙකුත් ලැබීම් නියමිත	18.4	123,513,390	60,024,565
		1,472,984,001	**983,457,636**

18.1 වෙළඳ ලැබීම් නියමිත

වෙළඳ ලැබීම් නියමිත		2,460,530,760	1,829,796,029
වෙළඳපාලන ගිණුම (දේශීය)		-	28,316,889
ගල් අඟුරු ගනුදෙනු පාලන ගිණුම		283,199	283,199
අපවය සඳහා ප්‍රතිපාදන		(1,172,083,303)	(1,010,026,050)
	18	1,288,730,656	848,370,068

වෙළඳ ලැබීම් නියමිත තුළ සම්බන්ධිත පාර්ශව වලින් ලැබෙන පහත දැක්වෙන ලැබීම් නියමිත අඩංගුය

සම්බන්ධිත පාර්ශව වලින් ලැබීම් නියමිත		
රාජ්‍ය ආයතන	492,899,641	217,806,005

වෙළඳ ලැබීම් නියමිතවල කාලසීමා පහත දැක්වේ

වෙළඳ ලැබීම් නියමිතවල කාලසීමා		
එක් අවුරුද්දක් දක්වා	1,259,424,908	733,865,504
අවුරුදු 1-4 දක්වා	228,907,326	346,677,041
අවුරුදු 4 ට වැඩි	972,198,525	749,253,484
	2,460,530,760	1,829,796,029

වෙළඳ ලැබීම් නියමිත, අපවය වීම් වෙනුවෙන් සමාලෝචනය කරන ලදී. ඇතැම් වෙළඳ ලැබීම් නියමිත අපවය වී ඇති බව පෙනුනි. එවැනි අපවය වීම් සඳහා සටහන 3.9.1 පරිදි ප්‍රතිපාදන සලසන ලදී.

වෙළඳ ලැබීම් වෙනුවෙන් සලසන ලද ප්‍රතිපාදන පිළිබඳ විස්තර		
විශේෂිත අපවයවීම්		
රජයේ ආයතන	36,206,870	36,206,870
විදේශීය නියෝජිතයන්	64,024,592	64,024,592
පෞද්ගලික ආයතන	44,083,601	44,083,601
වෙනත්	16,931,052	31,944,098
සාමූහික අපවය	1,010,837,188	833,766,889
	1,172,083,303	1,010,026,050

	සටහන්	2022 රු.	2021 රු.
18.2 තැන්පතු හා අත්තිකාරම්			
බහාලුම් තැන්පතු		13,243,865	18,554,346
වෙනත් ආපසු ගෙවිය යුතු තැන්පතු		6,124,052	6,124,052
අත්තිකාරම්		4,349,646	3,671,478
		23,717,563	28,349,877
අපවය සඳහා ප්‍රතිපාදන		(8,328,910)	(8,328,910)
	18	15,388,654	20,020,967
18.3 කාර්යමණ්ඩල ලැබීම් නියමිත			
කාර්යමණ්ඩල සඳහා ණය		41,145,250	51,789,854
අත්තිකාරම් සහ වෙනත්		4,206,051	3,252,182
	18	45,351,301	55,042,036
18.4 වෙනත් ලැබීම් නියමිත			
ඇප සහතික වූ අලුත්වැඩියා ලැබීම් නියමිත		19,839,635	19,839,635
වෙනත්		126,975,566	63,486,740
		146,815,201	83,326,375
අපවය සඳහා ප්‍රතිපාදන		(23,301,810)	(23,301,810)
	18	123,513,390	60,024,565
19 ව්‍යවස්ථාපිත ලැබීම්			
රඳවා ගැනීමේ බද්ද		8,481,465	8,464,489
භාණ්ඩ හා සේවා බද්ද		18,936,777	18,936,777
අපවය සඳහා ප්‍රතිපාදන		(18,936,777)	(18,936,777)
ජාතික ආරක්ෂක බද්ද		2,612,349	2,612,349
අපවය සඳහා ප්‍රතිපාදන		(2,612,349)	(2,612,349)
ද්විත්ව බද්ද		-	2,141,662
		8,481,465	**10,606,151**
20 කල්පිරීම් සඳහා තබාඇති ආයෝජන			
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන		**447,289,305**	**120,615,896**
21 කෙටිකාලීන ආයෝජන			
ස්ථිර තැන්පතුවල ආයෝජන	21.1	1,981,012	1,945,051
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - කාර්යමණ්ඩල ණය		23,552,575	22,894,559
		25,533,587	**24,839,609**
21.1 ස්ථිර තැන්පතු ආයෝජන			
ලංකා බැංකුව		1,310,700	1,310,700
කොමර්ෂල් බැංකුව (පි.එල්.සී)		35,000	35,000
කොමර්ෂල් බැංකුව (පි.එල්.සී) ආරක්ෂණ හා නිවාස ණය		635,312	599,351
	21	1,981,012	1,945,051

	සටහන්	2022 රු.	2021 රු.
22 මුදල් හා මුදල් සාමාන්‍යයන්			
අතැති මුදල්		49,766	77,090
නැව් කපිතාන් අත ඇති මුදල්		1,781,797	1,003,767
බැංකුවේ ඇති මුදල්		727,755,385	847,586,043
මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා ශේෂය		**729,586,947**	**848,666,900**
23 ප්‍රකාශිත ප්‍රාග්ධනය			
නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවූ			
එකක් රු.10 බැගින් වූ කොටස් 5,000,000 ක්		**50,000,000**	**50,000,000**

24 කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය

ප්‍රාග්ධන දායකත්වය, කාරක ප්‍රාග්ධනය, අත්තිකාරම් හා නව මගී පරියන්ත සඳහා ආයෝජන වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් මෙයින් නියෝජනය වේ.

25 ප්‍රාග්ධන සංචිත

— මෙයින් දැක්වෙන්නේ ASTARSA ණය සහ මහජන බැංකුවෙන් ලබා ගන්නා ලද භාණ්ඩාගාර ඇප සහතික ණය වෙනුවෙන් මහාණ්ඩාගාරය විසින් සමාගම වෙනුවෙන් කරන ලද නිරවුල් කිරීමය.

26 ප්‍රත්‍යාගණන සංචිත

1994 දී සිදු කරන ලද තක්සේරුප්‍රකාරව දේපොළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වන ප්‍රත්‍යාතගණන අතිරික්තයට ප්‍රත්‍යායාගණන සංචිතය සම්බන්ධතාවක් දක්වයි. ප්‍රත්‍යාගණන කරන ලද එක් එක් වත්කම් හඳුනා නොගත් විට ප්‍රත්‍යාතගණන අතිරික්තය රඳවා ගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ

28 දිගු කාලීන ණයට ගැනීම්

මහජන බැංකුව - යාත්‍රාණය	**28.1**	15,046,963,632	11,283,156,548
මහජන බැංකුව - පොලී ප්‍රාග්ධනීකරණ ණය	**28.2**	985,927,982	856,541,371
		16,032,891,614	**12,139,697,919**

28.1 මහජන බැංකුව - යාත්‍රාණය

වර්ෂය ආරම්භයේ ශේෂය		12,208,266,998	12,330,045,000
වර්ෂය තුළ ගෙවීම්		(1,118,243,078)	(705,093,752)
විනිමය ලාභ		(36,000)	-
විනිමය පාඩු		5,332,356,392	577,315,750
		16,422,344,312	12,208,266,998
වසරක් තුළ ආපසු ගෙවිය යුතු	**31**	1,375,380,680	925,110,450
අවුරුද්දකින් පසුව නැවත ගෙවිය යුතු	**28**	15,046,963,632	11,283,156,548

මුළු මුදල සහ කාලසීමාවන් ආවරණය වන පරිදි ඇප සහතිකයක් භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත.

28.2 මහජන බැංකුව - පොලී ප්‍රාග්ධනීකරණ ණය

වර්ෂය ආරම්භයේ ශේෂය		951,702,211	906,528,858
වර්ෂය තුළ ගෙවූ වාරිකය		(95,612,623)	-
විනිමය පාඩුව		411,492,438	45,173,353
වර්ෂය අවසානයේ ශේෂය		1,267,582,026	951,702,211
අවුරුද්දක් ඇතුලත ආපසු ගෙවිය යුතු	**31**	281,654,044	95,160,840
අවුරුද්දකින් පසුව ගෙවිය යුතු	**28**	985,927,982	856,541,371

මුළු මුදල සහ කාලසීමාව ආවරණය වන පරිදි ඇප සහතිකයක් භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත.

	සටහන්	2022 රු.	2021 රු.
29 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන් - පාරිතෝෂික			
වර්ෂය ආරම්භයේදී ශේෂය		40,406,325	42,095,585
වර්ෂය සඳහා ප්‍රතිපාදන	29.1	(2,591,813)	6,525,934
		37,814,512	48,621,519
ගෙවිය යුතු පාරිතෝෂික		-	(773,500)
වර්ෂය තුලදී කරන ලද ගෙවීම්		(2,569,705)	(7,441,695)
වර්ෂය අවසානයේදී ශේෂය		**35,244,807**	**40,406,325**
29.1 වර්ෂය සඳහා ප්‍රතිපාදන			
ප්‍රවර්තන සේවා පිරිවැය		2,096,625	2,320,215
වර්ෂය සඳහා පොලී ගාස්තු		2,893,554	1,539,248
ජීවගණක උපකල්පන වෙනස්වීම් නිසා උද්ගත වූ පාඩු		(7,581,992)	2,666,471
	29	(2,591,813)	6,525,934

භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන පහත දැක්වේ.

වට්ටම් සාධකය	7.50%	4.50%
අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීම්	1.17%	1.11%
කාර්යමණ්ඩල පිරිවැටුම් සාධකය	6.78%	5.13%
විශ්‍රාම වයස	62 වසර	60 වසර

මෙම උපකල්පන, විශ්‍රාම ප්‍රතිපාදන බැඳියාවන් කොතෙක්දැයි යන්න නිශ්චය කරගනු සඳහා කළමණාකාරිත්වය විසින් යොදාගත් විඳ්ලාඅයන්ගේ ප්‍රගයන්ත ඇස්තමේන්තු සඳහා භාරගෙන මෙම උපකල්පන පරාධීනගත උදී. දිගුකාලීන රජයේ බැඳුම්කර වල වෙලඳපොළ අනුපාත පදනම් කරගෙන වට්ටම් සාධකය තීරණය කරන ලදී

30 වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත		
වෙළඳ ගෙවීම් නියමිත	1,279,225,610	502,049,215
තැන්පතු	3,557,414	5,472,748
යන්ත්‍ර ණය සහ ගෙවිය යුතු පොලිය	149,421,266	111,746,281
වෙනත්	123,503,429	212,710,263
	1,555,707,720	**831,978,507**
31 කෙටි කාලීන ණයට ගැණුම්		
මහජන බැංකුව - යාන්ත්‍ර ණය	**1,657,034,724**	**1,020,271,290**
32 ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත		
ආදායම් බද්ද	9,665,215	9,665,215
මුද්දර බද්ද	28,374	31,699
එකතු කළ අගය මත බද්ද (VAT)	61,006,162	62,871,983
භාණ්ඩ සහ සේවා බද්ද	-	1,262
	70,699,752	**72,570,160**
33 උපචිත වියදම්		
උපචිත වියදම්	**28,588,636**	**29,208,766**

34 අනිශ්චිත වගකීම්

සාමාන්‍ය කටයුතු කරගෙන යාමේදී උද්ගත වූ නෛතික හිමිකම්පෑම් හැරුනුවිට මූල්‍ය ප්‍රකාශයන්හි සිරුමාරු කිරීම් අවශ්‍ය වූ සැලකිය යුතු අවිනිශ්චිත බැඳියාවන්, වාර්තා කිරීමේ අවසාන දිනයට නොවිය. මෙකී හිමිකම් පෑම් සාධාරණීය කල නොහැකි ඒවා බවත් ඒවා නිරවුල් කිරීමට යාම වෙනුවෙන් සමාගමේ සම්පත් වැයවීමේ සම්භාවිතාවක් නොමැති බව පෙනියන බව කළමනාකාරිත්වයේ අදහසයි. ඒ අනුව පහත දැක්වෙන කරුණු සම්බන්ධයන් ප්‍රතිපාදන සැලසිමක් සිදු නොකෙරුණි.

1. 2011 වර්ෂයේදී ලංකා මහපොල නෞකාව M/S Triple "S" Shipping Ltd; ආයතනයට කුලියට දෙන ලදි. කුලිය කිහිපවතාවක්ම ගෙවූ නමුත් පසුව එම ආයතනය ගෙවීම පැහැර හැරියේය. ඉන්පසු එම නැව නිසි පරිදි භාරදීමක්වත්, නැවේ කාර්යය මණ්ඩලයට වැටුප් වශයෙන් ගෙවීමට ඇති අති විශාල මුදලක් සහ මෙහෙයුම් වියදම්ද නොගෙවා කෙන්යාවේ මොම්බාසා වාරායේ ඇතහැර දමාගොස් තිබුණු අතර මෙම නැව් නාවික අධිකාරින් විසින් අත් අඩංගුවට ගෙන තිබේ. M/S Triple "S" Shipping Ltd; ආයතනයෙන් අයවිය යුතු සියලු මුදල් අයකර ගැනීම පිණිස ඔවුන් සමග අත්සන් කල කුලී ගිවිසුම් අනුව තීරක නඩු තීන්දුවකට යොමුවීම සඳහා කටයුතු ආරම්භ කොට තිබෙන අතර එහි කටයුතු කෙරෙමින් පවති. 2021.01.25 දින Sri Lanka Arbition Center හිදී නඩු විභාගය දෙපාර්ශවයම ඉදිරි පිටදී ආරම්භ විය. කලින් සිටි එකම තීරකවරයා පාර්ශවයන්ට එහිදී පැවසුවේ හෙතෙම රාජ්‍ය සේවා කොමිසමේ සභාපති ලෙස පත් කරනු ලැබ තිබෙන බවත් ඉල්ලුම්කරු රජය සතු සමාගමක් වන හෙයින් ඉල්ලුම්කරුට අදාළ කාරණයක් රාජ්‍ය සේවා කොමිසමට යොමු කළහොත් ඒ පිළිබඳ අසම්මතයක් ඇති වන බවත්ය. ඒ අනුව ඉහත කී තීරකවරයා එකී තීරක කරණයේ ඉවත් විය. ඉන් ඉක්බිතිව අප විසින් තීරකවරු දෙදෙනෙකු නම් කරන ලද අතර ලී.ප තැපැලෙන් දන්වන ලදී. එනමුත් Triple "S" Shippinng ආයතනයෙන් ප්‍රතිචාරයක් නොවුණි. ඉදිරි පියවර වන්නේ ඉහත කී නිවේදනයෙහි පරිදි ඉදිරියට කටයුතු කරගෙන ගොස් තීරක නඩු විභාග පනතේ විධිවිධාන අනුව වන තීරකවරයෙකු පත් කිරීමය.ලංකා නැව් සංස්ථාවේ නිති අංශය විසින් වාණිජ මහාධිකරණයේ ආදේශක තීරකවරයෙකු පත් කිරීමට කටයුතු කරනු ලැබ තිබේ. ඒ අනුව තීරක පනතේ 7 සහ 9 වගන්තිවල සලසා ඇති විධිවිධාන අනුව පෙන්සමක් හා දිවුරුම් ප්‍රකාශයක් හරහා තීරකවරයෙකු පත් කරන ලෙස වාණිජ මහාධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කොට තිබේ. ඒ අනුව තීරකවරයෙකු පත් කිරීමේ කටයුතු වාණිජ මහාධිකරණය විසින් කෙරෙමින් පවති.

2. ලංකා වියුලිබල මණ්ඩලයට අයත් පුත්තලම වියුලිබලාගාරයට සඳහා ගල් අඟුරු මිලදී ගැනීමේ ආයතනය වන ලංකා ගල් අඟුරු සමාගමට ගල් අඟුරු සැපයීම පිණිස ඉන්දියාවේ Tauricam Iron Steel Co; සමග නැව් සංස්ථාව ගිවිසුමකට එලඹියේය. එහෙත් ගල් අඟුරුවල තත්ත්වය පිළිබඳව ඇති වූ ප්‍රශ්නයක් හේතුකොටගෙන ඉහත කී ගිවිසුම යටතේ ගල් අඟුරු සැපයීම නතර කිරීමට සිදු විය. මෙම කරුණු සුහදශීලීව විසඳ ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදේශ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් කමිටුවක් ලන්ත් කරන ලදී. එමගින් වාර්තාව පිළියෙල කොට ඇති අතර වැඩිදුර කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශයට එම වාර්තාව ඉදිරිපත් කොට තිබේ. අමාත්‍ය මණ්ඩලයට එකී වාර්තාව ඉදිරිපත් කිරීමට පෙරාතුව විදුලි බල මණ්ඩලයේ හා ලංකා ගල් අඟුරු සමාගමේ සමාලෝචනය පිණිස එකී වාර්තාව රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කොට තිබේ. එම ආයතන වලින් මේ වන තෙක් අදාල සමාලෝචනා ඉදිරිපත් වී නොමැත.

.

3. බොරතෙල් ප්‍රවාහනය පිණිස ලංකා නැව් සංස්ථාව විසින් කුලියට ගත් නැවේ හිමිකරු හා විදේශීය නැව් හිමියා අතර ඇති වූ ආරවුලක් නිසා ලංකා බනිජතෙල් සංස්ථාවට බොරතෙල් ප්‍රවාහනය කිරීම නතර විය. එම කරුණ නිසා අන්තිමේදී ලංකා නැව් සංස්ථාව සහ විදේශීය නැව් හිමියා වන Luna Shipping සහ ලංකා බනිජතෙල් සංස්ථාව අතර මූල්‍ය අර්බුදයක් ඇති විය. මෙම මූල්‍ය අර්බුදය නීතිපති දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලද අතර නීතිපතිවරයාගේ මතය වූයේ දෙපාර්ශවයම විසින් අත්සන් කර ඇති ගිවිසුමට අනුව අයකර ගැනීමේ විකල්පයක් සඳහා ලන්ඩනයේදී තීරක ක්‍රියාවලියක් ආරම්භ කළ හැකි බවයි. මේ අතරතුර ලංකා බනිජතෙල් සංස්ථාව සමග ඇතිව තිබෙන මෙම ගැටළුව විසඳීම සඳහා ලංකා නැව් සංස්ථාව, බනිජතෙල් සංස්ථාව විසින් එහි අඩංගු යම් යම් නෛතික ගැටළු පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව ඒකාබද්ධව කරුණු සැල කිරීමක් සිදු කරන ලෙස කමිටුව දැනුම් දී ඇත. ඒ අනුව එම කටයුතු දැන් කෙරෙමින් පවති. මෙම තත්ත්වය යටතේ බනිජතෙල් සංස්ථාව සමග පවතින මෙකී ගැටළුව විසඳෙන තෙක් තීරක තීන්දුවක් Luna Shipping ආයතනයට එරෙහිව ලබා ගැනීම පසෙක තැබීමට නැව් සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කොට තිබේ. තම අතුරුවාර්තාව ඉදිරිපත් කරමින් ඉහත කී කමිටුව නිර්දේශ කොට ඇත්තේ ඒකාබද්ධ ඉල්ලීමක් හරහා ඇතැම් නෛතික කරුණු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ පැහැදිලි කිරීම් ලබා ගන්නා ලෙසය. කෙටුම්පත් ලිපියට බනිජතෙල් සංස්ථාවේ අනුමැතිය ලැබීමට නියමිතය. ලංකා බනිජතෙල් සංස්ථාවට ලංකා නැව් සංස්ථාවෙන් ලැබුණු අවසන් ලිපියට අනුව 2020.05.27 දින නැව් සංස්ථාව විසින් ලිඛිතව ඉදිරිපත් කොට ඇති පරිදි සහතික කළ ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙසය. නැව් සංස්ථාව මෙතෙක් පිළිතුරක් ලැබී නොමැති අතර 2022.11.09 දින සිහි කැඳවීමක් යවා ඇත.

4. 2020 අප්‍රේල් 28 අතර කාලයේදී සිලෝන් බ්‍රිස් නෞකාව සහ ධීවර යාත්‍රාවක් එන මුහුදේදී එකිනෙක ගැටීමක් ඇති වූ බවට වාර්තා විය. මෙම කාරණය ගැටුම් බැදියාවන් (Collision Liabilities) යටතේ සලකා බලන ලද අතර අලාභය සඳහා හිමිකම් ඉල්ලීම එ.ජ. ඩොලර් 100,000 ට අඩු බැවින් H & M රක්ෂණයෙන් නිදහස් කරන ලදී. එහෙත් තමන්ගේ (1/4) කොටස වෙනුවෙන් P & I Club හි බැදියාව වෙනස් නොවී පවති. මෙම නත්ත්වය යටතේ අවසාන හිමිකම් ඉල්ලීමේදී (final Claim) රිට අදාළ වියදම් (උදා. සමීක්ෂණ වියදම්, වාර්තාකරුගේ වියදම්, නෛතික ගාස්තු ආදිය (3/4) ලංකා නැව් සංස්ථාව විසින් ලබා ගැනීමට තිබේ. මෙම කරුණ P & I Club සහ FV විසින් පත් කරන ලද නීතිවේදීන් අකර සාකච්ජා කරන ලදී. විනය වැනි රටකදී නෛතික ක්‍රියාමාර්ග යොමුවීමේදී දැරීමට සිදුවිය හැකි පිරිවැය සලකා බලමින් කෙරුනු සාකච්ජාවකින් අනතුරුව SLIC සහ P& I Club හි උපදෙස් පරිදි, ධීවර යාත්‍රා හිමිකරුවන් වෙත එ.ජ. ඩොලර් 20,149 ක් ගෙවා ආරවුල සමථයකට පත්කර ගැනීමට ලංකා නැව් සංස්ථාව එකඟ විය. එකී ධීවර යාත්‍රා හිමිකරු ලංකා නැව් සංස්ථාවේ සියලු හිමිකම් ඉල්ලීම් වලින් නිදහස් කරන ලදී.

5. සිලෝන් බ්‍රිස් නෞකාව Leopold සහ Cycldes නෞකා සමග සම්මතය වීමේ සිද්ධි

ඉන්දියාවේ Paradip වරායේ සිට චීනය Liyanyungang දක්වා යපස් කුට්ටි තොග වශයෙන් ප්‍රවාහනය කිරීම පිණිස Ceylon Breeze නෞකාව කාලීන කුලී යාත්‍රා ගමනක (Time Chater Vouge) යෙදී සිටියේය. එය නාවික ඉන්ධන සපයා ගැනීම සඳහා 2021.06.11 දින සිංගප්පුරු වරාය වෙත සෙන්දු විය.

පළමුවැනි සට්ටනය

සිංගප්පුරු වරායේ සිට නාවික ඉන්ධන 2021.6.11 දින ලබා ගන්නා අතරතුර Leopold (Molta ධජ ලියාපදිංචිය) නම් වූ නෞකාවක් සිලෝන් බ්‍රිස් නෞකාව දෙසට ඇදි විත් එහි බදේ Port Quarter Vessel bow area ප්‍රදේශයට හානියක් ඇති කරමින් හා එම නෞකාවටද හානියක් සිදුකර ගත්තේය. ගැටුම් පිළිබඳ බැදියාවන් පිළිබඳ H & M ආවරණය යටෙත් මෙම කරුණු සලකා බලන ලදී. අපට වූ ඇස්තෙමින්තු අලාභය එ.ජ. ඩොලර් 590,000 ක් වූ අතර පිරිවැය ගනය කිරීම ඇතුළුව බිල්පත් සහ ලදු පත් ඉදිරිපත් කොට තිබේ. Club විසින් පත් කරනා ලද පාඩු ගැලපීම් (Loss adjustor) සිදු කරන්නෙකු වෙත නැව් සංස්ථාව විසින් හිමිකම් ඉල්ලීමක් ඉදිරිපත් කොට ඇති අතර අවශ්‍ය ලිපි ලේඛන හා තොරතුරු ඉදිරිපත් කෙරෙමින් පවති. Club ආයතනය විසින් දක්වා ඇති පරිදි Leopold සම්බන්ධෙන් පිරිවැය එ.ජ.ඩෝලර් 230,000 වශයෙන් ඇස්තෙමින්තු කොට ඇත. ලංකා නැව් සංස්ථාවේ බැදියාවේ කොටස 85%-90% වශයෙන් එය නිරවුල් කර ගැනීම් සමථයකට එලඹෙන ලෙසත් දන්වා ඇත.

දෙවැනි සට්ටනය (Cyclade නෞකාව)

සිලෝන් බ්‍රිස් නෞකාව 2021.06.12 දින නැංගුරම්ලා තිබියදී වරායෙන් පිටත නවතා තිබෙන වෙනත් යාත්‍රාවක් වෙත ඇදි යාම නිසා අපගේ නෞකාවට මෙන්ම එම යාත්‍රාවටද හානි ඇති වීමට කරුණු යෙදිනි. මෙම කරුණු සම්මත බැදියා සම්බන්ධයෙන් වන රක්ෂණ ආවරණය යටතේ සලකා බලන ලද්දේ අපගේ නාවික යාත්‍රාවට වූ හානිය අඩුකළ හැකි මට්ටමේ එනම් එ.ජ.ඩොලර 100,000 ඉක්මවා තිබූ බැවිනි. Cyclade හි කැමැත්ත ඇතිව P & I Club විසින් ඒ සඳහා නීතිවේදීන් පත්කොට ඇති අතර දෙපාර්ශවය අතර ඇප සහතික හුවමාරු කර ගැනීම සඳහා සාකච්ජා ඔකරගමින් පවති. ලංකා නැව් සංස්ථාවේ කථිත පිරිවැය සම්බන්ධයෙන් Cyclade වෙතින් ඉල්ලීමක් කර ඇති නමුත් ඔවුන්ගේ හිමිකම් ඉල්ලී පිළිබඳව ඔවුන් තවම නිහඩය.

35 ආශ්‍රිත පාර්ශව පිළිබඳ හෙලිදරව් කිරීම්

සමාගමේ ආශ්‍රිත පාර්ශව යනු ශ්‍රී ලංකා රජය, රජය සත සමාගම්, සෙසු ආශ්‍රිත ආයතන හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඇතුලත් විය.

35 ආශ්‍රිත පාර්ශව පිළිබඳ හෙලිදරව් කිරීම්

35.1 ප්‍රධාන කළමනාකරණ නිලධාරි පිරිස් සමග ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 ප්‍රකාරව "සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙලිදරව් කිරීම්" යටතේ දැක්වෙන ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු සෘජුව හෝ වක්‍රව ආයතනයේ ක්‍රම සම්පාදනය, මෙහෙයවීම් හා පාලනය කිරීමට බලය හා වගකීම් පැවරී ඇති කණ්ඩායමය. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරිතුමිය හා මෙහෙයුම් කළමනාකරුවන් ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ග කරනු ලැබ තිබේ.

ප්‍රධාන කළමනාකරණ නිලධාරි පිරිස් සමග ගනුදෙනු	2022 Rs.	2021 Rs.
පඩිනඩි හා අනෙකුත් කට් කාලීන සේවක ප්‍රතිලාභ	32,898,309	35,378,957
ගිහිගිටි ණය හා අත්තිකාරම්	4,038,672	6,494,542
ගිහිගිටි ශේෂය - පශ්චාත් රැකියා නියුක්ති ප්‍රතිලාභ	10,546,800	14,144,916

35.2 ආශ්‍රිත පාර්ශව සමග ගණුදෙනු

ආශ්‍රිත පාර්ශ්ව සමග සමාගම විසින් සිදුකරල කැපිපෙන්නෝ ගණුදෙනුවල විස්තර පහත දැක්වේ.

ශ්‍රී ලංකා රජය, රජය සතු ව්‍යවසාය සහ රජයට සම්බන්ධ අනෙකුත් ආයතන සමග ගණුදෙනු

ශ්‍රී ලංකා රජය සමාගමේ එකම ප්‍රාග්ධනවාරියා වන අතර එයින් සමාගමේ මෙහෙයුම් කටයුතු පාලනය කිරීම අයිතිය රජය සතුවේ. ඒ අනුව ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන හෝ ශ්‍රී ලංකා රජය විසින් ඒකාබද්ධව පාලනය කරනු ලබන ආයතන (රජය හා ආශ්‍රිත ආයතන) ආශ්‍රිත පාර්ශ්ව සමාගම විසින් සලකනු ලබයි.

සම්බන්ධිත පාර්ශ්ව	ගණුදෙනුවල ස්වභාවය	ගණුදෙනුවේ වටිනාකම	2022.03.31 දිනට ලැබීමට නියමිත ශේෂය
		Rs.	Rs.
ශ්‍රී ලංකා රජය	නැවබඩු ප්‍රවාහණ ගාස්තු, කුලියට ගැනීමේ ගාස්තු, බහාළුම් කුලියට දීම, නිෂ්කාශනය හා නැව් බඩු නිරවුල් කිරීම	1,544,435,050 (1,166,226,859)	**378,208,191**
රජය සතු ව්‍යවසාය	නැවබඩු ප්‍රවාහණ ගාස්තු, නිෂ්කාශනය හා නැව් බඩු යැවීම් සෙසු අය පැහැවීම්. නැවබඩු ප්‍රවාහණ ගාස්තු, ගොඩබෑම් සහ නාවික ඉන්ධන පැටවීමේ ගාස්තු නිරවුල් කිරීම්	153,748,533 (33,845,590)	**119,902,944**
ලංකා ගල් අඟුරු සමාගම	අය පැනවීම් නිරවුල්කිරීම්, නිෂ්කාශනය සහ ඉදිරිපත් කිරීම් සෙසු ගාස්තු නිරවුල් කිරීම	4,082,578,181 (2,800,855,192)	**1,281,722,989**
වෙනත් රජයට සම්බන්ධ ආයතන	නිෂ්කාශනය සහ ඉදිරිපත් කිරීම් හා සෙසු ගාස්තු නිරවුල් කිරීම්	245,266 (52,220)	**193,046**

36 වාර්තා කිරීමේ දිනට පසුව උද්ගත වූ සිදුවීම්

පහත දැක්වෙන දෑ හැරුණුකොට මූල්‍ය ප්‍රකාශවල සිරුමාරු කිරීම් හෝ හෙලිදරව් කිරීම් සිදු කිරීම අවශ්‍ය කෙරෙන වැදගත් සිදුවීම් කිසිවක් නැත

Escrow නියෝජිත
සී/ස ලංකා නැව් සංස්ථාව හා Refined Success Ltd.
මෙම ආරාවුල සිලෝන බ්‍රිස් නෞකාව කුලියට දීම සම්බන්ධයෙන් Refined Success Ltd – Clean Recap CP DD 2022 මාර්තු 17 කාලවකවානුවේදී කුලී පාර්ශ්වයක් සමග ඇති වූ එකකි. අයිනිකරු කුලී වශයෙන් ගෙවීමට ඇති මුදලේ ඉතිරිය ඉල්ලා ඇති අතර එසේ නොමැති නම්, පවතින විධිවිධාන ප්‍රකාරව කුලිපාර්ශවයේ, මෙහෙයුම් කටයුතු අත්හිටුවීම් කල හැකි බවත් නැව මත ඇති හාණ්ඩ තමා සන්තකයට ගන්නා බවත් දැනුම් දේ. එනමුත් කුලිකරු විසින් පවසන්නේ පහත සඳහන් කරුණු අනුව කුලිය සම්පූර්ණයෙන් ගෙවා ඇති බවයි.

(අ) මෙය සිදු වී ඇත්තේ එලිසබත් වරායට පැමිණි විටදී බවත් (ආ) poart coega හි නාවික යාත්‍රා ව නවතා තැබීමට මෙය සම්බන්ධතාවයක් ඇති බවත් සහ/ හෝ එම කරුණු සම්බන්ධයෙක් අලාභ හානි ඉල්ලීමට තමන්ට හිමිකම් ඇති බවත් (ඇ) ගමන් මගෙන් බැහැරව ටැන්සේනියාවට ගොස් සැගවී සිටි පුද්ගලයා බාරදීමේ කටයුත්ත කල යුතු බවත් යන කරුණු නැවේ හිමිකරු විවාදයට බඳුන කරයි. (ආ) කුලී පාර්ශවයට ඇතුලත් තිරක ගිවිසුමක් අනුව පත්කරන ලද විනිශ්චය සභාවක් මගින් මෙය ලන්ඩනයේද නිර්ණය කිරීමට නියමිතව තිබෙන අතර මෙම ආරවුල තවදුරටත් වැඩිවීමට ඉඩ නොතබා නැව් කුලියට දෙන්නා විසින් එ.ජ. ඩොලර් 469,524.98 ක් ගෙවනු ඇත. (Escro)මුදල් ප්‍රමාණය escrow නියෝජිත වශයෙන් escrow මුදල් ප්‍රමාණය රඳවා ගැනීමට හෝ නොගෙවීමට ඇති අවබෝධනාව අනුව ස්ටැන්ඩර්ඩ චාටර් බැංකුව (හොංකොංහි) පවත්වා ගෙන යන escrow නියෝජිතයාගේ එ.ජ. ඩොලර් සේවා දායක ගිණුම ක්‍රියාවලිය නවමත් ආරම්භ නොමැත.

• ලංකා නැව් සංස්ථාව M.I International (Pvt) Ltd; සහ නවත් වාහන 2 ක් පිළිබඳව දිස්ත්‍රික් උසාවියේ ඇති අංක DMR 2493/22 දරණ නඩුව ලංකා නැව් සංස්ථාව සතු KY-7714 දරන වාහනය මොහොමඩ් ඉම්රාන් ඉන්ෆාස් නැමැති අයගේ (ලිපිනය අංක 05, 1st Chappel St.කොළඹ 06) රාජකීය මාවත, කුරුඳුවත්ත පොලිස් වසම) අංක WP CAV 7862 දරන වාහනය සමග හැපි 2020 සැප්තැම්බර් 15 දින 19.05 පැයේදී අනතුරක් සිදු විය. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි සංස්ථාව සතු එම KY-7714 ට සිදුව ඇති අලාභය සඳහා යුනයිටඩ මේටර්ස් වෙතින් ඇස්තමේන්තුවක් ලබා ගෙන ඇති අතර එහි අගය රු.1,000,012.06 ක් වේ. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි එම අලාභය අයකර ගැනීමට කටයුතු යොදා ඇත.

ලංකා නැව් සංස්ථාවේ අංක KY-7714 දරන වාහනයට සිදු වූ රු. 1,000,012.06 CAV 7862 දරන I.M International (Pvt) ආයතනයට අයත් CAV 7862 දරන අමානා ටකාපුල් PLC හි රක්ෂණ අංක HOVPTDP00360/20 යටතේ රක්ෂණය කරුනු ලැබී ඇති අතර වාහනයෙන් සිදු වූ අනතුර සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි එකී වාහනයේ හිමිකරුට එරෙහිව කොළඹ දිස්ත්‍රික්ක උසාවියේ පවරා ඇති නඩුවේදී එහි රියදුරු වූ මොහොමඩ් ඉන්ෆාස් ගෙන් රු. 1,000,012.06 ක් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

37 ප්‍රාග්ධන බැඳියාවන්

2014 පෙබරවාරි 18 වැනි දින එ.ජ. ඩොලර් මිලියන 70 ක වටිනාකමකින් යුතු චීනයේ සී/ස Avic International Beiging සමාගමෙන් පුහුණු පහසුකම් සහිත නව 63600 DVST Ultramax Bulkers දෙකක්, නැව් සංස්ථාව විසින් මිලදී ගන්නට යෙදුණි. 2013 දෙසැම්බර් 23 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ඒවා මිලදී ගැනීම සඳහා ස්වාධීන යෝජනාවක් යටතේ අනුමැතිය ලබා දී තිබුණි.

ගැණුම්කරු ණය කොන්දේසි යටතේ (Buyer Credit Terms) සමාගම විසින් ගිවිසුමට එළඹ තිබූ අතර එබැවින් සමාගමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා මහජන බැංකුවෙන් මාස 06ක කාලයක් සඳහා LIBOR+ 5.25% වාර්ෂික පොලියක් යටතේ එ.ජ.ඩොලර් මිලියන 70 ක ණය පහසුකමක් ලබා ගත් අතර ඊට අදාල පොලිය ගෙවනු පිණිස මහජන බැංකුව විසින් එ.ජ.ඩොලර් මිලියන 10 ක ණයක් මාස 06 ක කාලයක් සඳහා LIBOR+ වසරකට 3% පොලී අනුපාතය යටතේ සමාගමට දෙන ලදුව එයින් ප්‍රයෝජනයට යොදා ගන්නා ලද්දේ එ.ජ. ඩොලර් මිලියන 5.5 ක් පමණි.

මූල්‍ය තත්ත්ව වාර්තාවේ දිනට බැංකුවට ගෙවිය යුතු මුදල එ.ජ. ඩොලර් 59,164,464.32 ක් විය.

38 මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීම

මූල්‍ය උපකරණ භාවිතා කිරීමේදී සමාගමට පහත දැක්වෙන මූල්‍ය අවදානම්වලට මුහුණ දීමට සිදු වූ අතර මෙකී අවදානම් සමනය කර ගැනීම පිණිස විටින් විට සමාගම විසින් විවිධ අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය භාවිතා කරන ලදි.

38.1 ණය අවදානම
38.2 ද්‍රවශීලි අවදානම
38.3 වෙළඳපොල අවදානම (ව්‍යවහාර අවදානම් හා පොලී අනුප්‍රමාණ අවදානම්)
38.4 ප්‍රාග්ධන කළමනාකරණය

සමාගමේ මූල්‍ය උපකරණ ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන, කාලීන තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන කිරීම් සහ මුදල් හා මුදල් සාම්‍යයන්ගෙන් සමන්විත වේ. තම ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වලින් සමාගමට වෙළඳ ලැබීම් නියමිත හා ගෙවීම් නියමිතද තිබේ. කෙටි කාලීන පරමාර්ථය වූ කලී මෙහෙයුම් කටයුතු වෙනුවෙන් ද්‍රවශීලිතාවක් පවත්වා ගැනීමය. ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ කොටස්වල ආයෝජන කිරීම් ක්‍රමෝපායිය ආයෝජනයන් වේ.

38.1 ණය අවදානම

ණය අවදානම වූ කලී පාර්ශවකු විසින් ගිවිසුමකට අදාළ බැඳියාවන් ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථා වලදී සමාගමට දැරීමට සිදුවන මූල්‍ය පාඩුය. ණය අවදානම් උද්ගත වන්නේ ප්‍රධාන වශයෙන්ම බැංකුවල ඇත තැන්පතු මුදල් හා මුදල් සාම්‍යයන්ගේ (අත ඇති මුදල් හැර) සහ ගණුදෙනුකරුවන් වෙතින් වූ ලැබීම් නියමිත වලිනි. ණය අවදානමට යටත් මූල්‍ය වත්කම් උපරිම ණය අවදානම් වලට නිරාවරණය වීම ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකමට සමාන වේ.

2022 මාර්තු 31 දිනට වාර්තා කරන ලද මූල්‍ය උපකරණ උපරිම අවදානම්වලට නිරාවරණය වීම පහත සටහනින් දැක්වේ.

	සටහන්	2022 Rs.	2021 Rs.
මුදල් හා මුදල් සාම්‍යයන්	38.1.1	727,755,385	847,586,044
බැංකුවෙහි ඇති කාලීන තැන්පතු		25,533,587	24,839,609
වෙළඳ ලැබීම් නියමිත	38.1.2	2,460,530,760	1,829,796,029
වෙනත් ලැබීම් නියමිත		184,253,345	135,087,568
		3,398,073,077	2,837,309,250

38.1.1 මුදල් හා මුදල් සාම්‍යයන්

මුදල් හා මුදල් සාම්‍යයන් ඇතුලත් වන්නේ බැංකුවේ ඇති මුදල් (අතැති මුදල් හැර) ඉල්ලුම් තැන්පතු සහ මාස තුනකට හෝ ඊට අඩු මුලික කල්පිරීම් සහිත පහත දැක්වෙන් ආයෝජනයන්ය.

	සටහන්	2022 Rs.	2021 Rs.
බැංකුවේ ඇති මුදල්		727,755,385	847,586,044
	38.1	727,755,385	847,586,044

38.1.2 වෙළඳ ලැබීම් නියමිත

සමාගම ප්‍රධාන වශයෙන් නාවික නියෝජිතයන් සහ රාජ්‍ය ආයතන සමග කටයුතු කරයි. සමාගමේ කළමනාකාරිත්වය අතීත අත්දැකීම් පදනම් කරගෙන නාවික එජන්තවරුන්ගේ ණය තත්ත්වය නක්සේරු කරයි.මීට අමතරව කළමනාකරණ කමිටුව සහ මණ්ඩලය (Board) විසින් ගෙවීමට ඇති ශේෂයන් කෙරිගෙන යන පදනමක් යටතේ අධීක්ෂණය කරයි.

සමාගමේ වෙළඳ ලැබීම් නියමිත සම්බන්ධයෙන් කාල විශ්ලේණෂය පහත දැක්වේ:

	සටහන්	2022 Rs.	2021 Rs.
නැවත ලැබිය යුතු වෙළඳාම් වල කාල විශ්ලේෂණ			
එක් අවුරුද්දක් දක්වා		1,259,424,908	733,865,504
අවුරුදු 1 – 4 දක්වා		228,907,326	346,677,041
අවුරුදු 4 ට වැඩි		972,198,525	749,253,484
	38.1	2,460,530,760	1,829,796,029

වෙළඳ ලැබීම් නියමිත සම්බන්ධයෙන් දරන ලද පාඩු පිළිබඳ ඇස්තමේන්තුවක් මගින් දැක්වෙන අපවයන් (මූල්‍ය සටහන් සම්බන්ධයෙන් වන 3.9.1)සටහන සඳහා ප්‍රතිපාදන සැලසීම පිණිස සමාගම ප්‍රතිගණනයක් ස්ථානය කරයි. ස්ථාපනය කරන ලද අපවය ප්‍රතිපත්ති අනුව අපවය පාඩු මැන ගැනීම සඳහා සේවා දායකයන් වෙන්වෙන් වශයෙන් සමාලෝචනය කරනු ලැබේ. මේ පිළිබඳව වෙළඳ ලැබීම් නියමිත හා අපවය සඳහා වූ ප්‍රතිපාදන සම්බන්ධයෙන් වන මූල්‍ය සටහන් 18.1 කරුණාකර බලන්න.

38.1.3 වෙනත් මූල්‍ය වත්කම්

සමාගමේ සෙසු මූල්‍ය වත්කම් වලින් උද්ගතවන ණය අවදානම්වලට අයත් වන්නේ අදාළ බැංකු වෙත ඇති තැන්පතුය. ණය අවදානමක් සමාගමට ඇතිවන එකී මූල්‍ය සාධනපත්‍රවල ඉදිරියට ගෙන යන වටිනාකමට සමානවන මෙකී මූල්‍ය උපකරණ වලින් ඇතිවිය හැකි ණය අවදානම සමාගම විසින් කළමනාකරණය කරගනු ලබන්නේ රජය සතු බැංකු හා පිලිගත් බැංකු වෙත කම අරමුදල් තැන්පත් කිරීමෙනි.

38.2 ද්‍රවශීලි අවදානම

ද්‍රවශීලි අවදානම යනුවෙන් හඳුන්වන්නේ තම මූල්‍ය බැඳියාවන් නියමිත කාලයට ඉටුකිරීමට සමාගම අපොහොසත් වීමයි. ද්‍රවශීලි නාව කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වූ කලී සාමාන්‍යයන් සහ අනපේක්ෂිත තත්ත්වයන් යටතේ පිලිගත නොහැකි පාඩු නොදරමින් නියමිත වේලාවට බැඳියාවන් ඉටුකිරීම පිණිස හැකිතාක් දුරට නිරතුරුවම ප්‍රමාණවත් මුදල් තිබෙන බව සහතික කිරීමය.

සමාගම විසින් මූල්‍ය වත්කම් හා බැඳියාවන් අන්වේෂණය කරනු ලබන අතර මාසික පදනමක් මත පුරෝකථනය කල මෙහෙයුම් මුදල් ප්‍රවාහ පිලියෙල කරයි. ආංශික කාර්ය සාධනය අන්වේෂණය කිරීම සඳහා වාර්ෂික අයවැය එක් එක් අවශ්‍යතා තා තුල පිලියෙල කෙරේ. සමාගම මත මෙහෙයුම් කටයුතු කිරීමේදි ඇතිවන අවශ්‍යතා පිරිමසාලීම පිණිස ප්‍රමාණවත් මුදල් තිබෙන බව සහතික කිරීමට කළමනාකාරිත්වය විසින් පුරෝකථනය කළ මාසික මෙහෙයුම් මුදල් ප්‍රවාහ වාර්ෂික අයවැය සහ ද්‍රවශීලිතා අවශ්‍යතා අන්වේෂණය කෙරේ.

වාර්තා කිරීමේ අවසාන දිනයට ඉතිරිව ඇති කාල පරිච්ඡේදය පදනම් කරගෙන 2022 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය වත්කම් හා බැඳියාවන්හි කල්පිරීම් විශ්ලේෂණයක් පහත දක්වා ඇත. එහි හෙළිදරව් කරනු ලැබ ඇති මුදල් ප්‍රමාණයන් ගිවිසුම්වලට අදාල එවටම නොකල මුදල් ප්‍රවාහයන්ය

මූල්‍ය වත්කම් හා බැඳියාවන්	ඉදිරියට ගෙනයන වටිනාකම	මාස 6/ මාස 6 ට අඩු	මාස 6 – 12	වසරකට වැඩි
	Rs.	Rs.	Rs.	Rs.
මූල්‍ය වත්කම්				
AFS මූල්‍ය වත්කම්	55,683,161	-	-	55,683,161
කල් පිරීමට ඇති ආයෝජන	447,289,305	447,289,305	-	-
කෙටි කාලීන ආයෝජන	25,533,587	-	1,981,012	23,552,575
වෙළඳ ලැබීම් නියමිත	2,460,530,760	-	1,259,424,908	1,201,105,851
වෙනත් ලැබීම	184,253,345	-	63,488,826	120,764,519
මුදල් හා මුදල් සාමාන්‍යයන්	727,755,385	727,755,385	-	-
	3,901,045,543	1,175,044,690	1,324,894,746	1,401,106,107
මූල්‍ය බැඳියාවන්				
වෙළඳ ගෙවීම් නියමිත	1,279,225,610	1,279,225,610	-	-
වෙනත් ගෙවීම් නියමිත	276,482,110	123,503,429	152,978,680	-
	1,555,707,720	1,402,729,039	152,978,680	-

38.3 වෙළඳපොල අවදානම (ව්‍යාපාර මුදල් අවදානම හා පොලි අනුපාත අවදානම)

වෙළඳපොල අවදානම යනු සමාගමේ ආදායම් හෝ මූල්‍ය උපකරණවල ඉදිරියට ගෙනයනු ලබන වටිනාකමට බලපෑම් ඇතිවිය හැකි විදේශ විණිමය අනුපාතික හා පොලි අනුපාතික යනාදියෙහි ඇතිවන වෙනස්වීමය.

38.3.1 ව්‍යවහාර මුදල් අවදානම

එ.ජ ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයේ හා අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල වටිනාකමට අනුව අගය උච්චාවචනය වීමෙන් උද්ගත විය හැකි අවදානම මෙනමින් දැක්වේ. එ.ජ. ඩොලරයට අනුව හා වෙනත් ව්‍යවහාර මුදල් අනුව සමාගම විසින් සපයන ලද සේවාවන්හි කාර්යිය ව්‍යවහාර මුදල් සහ ඇතැම් වෙළඳ ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත විදේශ ව්‍යවහාර මුදල් අනුව දක්වා ඇත.

වාර්තා කිරීමේ කාල සීමාව වන 2021/2022 වර්ෂය සඳහා සමාගම විසින් වාර්තා කොට ඇති හා මෙහෙයුම් ප්‍රතිඵල තුල දක්වා ඇති ශුද්ධ විදේශ විනිමය පාඩුව රු.5,724,650,486 ක් වේ.

38.3.2 පොලී අවදානම

සමාගම විසින් මුහුණදෙනු ලබන පොලී අවදානම වූ කලී කෙටි කාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා කාලීන තැන්පතු සම්බන්ධයෙන් වෙළඳපොල පොලී අනුප්‍රමාණ වෙනස්වීම් තුලින් උද්ගතවන අවදානමයි

රාජ්‍ය බැංකු හා ණය ශ්‍රේණිගත බැංකුවල පවතින කාලීන තැන්පතු ඇතුළු බැංකු ශේෂ සමාගමට ඇත. පොලී

අනුපාතිකවල සංවලනය සක්‍රිය ලෙස අන්වේෂණය කිරීම මගින් සමාගම පොල අනුපාතිකය කළමනාකරණය කරයි.

38.4 ප්‍රාග්ධන කළමනාකරණය

[illegible] ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීම පවත්වා ගැනීම සඳහා ද ක්‍රියාවිටියා ආයතනයන් වශයෙන් නවවුවරුන් සමාගම පවත්වා ගැනීමේ හැකියාවට උරදෙමින් සමාගම විසින් ස්වකීය ප්‍රාග්ධනය කළමනාකරණය කරයි. ගියරුම් අනුපාතය අනුව තම ප්‍රාග්ධන ව්‍යුහය සමාගම විසින් අන්වේෂණය කරයි. මුළු ශකාධිස් ස්කන්ධය අනුව සමීක්ෂණ ණයට ගැනුම් වශයෙන් ගියරුම් අනුපාතය ගණනය කරනු ලැබේ. මුළු ණයට ගැනුම්වලට ඇතුලත් වන්නේ ජංගම නොවන හා ජංගම ණයට ගැනුම් වන අතර ඒවා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා ඇත. 2022 මාර්තු 31 දිනට සමාගමේ මුළු ණයට ගැනුම් හා කොටස් ස්කන්ධය අනුපාතය පහත දැක්වෙන වගුවේ සඳහන් කොට ඇත.

	2021/22 Rs.	2020/21 Rs.
ප්‍රාග්ධන පංතිය		
මුළු ණයට ගැනුම්	17,689,926,338	13,159,969,209
මුළු කොටස් ස්කන්ධය	(7,914,226,190)	(2,041,613,494)
තෝලන අනුපාතය (x)	-224%	-645%

39 නාවික භාණ්ඩ රක්ෂණ පිරිවැය

2019.06.17 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අංක 17/1791/129/023 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය හා 19.07.29 දිනැතිව ලංකා නැව් සංස්ථාවේ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය අනුව ලංකා ගල් අහුරු සමාගමට අදාල නාවික භාණ්ඩ රක්ෂණ පිරිවැය ලංකා නැව් සංස්ථාවට විසින් ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දී තිබේ. එහි විස්තර පහත දක්වා ඇත.

මූල්‍ය වර්ෂය	මුදල රු.
2015/16	12,512,559.00
2016/17	21,447,333.00
2017/18	21,502,890.00
2018/19	22,571,307.28

රක්ෂකයන් විසින් නිකුත් කරන ලද මුල් පිටපත් (original documents) එනම් VAT ඉන්වොයිස්, ලදුපත් ආදිය මුදල් ප්‍රතිපූරණය සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍යය. ඒ අනුව රු. 22,571,307.28 මුදල් ප්‍රමාණයක් 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට මේ වන විටත් අයපත් කරනු ලැබ තිබේ. තවද 2019/20 සහ 2020/21 මූල්‍ය වර්ෂ වෙනුවෙන් රඳවා ගත් ඉපැයීම් සඳහ රු.54,190,609.70 ක මුදල් ප්‍රමාණයක් ගැලපුම් කොට තිබේ. අවශ්‍ය ලිපිලේඛන ලබා ගැනීමට නොමැති හෙයින් නාවික භාණ්ඩ රක්ෂණයට අදාල රු.1,271,172.30 ක මුදලක් ගිණුම්ගත නොකොට තිබේ.

සි/ස ලංකා නැව් සංස්ථාව
ප්‍රධාන උපලේඛණය
පරිපාලන වියදම්

ගිණුම් අංකය	විස්තරය	2022	2021
		රු.	රු.
50000	කාර්ය මණ්ඩල පුහුණුව	175,433	227,775
50010	කාර්ය මණ්ඩල බඳවා ගැනීම්	57,000	-
50030	සේ.හා.අරමුදලට දායකත්වය	12,614,362	14,050,798
50040	විධායක නිලධාරි මණ්ඩලයට වැටුප්	63,952,391	66,470,465
50050	ලිපිකරු හා ආශ්‍රිත සේවා වැටුප්	48,401,842	40,606,871
50060	තාවකාලික හා අනියම් සේවක වැටුප්	841,189	1,169,596
50080	අතිකාල දීමනා	11,550,489	9,633,445
50090	පාරිතෝෂික ගෙවීම්	3,911,129	338,995
50100	වෛද්‍ය අරමුදලට දායකත්වය	48,000	44,000
50110	සේවක භාර අරමුදලට දායකත්වය	2,519,810	2,810,160
50120	වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	4,646,607	4,568,835
50140	පාරිතෝෂික	-2,591,813	6,525,934
50150	වන්දි මුදල්	3,730,080	-
50170	දුෂ්කර දීමනා - නොරොච්චෝලේ	1,506,988	1,376,850
60010	කාර්යාල කුලී	19,558,800	18,798,180
60020	ලිපි ද්‍රව්‍ය මුද්‍රණය	2,365,230	1,373,209
60030	සාමාජිකත්ව දායකවීම්	1,303,510	1,409,553
60050	රක්ෂණ	7,271,538	6,896,863
60060	කාර්යාල පරිශ්‍රය හා උපකරණ නඩත්තුව	5,691,657	4,700,118
60070	විදුලි බිල්පත් - ප්‍රධාන කාර්යාලය	1,475,657	1,354,857
60072	විදුලි බිල්පත් - නිල නිවාස	71,734	24,949
60080	කාර්ය මණ්ඩල ශුභ සාධන	5,624,230	4,762,216
60090	ආරාක්ෂක ගාස්තු	2,107,140	2,322,300
60110	පරිගණක වියදම්	1,877,867	520,190
60140	බංගලා (මෝදර) නඩත්තුව	3,026	17,520
60170	පරිවර්තන ගාස්තු	185,914	169,628
60210	ජල බිල්පත් - ප්‍රධාන කාර්යාලය	180,000	180,000

60220	ජල බිල්පත් - නිල නිවාස	69,234	38,497
60230	දඩ මුදල් ගෙවීම්	7,080	-
61010	දුරකථන බිල්පත්	2,686,601	2,210,467
61020	තැපැල් හා විදුලි පණිවුඩ ගාස්තු	27,655	5,065
61040	අන්තර්ජාල/ වි.තැපැල් ගාස්තු	3,058,649	2,223,117
62000	විදේශ ගමන් හා වියදම්	38,117	-
62010	දේශීය ගමන්	3,946,217	4,835,293
62030	වාහන නඩත්තු කිරීම	5,727,485	3,597,727
62040	ගමන් බිමන් හා යැපීම් දිමනා	14,250	54,700
63010	සංග්‍රහ වියදම්	100,257	134,976
63020	පුවත් පත් දැන්වීම්	4,262,440	2,670,056
63060	වාර්ෂික ලියාපදිංචි ගාස්තුව	41,000	41,000
64000	අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු	596,050	1,097,000
64010	විගණන ගාස්තු	760,000	741,000
64020	වෘත්තියවේදී හා නෛතික ගාස්තු	584,905	637,400
64060	ටෙන්ඩර් කමිටු දීමනා හා වියදම්	1,332,200	556,000
65010	විවිධ වියදම්	515,604	287,162
65040	පරිත්‍යාග	62,500	32,500
65050	සංවත්සර වියදම්	707,409	-
65800	ක්ෂය වීම්	4,932,749	5,432,414
70000	බැංකු ගාස්තු	27,775,207	3,552,427
70030	අයිරා පොලි	1	203
70050	මුද්දර බදු වියදම් ගිණුම	37,125	41,925
	ජීවගණක උපකල්පන වෙනස්වීම් මත - ලාභ/ අලාභ	7,581,992	(2,666,471)
		263,944,537	215,875,765